බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 49 (I)

## අභිධර්මපිටකයෙහි

නවවැනි ග්‍රන්ථය

# යමකප්‍රකරණ

## ද්විතීය භාගය (I)

---

ලඞ්කා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්
හිඟුල මාකඩවර ශ්‍රී රේවත පරිවෙණාධිපති
සතරකෝරළ මහදිසාවේ ප්‍රධාන සඞ්ඝනායක රාජකීය පණ්ඩිත
**ශ්‍රී ධර්මස්කන්ධ රේවත කරහම්පිටිගොඩ ශ්‍රී සුමනසාර**
ස්ථවිරයන් වහන්සේ විසින් කරන ලද
සිංහල පරිවර්තනය

---

**ශ්‍රී ලඞ්කා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින්
ප්‍රකාශිත යි.**

**ශ්‍රී බු: ව: 2530**
**රාජ්‍ය වර්ෂ: 1987**

Buddha Jayanti Tripitaka Series – Volume XLIX (1)

THE NINTH BOOK IN THE

## ABHIDHAMMA PITAKA

# YAMAKAPPAKARANA

## PART II (I)

WITH

THE SINHALA TRANSLATION

BY

VENERABLE **PANDIT KARAHAMPITIGODA**
**SRI DHAMMAKKHANDHA REWATA SUMANASARA THERA**
THE CHIEF HIGH PRIEST OF THE PROVINCE OF
FOUR KORALAS AND THE PRINCIPAL OF
SRI REWATA PIRIVENA, MAKADAWARA
HINGULA

---

PUBLISHED
UNDER THE PATRONAGE

OF

DEMOCRATIC SOCIALIST REPUBLICAN
GOVERNMENT OF SRI LANKA

B.E. 2530
C.E. 1987

# අභිධම්ම පිටකෙ

# යමකප්පකරණං

## දුතියො භාගො (1)

# අභිධර්මපිටකයෙහි

# යමකප්‍රකරණ

## ද්විතීය භාගය (1)

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි, වැසුණේ නො මැ බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපති

**ඇම්. ජේ. පෙරේරා මහතා**

කළ ඉල්ලීම අනුව

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති

සහ

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති

එම සංස්ථාවල අරමුදල් වලින්

පරිත්‍යාග කළ

රුපියල් දෙලක්ෂ පනස් දහසක මුදල

**බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ**

මෙම කාණ්ඩයේ පිටපත් 3000 මුද්‍රණය කරවීමට

යොදා ගන්නා ලදී.

මෙයින් ජනිත කුසල සම්භාරය දයක කාරක සියලු දෙනා

අනුමෝදන් වෙත්වා.

At the request of

**Mr. M. J. PERERA**

former Chairman of the Sri Lanka Rupavahini Corporation

The Chairman

**SRI LANKA RUPAVAHINI CORPORATION**

and

The Chairman

**SRI LANKA BROADCASTING CORPORATION**

have donated

Rupees 250,000.00

for the printing of 3000 copies

of this Volume

of

**THE BUDDHA JAYANTI TRIPITAKA SERIES**

May the Kusala Kamma accrued by this

noble act be shared by everyone concerned.

# පටුන

# CONTENTS


| | පිටු |
|---|---|
| සංස්කාරක නිවෙදනය ... .. ... | xvii |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | xix |
| සංඛ්‍යාත නිරූපණය .. .. ... | xxi |
| සංඥාපනය .. .. .. | xxiii-xxiv |
| පාළි හෝඩිය ... ... ... | xxv |
| විෂය සූචි ... ... ... | xxvii-xxxii |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2-799 |
| ශොධ්‍යස්ථාන දර්ශනය ... ... ... | 801 |
| බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා .. ... | 803 |

# සංස්කාරක නිවේදනය

දෙදහස් පන්සිය වැනි බුද්ධපරිනිර්වාණ වර්ෂය අනුස්මරණය සඳහා ප්‍රාරබ්ධ සත්කාර්‍ය්‍යයන් කෙරෙහි අතිශයින් දූරසටිත වූයේ බුදුරදුන්ගේ ආගමව වචන වූ ත්‍රිපිටක පාළිය සංශෝධන කොට සියබසින් තබාලීම යැ. මේ කාර්‍ය්‍යභාරය නිර්වහණය පිණිස පත්කරන ලද පරිවර්තක මණ්ඩල හා සංස්කාරක මණ්ඩල ගැන කියැයුතු දැ සියල්ල මුලින් මුද්‍රණය වූ ග්‍රන්ථයන්හි සංස්කාරක නිවේදනවලදී පළකොට ඇත. තවද ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය විසින් මුල් අවස්ථායෙහි ත්‍රිපිටක ග්‍රන්ථ සියල්ල කාණ්ඩ දෙපනස (52) කින් යුක්ත කොට මුද්‍රණය කළ මැනැවැයි සම්මත කරන ලද්දේ ය. ඇතැම් ග්‍රන්ථයෙක පරිච්ඡේද ප්‍රමාණාදිය සැලකීමෙනි. යමකප්පකරණයෙහි ප්‍රථම භාගය "මූල – ඛන්ධ – ආයතන ධාතු–සච්ච" යන යමක පඤ්චකය සංග්‍රහ කොට මුද්‍රිත විය. සංඛාරාදි ඉතිරි යමක පස ද්විතීය භාගය වශයෙන් සලකන ලද නමුදු මුද්‍රණ අවස්ථාවට පැමිණ එය ප්‍රමාණයෙන් විශාල වනබව පෙනුණු හෙයින් "සංඛාර – අනුශය – චිත්ත – ධම්ම" යන යමක චතුෂ්කය ද්විතීය භාගයෙහි ප්‍රථම කාණ්ඩය වශයෙන් නිමවාලන්නට සිදුවිය. ඉන්ද්‍රිය යමකය මෙහි දෙවැනි කාණ්ඩය වශයෙන් මුද්‍රණය වන්නේ ය.

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි එකුන්පනස් (49) වැනි ග්‍රන්ථය වූ යමකප්පකරණ ද්විතීය භාගය අභිධර්මපිටකයෙහි නව වැනි ග්‍රන්ථය වෙයි. එය සියබසට නඟාලීම සඳහා පවරා දෙන ලද්දේ රාජකීය පණ්ඩිත මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේට යැ. එහෙත් පරිවර්තන කාර්‍ය්‍යය නිසි පරිදි සිදුවූයේ නැත. උන්වහන්සේගේ හදිසි අභාවය නිසා පෙළ සංස්කරණය කිරීම හා සිංහල අනුවාදය ද ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය වෙත පැවැරිණ. එහෙයින් සම්පාදක මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන හිඟුල, මාකඩවර ශ්‍රී රේවත පරිවෙණාධිපති සතරකෝරළ මහදිසාවේ ප්‍රධාන සඞ්ඝනායක ධූරීණ ශ්‍රී ධර්මස්කන්ධ රේවත රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ ශ්‍රී සුමනසාර ස්ථවිරයන් වහන්සේ විසින් සපුරා සියබසට නඟන ලද්දේ ය. ත්‍රිපිටකයෙහි හා විශෙෂයෙන් අභිධර්මපිටකයෙහි ද පෙරදිග භාෂාශාස්ත්‍රාන්තරයෙහි ද කළ පරිචය ඇති නායක ස්ථවිරයන් වහන්සේ මෙහි පරිවර්තන කාර්‍ය්‍යය මැනැවින් කර ඇතිබව පැවැසිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති තැන්පත් ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ කාරුණික අනුග්‍රහය ද සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන් හා ගරු නියෝජ්‍ය අමාත්‍ය ඩබ්ලිව්. ඇම්. ටී. බණ්ඩා මැතිතුමාණන් ඇතුළු සංස්කෘතික කාර්‍ය්‍යාංශය ද තිසර මුද්‍රණාධිකාරීහු ද මේ සඳහා උපස්ථම්භක වූ හැම සුධීහු ද මෙම ධර්මදානමය කුශලයෙන් සුබභාගී වෙත්වා' යි ආශංසනය කරම්හ.

මේ වගට,

1987 නොවැම්බර් මස
10 වැනි දින
ප්‍රවචනෝදය පිරිවෙන,
මොල්ලිගොඩ.

**ලබුගම ලඞ්කානන්ද**
මහානායකස්ථවිර
ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයේ
ප්‍රධාන සංස්කාරක.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

අග්ගමහාපණ්ඩිත, **බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය** මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අභංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, සාහිත්‍ය චක්‍රවර්ති, රාජකීය **පණ්ඩිත, කෝඳගොඩ ශ්‍රී ඥානාලෝක** දක්ෂිණ-ලංකායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලඞ්කාර විමල කීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, සාහිත්‍යචක්‍රවර්ති රාජකීය **පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්දාභිධාන** — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

කිරුළපන පූර්වාරාමයෙහි හා නාරාහේන්පිට අභයාරාමයෙහි අධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, **රද්දැල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක** — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද රාජකීය පණ්ඩිත, **වෙඩරුවේ ශ්‍රී අනවමදර්ශී**—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ, මාකඩවර ශ්‍රී රේවත පරිවෙණාධිපති, සතරකෝරළ මහ-දිසාවේ ප්‍රධාන සංඝනායකධුරන්ධර ශ්‍රී ධර්මසකන්ධ රේවත රාජකීය පණ්ඩිත **කරහම්පිටිගොඩ ශ්‍රී සුමනසාර** ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, **කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර** නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය, රයිගම් කෝරළයේ ප්‍රධාන සංඝනායකධුරන්ධර **උඩුවේ ශ්‍රී ජනානන්ද** ස්ථවිරයන් වහන්සේ.

**ලේකම්:**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, **පණ්ඩිත දෙරගමුවේ සිරි ධම්මපාල** - කොළඹදිශායෙහි ප්‍රධාන සංඝ-නායක ස්ථවිරයන් වහන්සේ.

## සංකේත නිරූපණය

සී.මු. – සීහළක්ඛරමුද්දිත යමකප්පකරණං

සයා – සායාක්ඛර මුද්දිත යමකප්පකරණං

ම.ඡ.සං. – මරම්මඡට්ඨසංගීතියා සොධිත යමකප්පකරණං

අට්ඨකථා – පඤ්චප්පකරණට්ඨකථා

PTS – PALITEXT SOCIETY YAMAKAPPAKARANA

# සංඥාපනය

යමක ප්‍රකරණයෙහි දශවිධ යමකයන් පිළිබඳ නයවිභාගාදි කිවයුතු දෑය ප්‍රථමභාග සංඥාපනයෙහි ලා කියන ලද්දෙ යැ. මේ ග්‍රන්ථයෙහි සඞ්ගෘහීත වූ සඞ්ඛාරයමක යැ අනුසය යමක යැ චිත්තයමක යැ ධම්මයමක යැ යන චතුර්විධ යමකයන් පිළිබඳ විස්තර විභාග ද එය බලා දන්නෙ යැ. විශේෂ වූ කිහිප තැනක් මෙහි දක්වාලම්හ.

ඛන්ධයමකාදියෙහි මෙන් ධම්මුද්දෙසයට අනතුරු වැ පදසොධනය නො අරඹා පළමු වැ සඞ්ඛාර විභාග කොට දක්වා ඉක්බිති පදසොධන වාරය ඇරඹීම සඞ්ඛාර යමකයෙහි දක්නා විශේෂයෙකි. මෙහි ‘සඞ්ඛාර’ නම් කායසඞ්ඛාර යැ වචීසඞ්ඛාර යැ චිත්තසඞ්ඛාර යැ යන මොහු යි. ඔවුනතුරෙහි:

**‘කායසඞ්ඛාර’** යනු ආශ්වාස ප්‍රශ්වාස වාතයට නමී. කරජකයින් ආශ්වාස ප්‍රශ්වාස වාතය නිපදවනු ලබන හෙයින් ඒ කායසඞ්ඛාර නම් වෙයි. ඒ කීහ චූළවෙදල්ල සූත්‍රයෙහි: “අස්සාසපස්සාසා ඛො ආවුසො විසාඛ කායිකා. එතෙ ධම්මා කායපටිබද්ධා” යි. **‘වචීසඞ්ඛාර’** යනු විතර්ක විචාරයනට නමි. පළමු මැ විතර්කවිචාර කොට පසු වැ වාග්භෙද කරන හෙයින් විතර්කවිචාර ‘වචීසඞ්ඛාර’ යි කියනු ලැබෙයි. එය කීහ චූළවෙදල්ලයෙහි “පුබ්බෙ ඛො ආවුසො විසාඛ විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති තස්මා විතක්කවිචාරා ‘වචීසඞ්ඛාරො’ යි. **“චිත්තසඞ්ඛාර”** යනු සංඥා වෙදනා දෙකට ද විතර්කවිචාර හැර හැම චිත්තසම්ප්‍රයුක්ත ධර්මයනට ද නමි. සංඥා හා වෙදනා හා මෙ දෙක චෛතසිකයෝ යැ. ඔහු චිත්තප්‍රතිබද්ධ හෙයින් ‘චිත්තසඞ්ඛාර’ නම් වෙති. එය කීහ චූළවෙදල්ලයෙහි: “සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා. එතෙ ධම්මා චිත්තපටිබද්ධා තස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරො” යි “ඨපෙත්වා විතක්කවිචාරෙ සබ්බෙපි චිත්තසම්පයුත්තකා ධම්මා චිත්තසඞ්ඛාරා” යනු සඞ්ඛාරයමක යි.

**‘අනුසය’** යනු අප්‍රහීණ වැ සන්තානගත වැ සිටුනා කාමරාග යැ පටිඝ යැ මාන යැ දිට්ඨි යැ විචිකිච්ඡා යැ භවරාග යැ අවිජ්ජා යැ යන සප්තවිධ ක්ලේශධර්මයනට නමි. අප්‍රහීණ වැ සන්තානයෙහි සයනය කරන අර්ථයෙන් ඔහු අනුසය නම් වෙති. අනුරූප කාරණ ලැබැ නැඟී සිටීම අනුසය ස්වරූප යි. අනුසය ධර්මයෝ චිත්තසම්ප්‍රයුක්තයෝ යැ. ඒකාන්ත අකුශල ධර්ම වෙති. ඔවුනතුරෙහි දිට්ඨි විචිකිච්ඡා දෙක සෝවන් මඟින් ද කාමරාග පටිඝ දෙක අනගැමි මඟින් ද මාන භවරාග අවිජ්ජා තුන රහත් මඟින් ද ප්‍රහාතව්‍ය වෙති.

අනුසය යමක පාළියෙහි **අනුලොමනයෙහි** ''ද්වින්නං පුග්ගලානං'' යන තන්හි සොතාපන්න සකදාගාමී පුද්ගලයෝ දෙදෙනා ද ''තිණ්ණං පුග්ගලානං'' යන තන්හි පුථුජ්ජන සොතාපන්න සකදාගාමී තිදෙනා ද ''චතුන්නං පුග්ගලානං'' යන තන්හි පුථුජ්ජන සොතාපන්න සකදාගාමී අනාගාමී පුද්ගලයෝ සතර දෙනා ද ගතයුතු වෙති. **පටිලොමනයෙහි** ''ද්වින්නං පුග්ගලානං'' යන තන්හි අනාගාමී අරහන්ත දෙදෙනා ගත යුත්තාහ. **පජහනවාරයෙහි** ''අට්ඨමකො''යි සොතාපත්ති මාර්ගයෙහි සිටි පුද්ගලයා කියනු ලැබෙයි. අර්හත්ඵලස්ථ පුද්ගල අග්‍රදක්ෂිණාර්හ බැවින් ප්‍රථම පුද්ගල වේ.

**උප්පන්නං:** චිත්ත යමකයෙහි උප්පන්නුප්පජ්ජමාන වාරයෙහි ''උප්පාදක්ඛණෙ උප්පන්නඤ්ච උප්පජ්ජමානඤ්ච'' යන තන්හි 'උප්පන්නං' යනු උත්පාදසමඞ්ගි සිතට ද උත්පාදයට පැමිණ නිරුද්ධ නො වූ සිතට ද නමි.

**උප්පජ්ජමානං ඛණං:** අතික්කන්තකාලවාරයෙහි **''උප්පජ්ජමානං ඛණං''** යනු උත්පාදක්ෂණය යි. එහි උත්පාදක්ෂණය උත්පද්‍යමාන නොවතුදු උත්පද්‍යමාන චිත්තයාගේ ක්ෂණය වන බැවින් 'උත්පාදක්ෂණය' යි කියන ලදි.

**''ඛණං විතික්කන්තං අතික්කන්තකාලං''** යනු නොබෝකල්හි ඉක්ම ගිය යන අරුති. උපදනා සිත උත්පාදක්ෂණය ඉක්මවා අතික්‍රාන්තකාල සංඛ්‍යාවට යෙයි.

ධම්ම යමක පවත්තිමහාවාරයෙහි **''උප්පජ්ජන්ති නිරුජ්ඣන්ති''** යන මෙහි උත්පාදනිරොධයෙහි කුශලාකුශල ධර්මයෝ ඒකාන්තයෙන් ප්‍රවෘත්ති කාලයෙහි මැ ලැබෙති. ච්‍යුති ප්‍රතිසන්ධි කාලයෙහි නො ලැබෙත්. අව්‍යාකෘත ධර්මයෝ ප්‍රවෘත්තියෙහි ද ච්‍යුතියෙහි ද ප්‍රතිසන්ධියෙහි දැ යි තුන් කල්හි මැ ලැබෙත්. ධම්ම යමකයෙහි පරිඤ්ඤාවාරය භාවනාවාර නම් වේ.

**කරහම්පිටිගොඩ සුමනසාර**
හිඟුල, මාකඩවර, රෙවත පරිවෙණාධිපති,
සතර කෝරළ මහදිසාවේ
ප්‍රධාන සංඝනායක ස්ථවිර,

රෙවත පිරිවෙන,
මාකඩවර.
හිඟුල.
1987. 11. 07.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ ē  ඔ ō

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| කක kka | ඤඤ ñña | ත්‍ර tra | මඵ mpha |
| කඛ kkha | ණහ ṇha | දද dda | මබ, ඹ mba |
| ක්‍ය kya | ඤච ñca | දධ ddha | මභ mbha |
| ක්‍රි kri | ඤඡ ñcha | ද්‍ර dra | මම mma |
| ක්‍ව kva | ඤජ ñja | ද්‍ව, ද්ව dva | මහ mha |
| ඛ්‍ය khya | ඤඣ ñjha | ධ්‍ව dhva | යය, ය්‍ය yya |
| ඛ්‍ව khva | ටට ṭṭa | නත nta | යහ yha |
| ගග gga | ටඨ, ඨ ṭṭha | නථ ntha | ලල lla |
| ගඝ ggha | ඩඩ ḍḍa | නද nda | ල්‍ය lya |
| ඞක ṅka | ඩඪ ḍḍha | නධ ndha | ලහ lha |
| ග්‍ර gra | ණණ ṇṇa | නන nna | ව්හ wha |
| ඞඛ ṅkha | ණට ṇṭa | නහ nha | ස්ස ssa |
| ඞග ṅga | ණඨ ṇṭha | පප ppa | සම sma |
| ඞඝ ṅgha | ණඩ, ඬ ṇḍa | පඵ ppha | ස්ව sva |
| චච cca | තත tta | බබ bba | හම hma |
| චඡ ccha | තථ ttha | බභ bbha | ව්හ vha |
| ජජ jja | ත්‍ව tva | බ්‍ර bra | ළහ ḷha |
| ජඣ jjha | | මප mpa | |

ා ā  ි i  ී ī  ු u  ූ ū  ෙ ē

# යමකප්පකරණ – දුතියො භාගො

## විසය සූචි

විසයානි | පිට්ඨඞ්කා

### 6. සඞ්ඛාරයමකං 2 – 117


1. පණ්ණත්ති උද්දෙසවාරො .. .. 2-5

    පදසොධනවාරො .. .. 3

    පදසොධනමූලචක්කවාරො .. 5

    සුද්ධසඞ්ඛාරවාරො .. .. 5

2. පණ්ණත්ති නිද්දෙසවාරො .. .. 6–13

    පදසොධනවාරො .. .. 7

    පදසොධනමූලචක්කවාරො .. 11

    සුද්ධසඞ්ඛාරවාරො .. .. 15

3. පවත්ති උප්පාදවාරො .. .. 14–55

    පච්චුප්පන්නවාරො .. .. 21

    අනාගතවාරො .. .. 33

    අතීතවාරො .. .. 55

4. පවත්ති නිරොධවාරො .. .. 56–93

    පච්චුප්පන්නවාරො .. .. 61

    අතීතවාරො .. .. 61

    පච්චුප්පන්නාතීතවාරො .. .. 77

    පච්චුප්පන්නානාගතවාරො .. 85

    අතීතානාගතවාරො .. .. 93

5. උප්පාදනිරොධවාරො .. .. 94–117

    පච්චුප්පන්නවාරො .. .. 97

    අතීතවාරො .. .. 99

    අනාගතවාරො .. .. 105

    පච්චුප්පන්නාතීතවාරො .. .. 107

    පච්චුප්පන්නානාගතවාරො .. 115

    අතීතානාගතවාරො .. .. 117

    පරිඤ්ඤාවාරො .. .. 117

## 7. අනුසය යමකං 118 – 599


උප්පත්තිට්ඨානවාරො .. 118 – 119

1. අනුසයවාරො .. .. 120 – 211

අනුලොමපුග්ගලොකාස .. .. 165
පටිලොමාවකාස .. .. 187
පටිලොමපුග්ගලොකාස .. .. 211

2. සානුසයවාරො .. .. 212 – 307

අනුලොමපුග්ගල .. .. 221
අනුලොමඔකාස .. .. 237
අනුලොමපුග්ගලොකාස .. .. 257
පටිලොමපුග්ගල .. .. 265
පටිලොමඔකාස .. .. 279
පටිලොමපුග්ගලොකාස .. .. 307

3. පජහනවාරො .. .. 308 – 393

අනුලොමපුග්ගල .. .. 313
අනුලොමාවකාස .. .. 325
අනුලොමපුග්ගලොකාස .. .. 337
පටිලොමපුග්ගල .. .. 349
පටිලොමඔකාස .. .. 363
පටිලොමපුග්ගලොකාස .. .. 393

4. පරිඤ්ඤවාරො .. .. 394 – 481

අනුලොමපුග්ගල .. .. 399
අනුලොමඔකාස .. .. 413
අනුලොමපුග්ගලොකාස .. .. 425
පටිලොමපුග්ගල .. .. 437
පටිලොමඔකාස .. .. 451
පටිලොමපුග්ගලොකාස .. .. 481

5. පහීනවාරො .. .. 482 – 561

අනුලොමපුග්ගල .. .. 489
අනුලොමඔකාස .. .. 503
අනුලොමපුග්ගලොකාස .. .. 521
පටිලොමපුග්ගල .. .. 529
පටිලොමඔකාස .. .. 543
පටිලොමපුග්ගලොකාස .. .. 561

6. උප්පජ්ජනවාරො .. .. 562 – 563
7. ධාතුපුච්ඡාවාරො .. .. 564 – 581
8. ධාතුවිස්සජ්ජනවාරො .. .. 582 – 599

**8. චිත්තයමකං 600 – 667**

1. උද්දෙසවාරො .. .. 600 – 631

**පුග්ගලවාරො**

උප්පාදනිරොධකාලසම්භෙදවාරො .. 601
උප්පාදුප්පන්නවාරො .. .. 601
නිරොධුප්පන්නවාරො .. .. 601
උප්පාදවාරො .. .. 603
නිරොධවාරො .. .. 605
උප්පාදනිරොධවාරො .. .. 605
උප්පජ්ජමාන න නිරොධවාරො .. 607
නිරුජ්ඣමානුප්පන්නවාරො .. 607
උප්පන්නුප්පාදවාරො .. .. 609
අතීතානාගතවාරො .. .. 609
උප්පන්නුප්පජ්ජමානවාරො .. 609
නිරුද්ධ නිරුජ්ඣමානවාරො .. 609
අතික්කන්තකාලවාරො .. .. 611

**ධම්මවාරො**

උප්පාද නිරොධකාලසම්භෙදවාරො .. 611
උප්පාදුප්පන්නවාරො .. .. 611
නිරොධුප්පන්නවාරො .. .. 611
උප්පාදවාරො .. .. 613
නිරොධවාරො .. .. 615
උප්පාදනිරොධවාරො .. .. 615
උප්පජ්ජමාන නිරොධවාරො .. 615
උප්පජ්ජමානුප්පන්නවාරො .. 617
නිරුජ්ඣමානුප්පන්නවාරො .. .. 617
උප්පන්නුප්පාදවාරො .. .. 617
අතීතානාගතවාරො .. .. 619
උප්පන්නුප්පජ්ජමානවාරො .. 619
නිරුද්ධ නිරුජ්ඣමානවාරො .. 619

විසයානි — පිට්ඨඞ්කා


| විසයානි | පිට්ඨඞ්කා |
|---|---|
| අතික්කන්තකාලවාරො .. .. | 619 |
| උප්පාදනිරොධකාලසම්භෙදවාරො .. | 621 |
| උප්පාදුප්පන්නවාරො .. .. | 621 |
| නිරොධුප්පන්නවාරො .. .. | 621 |
| උද්දෙසවාරො .. .. | 623 |
| නිරොධවාරො .. .. | 623 |
| උප්පාදනිරොධවාරො .. .. | 625 |
| උප්පජ්ජමාන න නිරොධවාරො .. | 625 |
| උප්පජ්ජමානුප්පන්නවාරො .. | 627 |
| නිරුජ්ඣමානුප්පන්නවාරො .. | 627 |
| උප්පන්නුප්පාදවාරො .. .. | 627 |
| අතීතානාගතවාරො .. .. | 629 |
| උප්පන්නුප්පජ්ජමානවාරො .. | 629 |
| නිරුද්ධ නිරුජ්ඣමානවාරො .. | 629 |
| සරාගාදිපදමිස්සකවාරො .. .. | 631 |
| කුසලාදිපදමිස්සකවාරො .. .. | 631 |
| 2. නිද්දෙසවාරො .. .. | 632 – 667 |


### පුග්ගලවාරො


| | |
|---|---|
| උප්පාදනිරොධකාලසම්භෙදවාරො .. | 633 |
| උප්පාදුප්පන්නවාරො .. | 633 |
| නිරොධුප්පන්නවාරො .. .. | 635 |
| උප්පාදවාරො .. .. | 637 |
| නිරොධවාරො .. .. | 639 |
| උප්පාදනිරොධවාරො .. .. | 641 |
| උප්පජ්ජමාන න නිරොධවාරො .. | 641 |
| උප්පජ්ජමානුප්පන්නවාරො.. .. | 641 |
| නිරුජ්ඣමානුප්පන්නවාරො .. | 643 |
| උප්පන්නුප්පාදවාරො .. .. | 643 |
| අතීතානාගතවාරො .. .. | 645 |
| උප්පන්නුප්පජ්ජමානවාරො .. | 645 |
| නිරුද්ධ නිරුජ්ඣමානවාරො .. | 645 |
| අතික්කන්තකාලවාරො .. .. | 647 |


### ධම්මවාරො


| | |
|---|---|
| උප්පාදනිරොධකාලසම්භෙදවාරො .. | 647 |
| උප්පාදුප්පන්නවාරො .. .. | 649 |

විසයානි | පිට්ඨඞ්කා


නිරෝධුප්පන්නවාරෝ .. .. 649
උප්පාදවාරෝ .. .. 651
නිරෝධවාරෝ .. .. 653
උප්පාදනිරෝධවාරෝ .. .. 655
උප්පජ්ජමාන න නිරෝධවාරෝ .. 655
උප්පජ්ජමානුප්පන්නවාරෝ .. 655
නිරුජ්ඣමානුප්පන්නවාරෝ .. 657
උප්පන්නුප්පාදවාරෝ .. .. 657
අතීතානාගතවාරෝ .. .. 659
උප්පන්නුප්පජ්ජමානවාරෝ 659
නිරුද්ධ නිරුජ්ඣමානවාරෝ .. 659
අතික්කන්තකාලවාරෝ .. .. 661


## පුග්ගලධම්මවාරෝ


උප්පාදනිරෝධකාලසම්භේදවාරෝ .. 661
උප්පාදුප්පන්නවාරෝ .. .. 661
නිරෝධුප්පන්නවාරෝ .. .. 663
උප්පාදවාරෝ .. .. 665
නිරෝධවාරෝ .. .. 667
සරාගාදිපදමිස්සකවාරෝ .. .. 667
කුසලාදිපදමිස්සකවාරෝ .. .. 667


## 9. ධම්මයමකං 668 – 799


1. පණ්ණත්ති උද්දෙසවාරෝ .. .. 668 – 673
   පදසොධනවාරෝ .. .. 669
   පදසොධනමූලචක්කවාරෝ .. .. 671
   සුද්ධධම්මවාරෝ .. .. 671
   සුද්ධධම්මමූලචක්කවාරෝ .. .. 673
2. පණ්ණත්ති නිද්දෙසවාරෝ .. .. 674 – 681
   පදසොධනවාරෝ .. .. 675
   පදසොධනමූලචක්කවාරෝ .. .. 677
   සුද්ධධම්මවාරෝ .. .. 679
   සුද්ධධම්මමූලචක්කවාරෝ .. .. 681
3. උප්පාදවාරෝ .. .. 682 – 719
   අතීතවාරෝ .. .. 695

විසයානි පිට්ඨඞ්කා


අනාගතවාරො .. .. 703
පච්චුප්පන්නාතීතවාරො .. .. 707
පච්චුප්පන්නානාගතවාරො .. .. 713

4. නිරොධවාරො .. .. 720 - 759

පච්චුප්පන්නවාරො .. .. 729
අතීතවාරො .. .. 735
අනාගතවාරො .. .. 741
පච්චුප්පන්නාතීතවාරො .. .. 747
පච්චුප්පන්නානාගතවාරො .. .. 753
අතීතානාගතවාරො .. .. 759

5 උප්පාදනිරොධවාරො .. .. 760 - 797

පච්චුප්පන්නවාරො .. .. 767
අතීතවාරො .. .. 773
අනාගතවාරො .. .. 779
පච්චුප්පන්නාතීතවාරො .. .. 785
පච්චුප්පන්නානාගතවාරො .. .. 793
අතීතානාගතවාරො .. .. 797
භාවනාවාරො .. .. 799

# අභිධම්ම පිටකෙ

# යමකප්පකරණං

අභිධම්මපිටකෙ

# යමකප්පකරණං

නමො තස්ස භගවතො අර්හතො සම්මාසම්බුද්ධස්ස

## 6. සඞ්ඛාරයමකං

### 1. පණ්ණත්ති උද්දෙසවාරො

තයො සඞ්ඛාරා:- කායසඞ්ඛාරො, වචීසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරොති. අස්සාසපස්සාසා කායසඞ්ඛාරො, විතක්කවිචාරා වචීසඞ්ඛාරො, සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරො, ඨපෙත්වා විතක්කවිචාරෙ සබ්බෙපි චිත්තසම්පයුත්තකා ධම්මා චිත්තසඞ්ඛාරො.

1. කායො කායසඞ්ඛාරො, කායසඞ්ඛාරො කායො.

2. වචී වචීසඞ්ඛාරො, වචීසඞ්ඛාරො වචී.

3. චිත්තං චිත්තසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො චිත්තං (අනුලොමං).

4. න කායො න කායසඞ්ඛාරො, න කායසඞ්ඛාරො න කායො.

5. න වචී න වචීසඞ්ඛාරො, න වචීසඞ්ඛාරො න වචී.

6. න චිත්තං න චිත්තසඞ්ඛාරො, න චිත්තසඞ්ඛාරො න චිත්තං (පච්චනීකං).

පදසොධනවාරො.

7. කායො කායසඞ්ඛාරො, සඞ්ඛාරා වචීසඞ්ඛාරො.

8. කායො කායසඞ්ඛාරො, සඞ්ඛාරා චිත්තසඞ්ඛාරො.

9. වචී වචීසඞ්ඛාරො, සඞ්ඛාරා කායසඞ්ඛාරො.

අභිධර්මපිටකයෙහි

# යමක ප්‍රකරණය

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා.

## 6. සංස්කාරයමකය

### 1. ප්‍රඥප්ති උද්දේශවාරය

සංස්කාරයෝ තිදෙනෙකි: කායසංස්කාර යැ, වාක්සංස්කාර යැ, චිත්තසංස්කාර යි. ආශ්වාසප්‍රශ්වාසයෝ කායසංස්කාර යැ. විතර්ක විචාරයෝ වාක්සංස්කාර යැ. සංඥාව ද වේදනාව ද චිත්තසංස්කාර යැ. විතර්කවිචාරයන් තබා සිත හා යෙදුණු සියලු මැ ධර්මයෝ චිත්ත සංස්කාර යි.

1. කාය කායසංස්කාර වේ ද, කායසංස්කාරය කාය වේ ද.
2. වාක් වාක්සංස්කාර වේ ද, වාක්සංස්කාරය වාක් වේ ද.
3. චිත්ත චිත්තසංස්කාර වේ ද, චිත්තසංස්කාරය චිත්ත වේ ද. (අනුලොම යි)
4. කාය නො වූයේ කායසංස්කාර නො වේ ද, කායසංස්කාර නො වූයේ කාය නො වේ ද.
5. වාක් නො වූයේ වාක්සංස්කාර නො වේ ද, වාක්සංස්කාර නො වූයේ වාක් නො වේ ද.
6. චිත්ත නො වූයේ චිත්තසංස්කාර නො වේ ද, චිත්ත සංස්කාර නො වූයේ චිත්ත නො වේ ද. (ප්‍රත්‍යනීක යි)

පදශොධනවාර යි.

7. කය කායසංස්කාර වේ ද, සංස්කාරයෝ වාක්සංස්කාර වේ ද.
8. කය කායසංස්කාර වේ ද, සංස්කාරයෝ චිත්තසංස්කාර වේ ද.
9. වාක් වාක්සංස්කාර වේ ද, සංස්කාරයෝ කායසංස්කාර වේ ද.

10. වචී වචීසඞ්ඛාරො, සඞ්ඛාරා චිත්තසඞ්ඛාරො.

11. චිත්තං චිත්තසඞ්ඛාරො, සඞ්ඛාරා කායසඞ්ඛාරො.

12. චිත්තං චිත්තසඞ්ඛාරො, සඞ්ඛාරා වචීසඞ්ඛාරො (අනුලොමං).

13. න කායො න කායසඞ්ඛාරො, න සඞ්ඛාරා න වචීසඞ්ඛාරො.

14. න කායො න කායසඞ්ඛාරො, න සඞ්ඛාරා න චිත්ත සඞ්ඛාරො.

15. න වචී න වචීසඞ්ඛාරො, න සඞ්ඛාරා න කායසඞ්ඛාරො.

16. න වචී න වචීසඞ්ඛාරො, න සඞ්ඛාරා න චිත්තසඞ්ඛාරො.

17. න චිත්තං න චිත්තසඞ්ඛාරො, න සඞ්ඛාරා න කායසඞ්ඛාරො.

18. න චිත්තං න චිත්තසඞ්ඛාරො, න සඞ්ඛාරා න වචීසඞ්ඛාරො (පච්චනීකං).

පදසොධනමූලචක්කවාරො.

19. කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො, වචීසඞ්ඛාරො කායසඞ්ඛාරො.

20. කායසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො කායසඞ්ඛාරො.

21. වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො වචීසඞ්ඛාරො (අනුලොමං).

22. න කායසඞ්ඛාරො න වචීසඞ්ඛාරො, න වචීසඞ්ඛාරො න කායසඞ්ඛාරො.

23. න කායසඞ්ඛාරො න චිත්තසඞ්ඛාරො, න චිත්තසඞ්ඛාරො න කායසඞ්ඛාරො.

24. න වචීසඞ්ඛාරො න චිත්තසඞ්ඛාරො, න චිත්තසඞ්ඛාරො න වචීසඞ්ඛාරො (පච්චනීකං).

සුද්ධසඞ්ඛාරවාරො.

පණ්ණත්තිඋද්දෙසවාරො නිට්ඨිතො.

10. වාක් වාක්සංස්කාර වේ ද, සංස්කාරයෝ චිත්තසංස්කාර වේ ද.

11. චිත්ත චිත්තසංස්කාර වේ ද, සංස්කාරයෝ කායසංස්කාර වේ ද.

12. චිත්ත චිත්තසංස්කාර වේ ද, සංස්කාරයෝ වාක්සංස්කාර වේ ද. (අනුලොම යි)

13. කාය නො වූයේ කායසංස්කාර නො වේ ද, සංස්කාර නො වූවාහු වාක්සංස්කාර නො වේ ද.

14. කාය නො වූයේ කායසංස්කාර නො වේ ද, සංස්කාර නො වූවාහු චිත්තසංස්කාර නො වේ ද.

15. වාක් නො වූයේ වාක් සංස්කාර නො වේ ද, සංස්කාර නො වූවාහු කායසංස්කාර නො වේ ද.

16. වාක් නො වූයේ වාක්සංස්කාර නො වේ ද, සංස්කාර නො වූවාහු චිත්තසංස්කාර නො වේ ද.

17. චිත්ත නො වූයේ චිත්තසංස්කාර නො වේ ද, සංස්කාර නො වූවාහු කායසංස්කාර නො වේ ද.

18. චිත්ත නො වූයේ චිත්තසංස්කාර නො වේ ද, සංස්කාර නො වූවාහු වාක්සංස්කාර නො වේ ද. (ප්‍රත්‍යනීක යි)

පදශොධනමූලචක්‍රවාර යි.

19. කායසංස්කාරය වාක්සංස්කාර වේ ද, වාක්සංස්කාරය කායසංස්කාර වේ ද.

20. කායසංස්කාරය චිත්තසංස්කාර වේ ද, චිත්තසංස්කාරය කායසංස්කාර වේ ද.

21. වාක්සංස්කාරය චිත්තසංස්කාර වේ ද, චිත්තසංස්කාරය වාක්සංස්කාර වේ ද. (අනුලොම යි)

22. කායසංස්කාර නො වූයේ වාක්සංස්කාර නො වේ ද. වාක්සංස්කාර නො වූයේ කායසංස්කාර නො වේ ද.

23. කායසංස්කාර නො වූයේ චිත්තසංස්කාර නො වේ ද, චිත්තසංස්කාර නො වූයේ කායසංස්කාර නො වේ ද.

24. වාක්සංස්කාර නො වූයේ චිත්තසංස්කාර නො වේ ද, චිත්තසංස්කාර නො වූයේ වාක්සංස්කාර නො වේ ද. (ප්‍රත්‍යනීක යි)

ශුද්ධසංස්කාරවාර යි.

## ප්‍රඥප්ති උද්දේශවාර නිමි.

## 2. පණ්ණත්ති නිද්දෙසවාරො

1. කායො කායසඞ්ඛාරොති: නො. කායසඞ්ඛාරො කායොති: නො.

2. වචී වචීසඞ්ඛාරොති: නො. වචීසඞ්ඛාරො වචීති: නො.

3. චිත්තං චිත්තසඞ්ඛාරොති: නො. චිත්තසඞ්ඛාරො චිත්තන්ති: නො. (අනුලොමං).

4. න කායො න කායසඞ්ඛාරොති: කායසඞ්ඛාරො න කායො, කායසඞ්ඛාරො. කායඤ්ච කායසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව කායො, න ච කායසඞ්ඛාරො. න කායසඞ්ඛාරො න කායොති: කායො න කායසඞ්ඛාරො, කායො. කායඤ්ච කායසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව කායො න ච කායසඞ්ඛාරො.

5. න වචී න වචීසඞ්ඛාරොති: වචීසඞ්ඛාරො න වචී, වචීසඞ්ඛාරො. වචීඤ්ච වචීසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව වචී. න ච වචීසඞ්ඛාරො. න වචීසඞ්ඛාරො න වචීති: වචී න වචීසඞ්ඛාරො, වචී. වචීඤ්ච වචීසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව වචී න ච වචීසඞ්ඛාරො.

6. න චිත්තං න චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො න චිත්තං, චිත්තසඞ්ඛාරො. චිත්තඤ්ච චිත්තසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චිත්තං, න ච චිත්තසඞ්ඛාරො. න චිත්තසඞ්ඛාරො න චිත්තන්ති: චිත්තං න චිත්තසඞ්ඛාරො, චිත්තං. චිත්තඤ්ච චිත්තසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චිත්තං, න ච චිත්තසඞ්ඛාරො. (පච්චනීකං)

### පදසොධනවාරො.

7. කායො කායසඞ්ඛාරොති: නො. සඞ්ඛාරා වචීසඞ්ඛාරොති: වචීසඞ්ඛාරො සඞ්ඛාරො චෙව වචීසඞ්ඛාරො ච. අවසෙසා සඞ්ඛාරා සඞ්ඛාරා, න වචීසඞ්ඛාරො[1].

1. අවසෙසා සඞ්ඛාරා න වචීසඞ්ඛාරො. – මජසං.

## 2. ප්‍රඥප්ති නිර්දේශවාරය

1. කාය කායසංස්කාර වෙයි යත්: නැති. කායසංස්කාරය කාය වෙයි යත්: නැති.

2. වාක් වාක්සංස්කාර වෙයි යත්: නැති. වාක්සංස්කාරය වාක් වෙයි යත්: නැති.

3. චිත්තය චිත්තසංස්කාර වෙයි යත්: නැති. චිත්තසංස්කාරය චිත්ත වෙයි යත්: නැති. (අනුලොම යි)

4. කාය නො වූයේ කායසංස්කාර නො වෙයි යත්: කායසංස්කාරය කාය නො වේ, කායසංස්කාර යි. කාය ද කායසංස්කාර ද තබා සෙස්සෝ කාය ද නො වූයේ ම කායසංස්කාර ද නො වේ. කායසංස්කාර නො වූයේ කාය නො වෙයි යත්: කාය කායසංස්කාර නො වේ, කාය යි. කාය ද කායසංස්කාර ද තබා සෙස්ස කාය ද නො වූයේ ම කායසංස්කාර ද නො වේ.

5. වාක් නො වූයේ වාක්සංස්කාර නො වෙයි යත්: වාක්සංස්කාරය වාක් නො වේ, වාක්සංස්කාර යි. වාක් ද වාක්සංස්කාර ද තබා සෙස්ස වාක් නො වූයේ ම වාක්සංස්කාර ද නො වේ. වාක්සංස්කාර නො වූයේ වාක් නො වෙයි යත්: වාක් වාක්සංස්කාර නො වේ, වාක් වෙයි. වාක් ද වාක්සංස්කාර ද තබා සෙස්ස වාක් නො වූයේ ම වාක්සංස්කාර ද නො වේ.

6. චිත්ත නො වූයේ චිත්තසංස්කාර නො වෙයි යත්: චිත්තසංස්කාරය චිත්ත නො වේ. චිත්තසංස්කාර යි. චිත්ත ද චිත්තසංස්කාර ද තබා සෙස්ස චිත්ත ද නො වූයේ ම චිත්තසංස්කාර ද නො වේ. චිත්තසංස්කාර නො වූයේ චිත්ත නො වෙයි යත්: චිත්තය චිත්තසංස්කාර නො වේ, චිත්ත යි. චිත්ත ද චිත්තසංස්කාර ද තබා සෙස්ස චිත්ත ද නො වූයේ ම චිත්තසංස්කාර ද නො වේ. (ප්‍රත්‍යනීක යි)

පදශොධනවාර යි.

7. කාය කායසංස්කාර වෙයි යත්: නැති. සංස්කාරයෝ වාක්සංස්කාර වේ ද යත්: වාක්සංස්කාරය සංස්කාර වූයේ ම වාක්සංස්කාර ද වෙයි, සෙසු සංස්කාරයෝ සංස්කාරයහ, වාක්සංස්කාර නො වේ.

8. කායො කායසඞ්ඛාරොති : නො. සඞ්ඛාරා චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො සඞ්ඛාරො චෙව චිත්තසඞ්ඛාරො ච. අවසෙසා සඞ්ඛාරා සඞ්ඛාරා, න චිත්තසඞ්ඛාරො.

9. වචී වචීසඞ්ඛාරොති : නො. සඞ්ඛාරා කායසඞ්ඛාරොති : කායසඞ්ඛාරො සඞ්ඛාරො චෙව කායසඞ්ඛාරො ච. අවසෙසා සඞ්ඛාරා සඞ්ඛාරා, න කායසඞ්ඛාරො.

10. වචී වචීසඞ්ඛාරොති: නො. සඞ්ඛාරා චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො සඞ්ඛාරො චෙව චිත්තසඞ්ඛාරො ච. අවසෙසා සඞ්ඛාරා සඞ්ඛාරා, න චිත්තසඞ්ඛාරො.

11. චිත්තං චිත්තසඞ්ඛාරොති : නො. සඞ්ඛාරා කායසඞ්ඛාරොති : කායසඞ්ඛාරො සඞ්ඛාරො චෙව කායසඞ්ඛාරො ච. අවසෙසා සඞ්ඛාරා සඞ්ඛාරා, න කායසඞ්ඛාරො.

12. චිත්තං චිත්තසඞ්ඛාරොති : නො. සඞ්ඛාරා වචීසඞ්ඛාරොති : වචීසඞ්ඛාරො සඞ්ඛාරො චෙව වචීසඞ්ඛාරො ච. අවසෙසා සඞ්ඛාරා සඞ්ඛාරා, න වචීසඞ්ඛාරො. (අනුලොමං)

13. න කායො න කායසඞ්ඛාරොති : කායසඞ්ඛාරො න කායො, කායසඞ්ඛාරො. කායඤ්ච කායසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව කායො න ච කායසඞ්ඛාරො. න සඞ්ඛාරා න වචීසඞ්ඛාරොති ආමන්තා.

14. න කායො න කායසඞ්ඛාරොති : කායසඞ්ඛාරො න කායො, කායසඞ්ඛාරො. කායඤ්ච කායසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව කායො, න ච කායසඞ්ඛාරො. න සඞ්ඛාරා න චිත්තසඞ්ඛාරොති : ආමන්තා.

15. න වචී න වචීසඞ්ඛාරොති : වචීසඞ්ඛාරො න වචී, වචීසඞ්ඛාරො. වචීඤ්ච වචීසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව වචී, න වචීසඞ්ඛාරො. න සඞ්ඛාරා න කායසඞ්ඛාරොති : ආමන්තා.

8. කාය කායසංස්කාර වෙයි යත්: නැති. සංස්කාරයෝ චිත්තසංස්කාර වේ ද යත්: චිත්තසංස්කාරය සංස්කාර ද වූයේ ම චිත්තසංස්කාර ද වෙයි. සෙසු සංස්කාරයෝ සංස්කාරයහ, චිත්තසංස්කාර නො වේ.

9. වාක් වාක්සංස්කාර වෙයි යත්: නැති. සංස්කාරයෝ කායසංස්කාර වේ ද යත්: කායසංස්කාරය සංස්කාර ද වූයේ ම කායසංස්කාර ද වේ. සෙසු සංස්කාරයෝ සංස්කාරයහ. කායසංස්කාර නො වේ.

10. වාක් වාක්සංස්කාර වෙයි යත්: නැති. සංස්කාරයෝ චිත්තසංස්කාර වෙයි යත්: චිත්තසංස්කාරය සංස්කාර ද වූයේ ම චිත්තසංස්කාර ද වේ. සෙසු සංස්කාරයෝ සංස්කාරයහ. චිත්තසංස්කාර නො වේ.

11. චිත්තය චිත්තසංස්කාර වෙයි යත්: නැති. සංස්කාරයෝ කායසංස්කාර වෙයි යත්: කායසංස්කාරය සංස්කාර ද වූයේ ම කායසංස්කාර ද වේ. සෙසු සංස්කාරයෝ සංස්කාරයහ. කායසංස්කාර නො වේ.

12. චිත්තය චිත්තසංස්කාර වෙයි යත්: නැති. සංස්කාරයෝ වාක්සංස්කාර වෙයි යත්: වාක්සංස්කාරය සංස්කාර ද වූයේ ම වාක්සංස්කාර ද වේ. සෙසු සංස්කාරයෝ සංස්කාරයහ, වාක්සංස්කාර නො වේ. (අනුලොම යි)

13. කාය නො වූයේ කායසංස්කාර නො වෙයි යත්: කායසංස්කාරය කාය නො වේ, කාය සංස්කාර යි. කාය ද කායසංස්කාර ද තබා සෙස්ස කාය ද නො වූයේ ම කායසංස්කාර ද නො වේ. සංස්කාර නො වූවාහු වාක්සංස්කාර නො වෙයි යත: එසේ යි.

14. කාය නො වූයේ කායසංස්කාර නො වෙයි යත්: කායසංස්කාරය කාය නො වේ, කායසංස්කාර යි. කාය ද කායසංස්කාර ද තබා සෙස්ස කාය ද නො වූයේ ම කායසංස්කාර ද නො වේ. සංස්කාර නො වූවාහු චිත්තසංස්කාර නො වෙයි යත්: එසේ යි.

15. වාක් නො වූයේ වාක්සංස්කාර නො වෙයි යත්: වාක්සංස්කාරය වාක් නො වෙයි, වාක්සංස්කාර යි. වාක් ද වාක්සංස්කාර ද තබා සෙස්ස වාක් ද නො වූයේ ම වාක්සංස්කාර ද නො වෙයි. සංස්කාර නො වූවාහු කායසංස්කාර නො වෙයි යත්: එසේ යි.

16. න වචී න වචීසඞ්ඛාරොති: වචීසඞ්ඛාරො න වචී, වචීසඞ්ඛාරො. වචිඤ්ච වචීසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව වචී, න ච වචීසඞ්ඛාරො. න සඞ්ඛාරා න චිත්තසඞ්ඛාරොති: ආමන්තා.

17. න චිත්තං න චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො න චිත්තං, චිත්තසඞ්ඛාරො. චිත්තඤ්ච චිත්තසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චිත්තං, න ච චිත්තසඞ්ඛාරො. න සඞ්ඛාරා න කායසඞ්ඛාරොති: ආමන්තා.

18. න චිත්තං න චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො න චිත්තං, චිත්තසඞ්ඛාරො. චිත්තඤ්ච චිත්තසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චිත්තං, න ච චිත්තසඞ්ඛාරො. න සඞ්ඛාරා න වචීසඞ්ඛාරොති: ආමන්තා. (පච්චනීකං)

## පදසොධන මූලචක්කවාරො.

19. කායසඞ්ඛාරො වචීසඞ්ඛාරොති: නො. වචීසඞ්ඛාරො කායසඞ්ඛාරොති: නො.

20. කායසඞ්ඛාරො චිත්තසඞ්ඛාරොති: නො. චිත්තසඞ්ඛාරො කායසඞ්ඛාරොති: නො.

21. වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරොති: නො. චිත්තසඞ්ඛාරො වචීසඞ්ඛාරොති; නො. (අනුලොමං)

22. න කායසඞ්ඛාරො න වචීසඞ්ඛාරොති: වචීසඞ්ඛාරො න කායසඞ්ඛාරො, වචීසඞ්ඛාරො. කායසඞ්ඛාරඤ්ච වචීසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව කායසඞ්ඛාරො, න ච වචීසඞ්ඛාරො. න වචීසඞ්ඛාරො න කායසඞ්ඛාරොති: කායසඞ්ඛාරො න වචීසඞ්ඛාරො, කායසඞ්ඛාරො. වචීසඞ්ඛාරඤ්ච කායසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව වචීසඞ්ඛාරො, න ච කායසඞ්ඛාරො.

23. න කායසඞ්ඛාරො න චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො න කායසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො. කායසඞ්ඛාරඤ්ච චිත්තසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව කායසඞ්ඛාරො, න ච චිත්තසඞ්ඛාරො. න චිත්තසඞ්ඛාරො න කායසඞ්ඛාරොති: කායසඞ්ඛාරො න චිත්තසඞ්ඛාරො, කායසඞ්ඛාරො. චිත්තසඞ්ඛාරඤ්ච කායසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චිත්තසඞ්ඛාරො, න ච කායසඞ්ඛාරො.

16. වාක් නො වූයේ වාක්සංස්කාර නො වෙයි යත්: වාක්සංස්කාරය වාක් නො වෙයි, වාක්සංස්කාර යි. වාක් ද වාක්සංස්කාර ද තබා සෙස්ස වාක් ද නො වූයේ ම වාක්සංස්කාර ද නො වෙයි. සංස්කාර නො වූවාහු චිත්තසංස්කාර නො වෙයි යත්: එසේ යි.

17. චිත්ත නො වූයේ චිත්තසංස්කාර නො වෙයි යත්: චිත්තසංස්කාරය චිත්ත නො වේ, චිත්තසංස්කාර යි. චිත්ත ද චිත්තසංස්කාර ද තබා සෙස්ස චිත්ත ද නො වූයේ ම චිත්තසංස්කාර ද නො වේ. සංස්කාර නො වූවාහු කායසංස්කාර නො වෙයි යත්: එසේ යි.

18. චිත්ත නො වූයේ චිත්තසංස්කාර නො වෙයි යත්: චිත්තසංස්කාරය චිත්ත නො වේ, චිත්තසංස්කාර යි. චිත්ත ද චිත්තසංස්කාර ද තබා සෙස්ස චිත්ත ද නො වූයේ ම චිත්තසංස්කාර ද නො වේ, සංස්කාර නො වූවාහු වාක්සංස්කාර නො වෙයි යත්: එසේ යි. (ප්‍රත්‍යනීක යි)

පදශොධනමූලචක්‍රවාර යි.

19. කායසංස්කාරය වාක්සංස්කාර වෙයි යත්: නැති. වාක්සංස්කාරය කායසංස්කාර වෙයි යත්: නැති.

20. කායසංස්කාරය චිත්තසංස්කාර වෙයි යත්: නැති. චිත්තසංස්කාරය කායසංස්කාර වෙයි යත්: නැති.

21. වාක්සංස්කාරය චිත්තසංස්කාර වෙයි යත්: නැති. චිත්තසංස්කාරය වාක්සංස්කාර වෙයි යත්: නැති. (අනුලොම යි)

22. කායසංස්කාර නො වූයේ වාක්සංස්කාර නො වෙයි යත්: වාක්සංස්කාරය කායසංස්කාර නො වේ, වාක්සංස්කාර යි. කායසංස්කාරය ද වාක්සංස්කාරය ද තබා සෙස්ස කායසංස්කාර ද නො වූයේ ම වාක්සංස්කාර ද නො වේ, වාක්සංස්කාර නො වූයේ කායසංස්කාර නො වෙයි යත්: කායසංස්කාරය වාක්සංස්කාර නො වේ. කායසංස්කාර යි. වාක්සංස්කාර ද කායසංස්කාර ද තබා සෙස්ස වාක්සංස්කාර ද නො වූයේ ම කායසංස්කාර ද නො වේ.

23. කායසංස්කාර නො වූයේ චිත්තසංස්කාර නො වේ ද යත්: චිත්තසංස්කාරය කායසංස්කාර නො වෙයි, චිත්තසංස්කාර යි. කායසංස්කාර ද චිත්තසංස්කාර ද තබා සෙස්ස කායසංස්කාර ද නො වූයේ ම චිත්තසංස්කාර ද නො වේ. චිත්තසංස්කාර නො වූයේ කායසංස්කාර නො වේ ද යත්: කායසංස්කාරය චිත්තසංස්කාර නො වෙයි, කායසංස්කාර යි. චිත්තසංස්කාර ද කායසංස්කාර ද තබා සෙස්ස චිත්තසංස්කාර ද නො වූයේ ම කායසංස්කාර ද නො වේ.

24. න වචීසඞ්ඛාරො න චිත්තසඞ්ඛාරොති: චිත්තසඞ්ඛාරො න වචීසඞ්ඛාරො, චිත්තසඞ්ඛාරො. වචීසඞ්ඛාරඤ්ච චිත්තසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව වචීසඞ්ඛාරො, න ච චිත්තසඞ්ඛාරො. න චිත්තසඞ්ඛාරො න වචීසඞ්ඛාරොති: වචීසඞ්ඛාරො න චිත්තසඞ්ඛාරො, වචීසඞ්ඛාරො. චිත්තසඞ්ඛාරඤ්ච වචීසඞ්ඛාරඤ්ච ඨපෙත්වා අවසෙසා න චෙව චිත්තසඞ්ඛාරො, න ච වචීසඞ්ඛාරො. (පච්චනීකං)

සුද්ධසඞ්ඛාරවාරො.

පණ්ණත්තිනිද්දෙසවාරො නිට්ඨිතො.

24. වාක්සංස්කාර නො වූයේ චිත්තසංස්කාර නො වේ ද යත්: චිත්තසංස්කාරය වාක්සංස්කාර නො වේ, චිත්තසංස්කාර යි. වාක්-සංස්කාරය ද චිත්තසංස්කාරය ද තබා සෙස්ස වාක්සංස්කාර ද නො වූයේ ම චිත්තසංස්කාර ද නො වේ. චිත්තසංස්කාර නො වූයේ වාක්සංස්කාර නො වේ ද යත්: වාක්සංස්කාරය චිත්තසංස්කාර නො වේ, වාක්සංස්කාර යි. චිත්තසංස්කාරය ද වාක්සංස්කාරය ද තබා සෙස්ස චිත්තසංස්කාර ද නො වූයේ ම වාක්සංස්කාර ද නො වේ. (ප්‍රත්‍යනීක යි)

ශුද්ධසංස්කාරවාර යි.

ප්‍රඥප්තිනිර්දේශවාර යි.

## 3. පවත්ති උප්පාදවාරො

1. යස්ස කායසඞ්ඛාරො උප්පජ්ජති තස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජතීති: විනා විතක්කවිචාරෙහි අස්සාසපස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං කායසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං වචීසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං අස්සාසපස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං කායසඞ්ඛාරො ච උප්පජ්ජති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජති.

යස්ස වා පන වචීසඞ්ඛාරො උප්පජ්ජති තස්ස කායසඞ්ඛාරො උප්පජ්ජතීති: විනා අස්සාසපස්සාසෙහි විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං වචීසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං කායසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං අස්සාසපස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං වචීසඞ්ඛාරො ච උප්පජ්ජති, කායසඞ්ඛාරො ච උප්පජ්ජති.

2. යස්ස කායසඞ්ඛාරො උප්පජ්ජති තස්ස චිත්තසඞ්ඛාරො උප්පජ්ජතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො උප්පජ්ජති තස්ස කායසඞ්ඛාරො උප්පජ්ජතීති: විනා අස්සාසපස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං කායසඞ්ඛාරො උප්පජ්ජති. අස්සාසපස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජති, කායසඞ්ඛාරො ච උප්පජ්ජති.

3. යස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජති තස්ස චිත්තසඞ්ඛාරො උප්පජ්ජතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො උප්පජ්ජති තස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජතීති: විනා විතක්කවිචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං වචීසඞ්ඛාරො උප්පජ්ජති. විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජති. (අනුලොමපුග්ගලං)

4. යත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජතීති: දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානෙ කාමාවචරෙ තත්ථ කායසඞ්ඛාරො ච උප්පජ්ජති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජති.

යත්ථ වා පන වචීසඞ්ඛාරො උප්පජ්ජති තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජතීති: රූපාවචරෙ අරූපාවචරෙ තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානෙ කාමාවචරෙ තත්ථ වචීසඞ්ඛාරො ච උප්පජ්ජති, කායසඞ්ඛාරො ච උප්පජ්ජති.

## 3. ප්‍රවෘත්ති උත්පාදවාරය

1. යමකුට කායසංස්කාරය උපදී නම් ඔහුට වාක්සංස්කාරය උපදී ද යත්: විතර්කවිචාරයන්ගෙන් තොර වැ ආශ්වාසප්‍රශ්වාසයන් උපදනා කෙණෙහි ඔවුනට කායසංස්කාරය උපදී, ඔවුනට වාක්-සංස්කාරය නො ද උපදී. ප්‍රථමධ්‍යානයට සමවන්නවුනට ද ආශ්වාස ප්‍රශ්වාසයන් උපදනා කෙණෙහි කාමාවචරයනට දූ යි ඔවුනට කායසංස්කාරය ද උපදී, වාක්සංස්කාරය ද උපදී.

තවද යමකුට වාක්සංස්කාරය උපදී නම් ඔහුට කායසංස්කාරය උපදී ද යත්: ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වැ විතර්කවිචාරයන් උපදනා කෙණෙහි ඔවුනට වාක්සංස්කාරය උපදී, ඔවුනට කායසංස්-කාරය නො ද උපදී. ප්‍රථමධ්‍යානයට සමවන්නවුනට ද ආශ්වාස-ප්‍රශ්වාසයන් උපදනා කෙණෙහි කාමාවචරයනට දූ යි ඔවුනට වාක්සංස්කාරය ද උපදී, කායසංස්කාරය ද උපදී.

2. යමකුට කායසංස්කාරය උපදී නම් ඔහුට චිත්තසංස්කාරය උපදී ද යත්: එසේ යි.

තවද යමකුට චිත්තසංස්කාරය උපදී නම් ඔහුට කායසංස්කාරය උපදී ද යත්: ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වැ සිත උපදනා කෙණෙහි ඔවුනට චිත්තසංස්කාරය උපදී, ඔවුනට කායසංස්කාරය නො ද උපදී. ආශ්වාසප්‍රශ්වාසයන් උපදනා කෙණෙහි ඔවුනට චිත්තසංස්කාරය උපදී, කායසංස්කාරය ද උපදී.

3. යමකුට වාක්සංස්කාරය උපදී නම් ඔහුට චිත්තසංස්කාරය උපදී ද යත්: එසේ යි.

තවද යමකුට චිත්තසංස්කාරය උපදී නම් ඔහුට වාක්සංස්කාරය උපදී ද යත්: විතර්කවිචාරයන්ගෙන් තොර වැ සිත උපදනා කෙණෙහි ඔවුනට චිත්තසංස්කාරය උපදී, ඔවුනට වාක්සංස්කාරය නො ද උපදී. විතර්කවිචාරයන් උපදනා කෙණෙහි ඔවුනට චිත්ත-සංස්කාරය උපදී, වාක්සංස්කාරය ද උපදී. (අනුලොමපුද්ගල යි)

4. යම් තැනෙක කායසංස්කාරය උපදී නම් එහි වාක්සංස්-කාරය උපදී ද යත්: ද්විතීයධ්‍යානයෙහි ද තෘතීයධ්‍යානයෙහි දූයි එහි කායසංස්කාරය උපදී, එහි වාක්සංස්කාරය නො ද උපදී, එහි කාමාවචරභූමියෙහි වූ ප්‍රථමධ්‍යානයෙහි කායසංස්කාරය ද උපදී, වාක්සංස්කාරය ද උපදී.

තවද යම් තැනෙක වාක්සංස්කාරය උපදී නම් එහි කායසංස්-කාරය උපදී ද යත්: රූපාවචරයෙහි ද අරූපාවචරයෙහි දූයි එහි වාක්සංස්කාරය උපදී, එහි කායසංස්කාරය නො ද උපදී. එහි කාමාවචරභූමියෙහි වූ ප්‍රථමධ්‍යානයෙහි වාක්සංස්කාරය ද උපදී, කායසංස්කාරය ද උපදී.

5. යත්‍ථ කායසඞ්ඛාරො උප්පජ්ජති තත්‍ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජතීති: ආමන්තා.

යත්‍ථ වා පන චිත්තසඞ්ඛාරො උප්පජ්ජති තත්‍ථ කායසඞ්ඛාරො උප්පජ්ජතීති: චතුත්‍ථජ්ඣානෙ රූපාවචරෙ අරූපාවචරෙ තත්‍ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තත්‍ථ කායසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානෙ දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ කාමාවචරෙ තත්‍ථ චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජති, කායසඞ්ඛාරො ච උප්පජ්ජති.

6. යත්‍ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති තත්‍ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජතීති: ආමන්තා.

යත්‍ථ වා පන චිත්තසඞ්ඛාරො උප්පජ්ජති තත්‍ථ වචීසඞ්ඛාරො උප්පජ්ජතීති: දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ චතුත්‍ථජ්ඣානෙ තත්‍ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තත්‍ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානෙ කාමාවචරෙ රූපාවචරෙ අරූපාවචරෙ තත්‍ථ චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජති. (අනුලොම ඔකාස)

7–9. යස්ස යත්‍ථ කායසඞ්ඛාරො උප්පජ්ජති -පෙ- අනුලොමපුග්ගලොකාස

(යස්සකම්පි යස්සයත්‍ථකම්පි සදිසං)

10. යස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස වචීසඞ්ඛාරො නුප්පජ්ජතීති: විනා අස්සාසපස්සාසෙහි විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං කායසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තෙසං වචීසඞ්ඛාරො නුප්පජ්ජති. සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ විනා අස්සාසපස්සාසෙහි අවිතක්කඅවිචාරචිත්තස්ස උප්පාදක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං කායසඞ්ඛාරො ච නුප්පජ්ජති, වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යස්ස වා පන වචීසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජතීති: විනා විතක්කවිචාරෙහි අස්සාසපස්සාසානං උප්පාදක්ඛණෙ තෙසං වචීසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තෙසං කායසඞ්ඛාරො නුප්පජ්ජති. සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ විනා අස්සාසපස්සාසෙහි අවිතක්කඅවිචාරචිත්තස්ස උප්පාදක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති, කායසඞ්ඛාරො ච නුප්පජ්ජති.

5. යම් තැනෙක කායසංස්කාරය උපදී නම් එහි චිත්තසංස්කාරය උපදී ද යත්: එසේ යි.

තවද යම් තැනෙක චිත්තසංස්කාරය උපදී නම් එහි කායසංස්කාරය උපදී ද යත්: චතුර්ථධ්‍යානයෙහි රූපාවචරයෙහි අරූපාවචරයෙහි දූයි එහි චිත්තසංස්කාරය උපදී, එහි කායසංස්කාරය නො ද උපදී. ප්‍රථමධ්‍යානයෙහි ද්විතීයධ්‍යානයෙහි තෘතීයධ්‍යානයෙහි කාමාවචරභූමියෙහි දූයි එහි චිත්තසංස්කාරය ද උපදී, කායසංස්කාරය ද උපදී.

6. යම් තැනෙක වාක්සංස්කාරය උපදී නම් එහි චිත්තසංස්කාරය උපදී ද යත්: එසේ යි.

තවද යම් තැනෙක චිත්තසංස්කාරය උපදී නම් එහි වාක්සංස්කාරය උපදී ද යත්: ද්විතීයධ්‍යානයෙහි ද තෘතීයධ්‍යානයෙහි ද චතුර්ථධ්‍යානයෙහි දූයි එහි චිත්තසංස්කාරය උපදී, එහි වාක්සංස්කාරය නො ද උපදී. ප්‍රථමධ්‍යානයෙහි ද කාමාවචරයෙහි ද රූපාවචරයෙහි ද අරූපාවචරයෙහි දූයි එහි චිත්තසංස්කාරය ද උපදී, වාක්සංස්කාරය ද උපදී. (අනුලොමාවකාශ යි)

7--9. යමකුට යම් තැනෙක කායසංස්කාරය උපදී නම්... (අනුලොමපුද්ගලාවකාශ යි)

(යස්සකය ද යස්සයත්ථකය ද සමාන යි.)

10. යමකුට කායසංස්කාරය නූපදී නම් ඔහුට වාක්සංස්කාරය නූපදී ද යත්: ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වැ විතර්කවිචාරයන් උපදනා කෙණෙහි ඔවුනට කායසංස්කාරය නූපදී, ඔවුනට වාක්සංස්කාරය නො ද උපදී. සියල්ලනට චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ද ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වැ අවිතර්කඅවිචාරචිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ද නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්ත්වයනට දූයි ඔවුනට කායසංස්කාරය ද නූපදී, වාක්සංස්කාරය ද නූපදී.

තවද යමකුට වාක්සංස්කාරය නූපදී නම් ඔහුට කායසංස්කාරය නූපදී ද යත්: විතර්කවිචාරයන්ගෙන් තොර වැ ආශ්වාසප්‍රශ්වාසයන් උපදනා කෙණෙහි ඔවුනට වාක්සංස්කාරය නූපදී, ඔවුනට කායසංස්කාරය නො ද නූපදී. සියල්ලනට චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ද ආශ්වාසප්‍රශ්වායයන්ගෙන් තොර වැ අවිතර්කඅවිචාර චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ද නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්ත්වයනට දූයි ඔවුනට වාක්සංස්කාරය ද නූපදී, කායසංස්කාරය ද නූපදී.

11. යස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස චිත්තසඞ්ඛාරො නුප්පජ්ජතීති: විනා අස්සාසපස්සාසෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං කායසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තෙසං චිත්තසඞ්ඛාරො නුප්පජ්ජති, සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං කායසඞ්ඛාරො ච නුප්පජ්ජති, චිත්තසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජතීති: ආමන්තා.

12. යස්ස වචීසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස චිත්තසඞ්ඛාරො නුප්පජ්ජතීති: විනා විතක්කවිචාරෙහි චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං වචීසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තෙසං චිත්තසඞ්ඛාරො නුප්පජ්ජති. සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති, චිත්තසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස වචීසඞ්ඛාරො නුප්පජ්ජතීති: ආමන්තා. (පච්චනීකපුග්ගල)

13. යත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජති තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජතීති: රූපාවචරෙ අරූපාවචරෙ තත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජති. චතුත්ථජ්ඣානෙ අසඤ්ඤසත්තෙ තත්ථ කායසඞ්ඛාරො ච නුප්පජ්ජති, වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යත්ථ වා පන වචීසඞ්ඛාරො නුප්පජ්ජති තත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජතීති: දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජති. චතුත්ථජ්ඣානෙ අසඤ්ඤසත්තෙ තත්ථ වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති, කායසඞ්ඛාරො ච නුප්පජ්ජති.

14. යත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජති තත්ථ චිත්තසඞ්ඛාරො නුප්පජ්ජතීති: චතුත්ථජ්ඣානෙ, රූපාවචරෙ අරූපාවචරෙ තත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තත්ථ චිත්තසඞ්ඛාරො නුප්පජ්ජති. අසඤ්ඤසත්තෙ තත්ථ කායසඞ්ඛාරො ච නුප්පජ්ජති, චිත්තසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යත්ථ වා පන -පෙ- ආමන්තා.

15. යත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජති තත්ථ චිත්තසඞ්ඛාරො නුප්පජ්ජතීති: දුතියජ්ඣානෙ තතියජ්ඣානෙ චතුත්ථජ්ඣානෙ තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තත්ථ චිත්තසඞ්ඛාරො නුප්පජ්ජති. අසඤ්ඤසත්තෙ තත්ථ වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති, චිත්තසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යත්ථ වා පන -පෙ- ආමන්තා. (පච්චනීකඔකාස)

11. යමකුට කායසංස්කාරය නූපදී නම් ඔහුට චිත්තසංස්කාරය නූපදී ද යත්: ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වූ චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට කායසංස්කාරය නූපදී, ඔවුනට චිත්තසංස්කාරය නො ද නූපදී. සියල්ලනට චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ද නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට කායසංස්කාරය ද නූපදී, චිත්තසංස්කාරය ද නූපදී.

තවද යමකුට චිත්තසංස්කාරය නූපදී නම් ඔහුට කායසංස්කාරය නූපදී ද යත්: එසේ යි.

12, යමකුට වාක්සංස්කාරය නූපදී නම් ඔහුට චිත්තසංස්කාරය නූපදී ද යත්: විතර්කවිචාරයන්ගෙන් තොර වූ චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට වාක්සංස්කාරය නූපදී, ඔවුනට චිත්තසංස්කාරය නො ද නූපදී. සියල්ලනට චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ද නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට වාක්සංස්කාරය ද නූපදී, චිත්තසංස්කාරය ද නූපදී.

තවද යමකුට චිත්තසංස්කාරය නූපදී නම් ඔහුට වාක්සංස්කාරය නූපදී ද යත්: එසේ යි. (ප්‍රත්‍යනීකපුද්ගල යි)

13. යම් තැනෙක කායසංස්කාරය නූපදී නම් එහි වාක්සංස්කාරය නූපදී ද යත්: රූපාවචරයෙහි ද අරූපාවචරයෙහි දූයි එහි කායසංස්කාරය නූපදී, එහි වාක්සංස්කාරය නො ද නූපදී. චතුර්ථධ්‍යානයෙහි ද අසංඥසත්‍වයෙහි දූයි එහි කායසංස්කාරය ද නූපදී, වාක්සංස්කාරය ද නූපදී.

තවද යම් තැනෙක වාක්සංස්කාරය නූපදී නම් එහි කායසංස්කාරය නූපදී ද යත්: ද්විතීයධ්‍යානයෙහි ද තෘතීයධ්‍යානයෙහි දූයි එහි වාක්සංස්කාරය නූපදී, එහි කායසංස්කාරය නො ද නූපදී. චතුර්ථධ්‍යානයෙහි ද අසංඥසත්‍වයෙහි දූයි එහි වාක්සංස්කාරය ද නූපදී, කායසංස්කාරය ද නූපදී.

14. යම් තැනෙක කායසංස්කාරය නූපදී නම් එහි චිත්තසංස්කාරය නූපදී ද යත්: චතුර්ථධ්‍යානයෙහි ද රූපාවචරයෙහි ද අරූපාවචරයෙහි දූයි එහි කායසංස්කාරය නූපදී, එහි චිත්තසංස්කාරය නො ද නූපදී. අසංඥසත්ත්ව වූ එහි කායසංස්කාරය ද නූපදී, චිත්තසංස්කාරය ද නූපදී.

තවද යම් තැනෙක ... එසේ යි.

15. යම් තැනෙක වාක්සංස්කාරය නූපදී නම් එහි චිත්තසංස්කාරය නූපදී ද යත්: ද්විතීයධ්‍යානයෙහි ද තෘතීයධ්‍යානයෙහි ද චතුර්ථධ්‍යානයෙහි දූයි එහි වාක්සංස්කාරය නූපදී, එහි චිත්තසංස්කාරය නො ද නූපදී. අසංඥසත්ත්ව වූ එහි වාක්සංස්කාරය ද නූපදී, චිත්තසංස්කාරය ද නූපදී.

තවද යම් තැනෙක ... එසේ යි. (ප්‍රත්‍යනීකාවකාශ යි)

16–18. යස්ස යත්‍ථ කායසඞ්ඛාරො න උප්පජ්ජති තස්ස තත්‍ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජතීති: විනා අස්සාසපස්සාසෙහි විතක්කවිචාරානං උප්පාදක්ඛණෙ තෙසං තත්‍ථ කායසඞ්ඛාරො නුප්පජ්ජති, නො ච තෙසං තත්‍ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජති. සබ්බෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ විනා අස්සාසපස්සාසෙහි අවිතක්කඅවිචාරචිත්තස්ස උප්පාදක්ඛණෙ අසඤ්ඤසත්තානං තෙසං තත්‍ථ කායසඞ්ඛාරො ච නුප්පජ්ජති, වචීසඞ්ඛාරො ච නුප්පජ්ජති.

යස්ස වා පන යත්‍ථ -පෙ- ආමන්තා. (පච්චනීකපුග්ගලොකාස)

(යස්සකම්පි යස්සයත්‍ථකම්පි සදිසං විත්‍ථාරෙතබ්බං. යස්සයත්‍ථකෙ නිරොධසමාපන්නානන්ති න ලබ්භති.)

පච්චුප්පන්නවාරො.

19. යස්ස කායසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථ තස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථාති: ආමන්තා.

යස්ස වා පන වචීසඞ්ඛාරො -පෙ- ආමන්තා.

20. යස්ස කායසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථ තස්ස චිත්තසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථාති: ආමන්තා.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො -පෙ- ආමන්තා.

21. යස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථ තස්ස චිත්තසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථාති: ආමන්තා,

යස්ස වා පන -පෙ- ආමන්තා. (අනුලොමපුග්ගල)

22—24. යත්‍ථ කායසඞ්ඛාරො උප්පජ්ජිත්‍ථ -පෙ- (අනුලොමඔකාස)

(යත්‍ථකම්පි සබ්බත්‍ථ එකසදිසං)

16—18. යමකුට යම් තැනෙක කායසංස්කාරය නූපදී නම් ඔහුට එහි වාක්සංස්කාරය නූපදී ද යත්: ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වැ විතර්කවිචාරයන් උපදනා කෙණෙහි ඔවුනට එහි කාය-සංස්කාරය නූපදී, ඔවුනට එහි වාක්සංස්කාරය නො ද නූපදී. සියල්ලනට චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ද ආශ්වාසප්‍රශ්වාසයන්ගෙන් තොර වැ අවිතර්කඅවිචාරචිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ද අසංඥ-සත්‍වයනට දූයි ඔවුනට එහි කායසංස්කාරය ද නූපදී, වාක්සංස්-කාරය ද නූපදී.

තවද යමකුට යම් තැනෙක ... එසේ යි. (ප්‍රත්‍යනීකපුද්-ගලාවකාශයි)

(යස්සකය ද යස්සයත්ථකය ද සමාන වැ විස්තර කළ යුතු යි. යස්සයත්ථකයෙහි නිරොධසමාපන්නානං යනු නො ලැබේ.)

ප්‍රත්‍යුත්පන්නවාර යි.

19. යමකුට කායසංස්කාරය උපන්නේ නම් ඔහුට වාක් සංස්කාරය උපන්නේ ද යත්: එසේ යි.

තවද යමකුට වාක්සංස්කාරය ... එසේ යි.

20. යමකුට කායසංස්කාරය උපන්නේ නම් ඔහුට චිත්ත සංස්කාරය උපන්නේ ද යත්: එසේ යි.

තවද යමකුට චිත්තසංස්කාරය ... එසේ යි,

21. යමකුට වාක්සංස්කාරය උපන්නේ නම් ඔහුට චිත්ත සංස්කාරය උපන්නේ ද යත්: එසේ යි.

තවද යමකුට ... එසේ යි. (අනුලොමපුද්ගල යි)

22—24. යම් තැනෙක කායසංස්කාරය උපන්නේ නම් ... (අනුලොමාවකාශ යි)

(යත්ථකය ද හැමතන්හි එකසමාන යි.)

25. යස්ස යත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති තස්ස තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජතීති; දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානං සමාපන්නානං, කාමාවචරානං තෙසං තත්ථ කායසඞ්ඛාරො ච උප්පජ්ජති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජති.

යස්ස වා පන යත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති තස්ස තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජතීති: රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං තෙසං තත්ථ වචීසඞ්ඛාරො ච උප්පජ්ජති, කායසඞ්ඛාරො ච උප්පජ්ජති.

26. යස්ස යත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති තස්ස තත්ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජතීති: ආමන්තා.

යස්ස වා පන යත්ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජති තස්ස තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජතීති: චතුත්ථජ්ඣානං සමාපන්නානං රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං තත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානං දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං කාමාවචරානං තෙසං තත්ථ චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජති, කායසඞ්ඛාරො ච උප්පජ්ජති.

27. යස්ස යත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති තස්ස තත්ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජතීති: ආමන්තා.

යස්ස වා පන යත්ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජති තස්ස තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජතීති: දුතියජ්ඣානං තතියජ්ඣානං චතුත්ථජ්ඣානං සමාපන්නානං, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ චිත්තසඞ්ඛාරො උප්පජ්ජති, නො ච තෙසං තත්ථ වචීසඞ්ඛාරො උප්පජ්ජති. පඨමජ්ඣානං සමාපන්නානං කාමාවචරානං ඉතරෙසං රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජති. (අනුලොමපුග්ගලොකාස)

28. යස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස වචීසඞ්ඛාරො නුප්පජ්ජතීති: නත්ථි.

යස්ස වා පන වචීසඞ්ඛාරො නුප්පජ්ජති තස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජතීති: නත්ථි.

25. යමකුට යම් තැනෙක කායසංස්කාරය උපන්නේ නම් ඔහුට එහි වාක්සංස්කාරය උපන්නේ ද යත්: ද්විතීයධ්‍යානයට ද තෘතීයධ්‍යානයට ද සමවන් ඔවුනට එහි කායසංස්කාරය උපන්නේය. ඔවුනට එහි වාක්සංස්කාරය නො ද උපන්නේ ය. ප්‍රථමධ්‍යානයට සමවන්නවුනට ද කාමාවචරයනට දූයි ඔවුනට එහි කායසංස්කාරය ද උපන්නේ ය, වාක්සංස්කාරය ද උපන්නේ යි.

තවද යමකුට යම් තැනෙක වාක්සංස්කාරය උපන්නේ නම් ඔහුට එහි කායසංස්කාරය උපන්නේ ද යත්: රූපාවචරයනට ද අරූපාවචරයනට දූයි ඔවුනට එහි වාක්සංස්කාරය උපන්නේ ය. ඔවුනට එහි කායසංස්කාරය නො ද උපන්නේ ය. ප්‍රථමධ්‍යානයට සමවන්නවුනට ද කාමාවචරයනට දූයි ඔවුනට එහි වාක්සංස්කාරය ද උපන්නේ ය, කායසංස්කාරය ද උපන්නේ යි.

26. යමකුට යම් තැනෙක කායසංස්කාරය උපන්නේ නම් ඔහුට එහි චිත්තසංස්කාරය උපන්නේ ද යත්: එසේ යි.

තවද යමකුට යම් තැනෙක චිත්තසංස්කාරය උපන්නේ නම් ඔහුට එහි කායසංස්කාරය උපන්නේ ද යත්: චතුර්ථධ්‍යානයට සමවන්නවුනට ද රූපාවචරයනට ද අරූපාවචරයනට දූයි ඔවුනට එහි චිත්තසංස්කාරය උපන්නේ ය. ඔවුනට එහි කායසංස්කාරය නො ද උපන්නේ ය. ප්‍රථමධ්‍යානයට ද්විතීයධ්‍යානයට තෘතීය-ධ්‍යානයට සමවන්නවුනට ද කාමාවචරයනට දූයි ඔවුනට එහි චිත්තසංස්කාරය ද උපන්නේ ය, කායසංස්කාරය ද උපන්නේ යි.

27. යමකුට යම් තැනෙක වාක්සංස්කාරය උපන්නේ නම් ඔහුට එහි චිත්තසංස්කාරය උපන්නේ ද යත්: එසේ යි.

තවද යමකුට යම් තැනෙක චිත්තසංස්කාරය උපන්නේ නම් ඔහුට එහි වාක්සංස්කාරය උපන්නේ ද යත්: ද්විතීයධ්‍යානයට තෘතීයධ්‍යානයට චතුර්ථධ්‍යානයට සමවන්නවුනට ද ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හි දූයි ඔවුනට එහි චිත්තසංස්කාරය උපන්නේ ය, ඔවුනට එහි වාක්සංස්කාරය නො ද උපන්නේ ය. ප්‍රථමධ්‍යානයට සමවන්නවුනට ද කාමාවචරයනට ද සෙසු රූපාව-චරයනට ද අරූපාවචරයනට දූයි ඔවුනට එහි චිත්තසංස්කාරය ද උපන්නේ ය, වාක්සංස්කාරය ද උපන්නේ යි. (අනුලොමපුද්ගලාව-කාශ යි)

28. යමකුට කායසංස්කාරය නූපන්නේ නම් ඔහුට වාක්සංස්-කාරය නූපන්නේ ද යත්: නැති.

තවද යමකුට වාක්සංස්කාරය නූපන්නේ නම් ඔහුට කායසංස්-කාරය නූපන්නේ ද යත්: නැති.

29. යස්ස කායසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ තස්ස චිත්තසඞ්ඛාරො නුප්පජ්ජිත්ථාති: නත්ථි.

යස්ස වා පන -පෙ- නත්ථි.

30. යස්ස වචීසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ තස්ස චිත්තසඞ්ඛාරො නුප්පජ්ජිත්ථාති: නත්ථි.

යස්ස වා පන -පෙ- නත්ථි. (පච්චනීකපුග්ගල)

31—33. යත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ -පෙ- (පච්චනීකඔකාස)

34. යස්ස යත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ තස්ස තත්ථ වචී-සඞ්ඛාරො නුප්පජ්ජිත්ථාති: රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ, නො ච තෙසං තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ. චතුත්ථජ්ඣානං සමාපන්නානං, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කායසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ වචීසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ.

යස්ස වා පන යත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ තස්ස තත්ථ කාය-සඞ්ඛාරො නුප්පජ්ජිත්ථාති: දුතියජ්ඣානං තතියජ්ඣානං සමාපන්නානං තෙසං තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ, නො ච තෙසං තත්ථ කාය-සඞ්ඛාරො නුප්පජ්ජිත්ථ. චතුත්ථජ්ඣානං සමාපන්නානං සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ වචීසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ, කායසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ.

35. යස්ස යත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ තස්ස තත්ථ චිත්ත සඞ්ඛාරො නුප්පජ්ජිත්ථාති: චතුත්ථජ්ඣානං සමාපන්නානං රූපාවචරානං අරූපාවචරානං තෙසං තත්ථ කායසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ. නො ච තෙසං තත්ථ චිත්තසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ. සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කායසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ, චිත්ත-සඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ.

යස්ස වා පන යත්ථ -පෙ- ආමන්තා.

36. යස්ස යත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ තස්ස තත්ථ චිත්ත-සඞ්ඛාරො නුප්පජ්ජිත්ථාති: දුතියජ්ඣානං, තතියජ්ඣානං, චතුත්ථජ්ඣානං සමාපන්නානං, සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ වචීසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ, නො ච තෙසං තත්ථ චිත්තසඞ්ඛාරො නුප්පජ්ජිත්ථ. සුද්ධාවාසං උපපජ්ජන්තානං අසඤ්ඤසත්තානං තෙසං තත්ථ වචීසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ, චිත්තසඞ්ඛාරො ච නුප්පජ්ජිත්ථ.

යස්ස වා පන යත්ථ -පෙ- ආමන්තා. (පච්චනීකපුග්ගලොකාස)

අතීතවාරො.

29. යමකුට කායසංස්කාරය නූපන්නේ නම් ඔහුට චිත්තසංස්කාරය නූපන්නේ ද යත්: නැති.

තවද යමකුට ... නැති.

30. යමකුට වාක්සංස්කාරය නූපන්නේ නම් ඔහුට චිත්තසංස්කාරය නූපන්නේ ද යත්: නැති.

තවද යමකුට ... නැති. (ප්‍රත්‍යනීකපුද්ගල යි)

31—33. යම් තැනෙක කායසංස්කාරය නූපන්නේ නම් ... (ප්‍රත්‍යනීකාවකාශ යි)

34. යමකුට යම් තැනෙක කායසංස්කාරය නූපන්නේ නම් ඔහුට එහි වාක්සංස්කාරය නූපන්නේ ද යත්: රූපාවචරයනට ද අරූපාවචරයනට දැයි ඔවුනට එහි කායසංස්කාරය නූපන්නේ ය. ඔවුනට එහි වාක්සංස්කාරය නො ද නූපන්නේ ය. චතුර්ථධ්‍යානයට සමවන්නවුනට ද ශුද්ධාවාසයනට දෙවැනි සිත පවත්නා කල්හි ද අසංඥසත්ත්‍වයනට දැයි ඔවුනට එහි කායසංස්කාරය ද නූපන්නේ ය, වාක්සංස්කාරය ද නූපන්නේ යි.

තවද යමකුට යම් තැනෙක වාක්සංස්කාරය නූපන්නේ නම් ඔහුට එහි කායසංස්කාරය නූපන්නේ ද යත්: ද්විතීයධ්‍යානයට තෘතීයධ්‍යානයට සමවන් ඔවුනට එහි වාක්සංස්කාරය නූපන්නේ ය, ඔවුනට එහි කායසංස්කාරය නො ද නූපන්නේ ය. චතුර්ථධ්‍යානයට සමවන්නවුනට ද ශුද්ධාවාසයනට දෙවැනි සිත පවත්නා කල්හි ද අසංඥසත්ත්‍වයනට දැයි ඔවුනට එහි වාක්සංස්කාරය ද නූපන්නේ ය, කායසංස්කාරය ද නූපන්නේ යි.

35. යමකුට යම් තැනෙක කායසංස්කාරය නූපන්නේ නම් ඔහුට එහි චිත්තසංස්කාරය නූපන්නේ ද යත්: චතුර්ථධ්‍යානයට සමවන්නවුනට ද රූපාවචරයනට ද අරූපාවචරයනට දැයි ඔවුනට එහි කායසංස්කාරය නූපන්නේ ය, ඔවුනට එහි චිත්තසංස්කාරය නො ද නූපන්නේ ය. ශුද්ධාවාසයෙහි උපදනවුනට ද අසංඥසත්ත්‍වයනට දැයි ඔවුනට එහි කායසංස්කාරය ද නූපන්නේ ය, චිත්තසංස්කාරය ද නූපන්නේ යි.

තවද යමකුට යම් තැනෙක ... එසේ යි.

36. යමකුට යම් තැනෙක වාක්සංස්කාරය නූපන්නේ නම් ඔහුට එහි චිත්තසංස්කාරය නූපන්නේ ද යත්: ද්විතීයධ්‍යානයට තෘතීයධ්‍යානයට චතුර්ථධ්‍යානයට සමවන්නවුනට ද ශුද්ධාවාසයනට දෙවැනි සිත පවත්නා කල්හි දැයි ඔවුනට එහි වාක්සංස්කාරය නූපන්නේ ය, ඔවුනට එහි චිත්තසංස්කාරය නො ද නූපන්නේ ය. ශුද්ධාවාසයෙහි උපදනවුනට ද අසංඥසත්ත්‍වයනට දැයි ඔවුනට එහි වාක්සංස්කාරය ද නූපන්නේ ය, චිත්තසංස්කාරය ද නූපන්නේ යි.

තවද යමකුට යම් තැනෙක ... එසේ යි. (ප්‍රත්‍යනීකපුද්ගලාවකාශයි)

**අතීතවාර යි.**

37. යස්ස කායසඞ්ඛාරො උප්පජ්ජිස්සති තස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජිස්සතීති: ආමන්තා.

යස්ස වා පන වචීසඞ්ඛාරො උප්පජ්ජිස්සති තස්ස කායසඞ්ඛාරො උප්පජ්ජිස්සතීති: යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං වචීසඞ්ඛාරො උප්පජ්ජිස්සති, නො ච තෙසං කායසඞ්ඛාරො උප්පජ්ජිස්සති. ඉතරෙසං තෙසං වචීසඞ්ඛාරො ච උප්පජ්ජිස්සති, කායසඞ්ඛාරො ච උප්පජ්ජිස්සති.

38. යස්ස කායසඞ්ඛාරො උප්පජ්ජිස්සති තස්ස චිත්තසඞ්ඛාරො උප්පජ්ජිස්සතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො උප්පජ්ජිස්සති තස්ස කායසඞ්ඛාරො උප්පජ්ජිස්සතීති: යස්ස චිත්තස්ස අනන්තරා කාමාවචරානං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති, රූපාවචරෙ අරූපාවචරෙ පච්ඡිමභවිකානං, යෙ ච රූපාවචරං අරූපාවචරං උප්පජ්ජිත්වා පරිනිබ්බායිස්සන්ති තෙසං චවන්තානං තෙසං චිත්තසඞ්ඛාරො උප්පජ්ජිස්සති, නො ච තෙසං කායසඞ්ඛාරො උප්පජ්ජිස්සති. ඉතරෙසං තෙසං චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජිස්සති, කායසඞ්ඛාරො ච උප්පජ්ජිස්සති.

39. යස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජිස්සති තස්ස චිත්තසඞ්ඛාරො උප්පජ්ජිස්සතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තසඞ්ඛාරො උප්පජ්ජිස්සති තස්ස වචීසඞ්ඛාරො උප්පජ්ජිස්සතීති: යස්ස චිත්තස්ස අනන්තරා අවිතක්කඅවිචාරං පච්ඡිමචිත්තං උප්පජ්ජිස්සති තෙසං චිත්තසඞ්ඛාරො උප්පජ්ජිස්සති, නො ච තෙසං වචීසඞ්ඛාරො උප්පජ්ජිස්සති. ඉතරෙසං තෙසං චිත්තසඞ්ඛාරො ච උප්පජ්ජිස්සති, වචීසඞ්ඛාරො ච උප්පජ්ජිස්සති. (අනුලොමපුග්ගල)

40–42. යත්ථ කායසඞ්ඛාරො උප්පජ්ජිස්සති –පෙ– (අනුලොමඔකාස)

37. යමකුට කායසංස්කාරය උපදින්නේ නම් ඔහුට වාක්සංස්කාරය උපදින්නේ ද යත්: එසේ යි.

තවද යමකුට වාක්සංස්කාරය උපදින්නේ නම් ඔහුට කායසංස්කාරය උපදින්නේ ද යත්: යම් සිතකට අනතුරු වැ කාමාවචරයනට පශ්චිමචිත්තය උපදින්නේ ද රූපාවචරයෙහි හා අරූපාවචරයෙහි පශ්චිමභවිකයනට ද යම් ද කෙනෙක් රූපාවචරයෙහි ද අරූපාවචරයෙහි ද ඉපිද පිරිනිවෙන්නාහු නම් ඒ ච්‍යුත වන්නවුනට දැයි ඔවුනට වාක්සංස්කාරය උපදින්නේ ය, ඔවුනට කායසංස්කාරය නො ද උපදින්නේ ය. සෙසු ඔවුනට වාක්සංස්කාරය ද උපදින්නේ ය, කායසංස්කාරය ද උපදින්නේ යි.

38. යමකුට කායසංස්කාරය උපදින්නේ නම් ඔහුට චිත්තසංස්කාරය උපදින්නේ ද යත්: එසේ යි.

තවද යමකුට චිත්තසංස්කාරය උපදින්නේ නම් ඔහුට කායසංස්කාරය උපදින්නේ ද යත්: යම් සිතකට අනතුරු වැ කාමාවචරයනට පශ්චිමචිත්තය උපදින්නේ ද රූපාවචරයෙහි හා අරූපාවචරයෙහි පශ්චිමභවිකයනට ද යම් ද කෙනෙක් රූපාවචරයෙහි හා අරූපාවචරයෙහි ඉපිද පිරිනිවෙන්නාහු නම් ඒ ච්‍යුත වන්නවුනට දැයි ඔවුනට චිත්තසංස්කාරය උපදින්නේ ය, ඔවුනට කායසංස්කාරය නො ද උපදින්නේ ය. සෙසු ඔවුනට චිත්තසංස්කාරය ද උපදින්නේ ය, කායසංස්කාරය ද උපදින්නේ යි.

39. යමකුට වාක්සංස්කාරය උපදින්නේ නම් ඔහුට චිත්තසංස්කාරය උපදින්නේ ද යත්: එසේ යි.

යතො වා පන අවිජ්ජානුසයං පරිජානාති තතො විචිකිච්ඡානුසයං පරිජානාතීති: ආමන්තා.

57. යතො භවරාගානුසයං පරිජානාති තතො අවිජ්ජානුසයං පරිජානාතීති: ආමන්තා.

යතො වා පන අවිජ්ජානුසයං පරිජානාති තතො භවරාගානුසයං පරිජානාතීති: කාමධාතුයා තීසු වෙදනාසු තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච තතො භවරාගානුසයං පරිජානාති, රූපධාතුයා අරූපධාතුයා තතො අවිජ්ජානුසයඤ්ච පරිජානාති, භවරාගානුසයඤ්ච පරිජානාති. (එකකමූලකං)

58. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති තතො මානානුසයං පරිජානාතීති: නත්ථි.

51. යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: දුඃඛවෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, එහි මානානුසය නො ද පිරිසිඳ දනී, කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි අවිජ්ජානුසය ද පිරිසිඳ දනී, මානානුසය ද පිරිසිඳ දනී.

52–54. යම් තැනෙක දිට්ඨානුසය පිරිසිඳ දනී නම් එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් එහි දිට්ඨානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

55. යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, එහි භවරාගානුසය නො ද පිරිසිඳ දනී, රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, භවරාගානුසය ද පිරිසිඳ දනී.

තව ද යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

56. යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

57. යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: කාමධාතුයෙහි තෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, එහි භවරාගානුසය නො ද පිරිසිඳ දනී, රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි අවිජ්ජානුසය ද පිරිසිඳ දනී, භවරාගානුසය ද පිරිසිඳ දනී. (එකකමූලක යි)

58. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

යතො වා පන මානානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො මානානුසයං පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො මානානුසයඤ්ච කාමරාගානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති.

59-60. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති තතො දිට්ඨානුසයං -පෙ- විචිකිච්ඡානුසයං පරිජානාතීති: නත්ථි.

යතො වා පන විචිකිච්ඡානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො විචිකිච්ඡානුසයං පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො විචිකිච්ඡානුසයඤ්ච කාමරාගානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති, දුක්ඛාය වෙදනාය තතො විචිකිච්ඡානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයං පරිජානාති.

61. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති තතො භවරාගානුසයං පරිජානාතීති: නත්ථි.

යතො වා පන භවරාගානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: නො.

62. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්ථි.

යතො වා පන අවිජ්ජානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො අවිජ්ජානුසයඤ්ච කාමරාගානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති, දුක්ඛාය වෙදනාය තතො අවිජ්ජානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයං පරිජානාති. (දුකමූලකං)

තවද යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතු-යෙහි ද අරූපධාතුයෙහි ද යි එහි මානානුසය පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී, කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි මානානුසය ද කාමරාගානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී.

59-60. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතු-යෙහි ද අරූපධාතුයෙහි ද යි එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී, කාම-ධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය ද කාමරාගානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී, දුඃඛවෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය නො ද පිරිසිඳ දනී.

61. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: නැති.

62. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී, කාමධාතු-යෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද කාමරාගානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී, දුඃඛවෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී. එහි කාමරාගානුසය නො ද පිරිසිඳ දනී. (දුකමූලක යි.)

63–64. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති තතො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං පරිජානාතීති: නත්‍ථි.

යතො වා පන විචිකිච්ඡානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො විචිකිච්ඡානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො විචිකිච්ඡානුසයඤ්ච කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති, දුක්ඛාය වෙදනාය තතො විචිකිච්ඡානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති.

65. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති තතො භවරාගානුසයං පරිජානාතීති: නත්‍ථි.

යතො වා පන භවරාගානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො භවරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති.

66. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්‍ථි.

යතො වා පන අවිජ්ජානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති. කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො අවිජ්ජානුසයඤ්ච කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති. දුක්ඛාය වෙදනාය තතො අවිජ්ජානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති. (තිකමූලකං)

67–69. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති තතො විචිකිච්ඡානුසයං පරිජානාතීති: නත්‍ථි.

63-64. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී නම් එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි විචිකිච්ඡානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී. කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය ද කාමරාගානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී. දුඃඛවෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී.

65. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී නම් එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි භවරාගානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී.

66. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි අවිජ්ජානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී, කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද කාමරාගානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී. දුඃඛවෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී. **( තිකමූලක යි. )**

67-69. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී නම් එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

යතො වා පන විචිකිච්ඡානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො විචිකිච්ඡානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති. කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො විචිකිච්ඡානුසයඤ්ච කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති. දුක්ඛාය වෙදනාය තතො විචිකිච්ඡානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති. -පෙ- (චතුක්කමූලකං)

70. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති තතො භවරාගානුසයං පරිජානාතීති: නත්ථි.

යතො වා පන භවරාගානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො භවරාගානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති.

71. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්ථි.

යතො වා පන අවිජ්ජානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො අවිජ්ජානුසයඤ්ච කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයං පරිජානාති. දුක්ඛාය වෙදනාය තතො අවිජ්ජානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති. (පඤ්චකමූලකං)

72. යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්ථි.

තව ද යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි විචිකිච්ඡානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී. කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය ද කාමරාගානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී. දුඃඛවෙදනා ඇති කල්හි එහි විචිකිච්ඡානුසය ද පටිඝානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී ... (චතුක්කමූලක යි.)

70. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී නම් එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි භවරාගානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී.

71. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි දූ යි එහි අවිජ්ජානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී. කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද කාමරාගානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී. දුඃඛවෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද පටිඝානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී. (පඤ්චකමූලක යි.)

72. යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද පිරිසිඳ දනී නම් එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

යතො වා පන අවිජ්ජානුසයං පරිජානාති තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාතීති: රූපධාතුයා අරූපධාතුයා තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති. කාමධාතුයා ද්වීසු වෙදනාසු තතො අවිජ්ජානුසයඤ්ච කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, නො ච තතො පටිඝානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති. දුක්ඛාය වෙදනාය තතො අවිජ්ජානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, නො ච තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති. (ඡක්කමූලකං)

## අනුලොමඔකාසං.

73. යො යතො කාමරාගානුසයං පරිජානාති සො තතො පටිඝානුසයං පරිජානාතීති: නො.

යො වා පන යතො පටිඝානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයං පරිජානාතීති: නො.

74. යො යතො කාමරාගානුසයං පරිජානාති සො තතො මානානුසයං පරිජානාතීති: තදෙකට්ඨං පරිජානාති.

යො වා පන යතො මානානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයං පරිජානාතීති: නො.

75–76. යො යතො කාමරාගානුසයං පරිජානාති සො තතො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං පරිජානාතීති: නො.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයං පරිජානාතීති: අට්ඨමකො දුක්ඛාය වෙදනාය රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයං පරිජානාති, සෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, කාමරාගානුසයං තදෙකට්ඨං පරිජානාති.

තව ද යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද පිරිසිඳ දනී ද යත්: රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි අවිජ්ජානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී. කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද කාමරාගානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, එහි පටිඝානුසය ද භවරාගානුසය ද නො ද පිරිසිඳ දනී. දුඃඛවෙදනා ඇති කල්හි එහි අවිජ්ජානුසය ද පටිඝානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, එහි කාමරාගානුසය ද මානානුසය ද භවරාගානුසය ද නො ද පිරිසිඳ දනී. ( ඡක්කමූලක යි. )

අනුලොමාවකාශ යි.

73. යමෙක් යම් තැනෙක කාමරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි පටිඝානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක පටිඝානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

74. යමෙක් යම් තැනෙක කාමරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: තදෙකස්ථය පිරිසිඳ දනී.

තව ද යමෙක් යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

75–76. යමෙක් යම් තැනෙක කාමරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම (සොතාපත්තිමාර්ගස්ථ තෙම) දුඃඛවෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, තදෙකස්ථ වූ කාමරාගානුසය පිරිසිඳ දනී.

77. යො යතො කාමරාගානුසයං පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: නො.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයං පරිජානාතීති: නො.

78. යො යතො කාමරාගානුසයං පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: තදෙකට්ඨං පරිජානාති.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයං පරිජානාතීති: නො.

79. යො යතො පටිඝානුසයං පරිජානාති සො තතො මානානුසයං පරිජානාතීති: නො.

යො වා පන යතො මානානුසයං පරිජානාති සො තතො පටිඝානුසයං පරිජානාතීති: නො.

80–81. යො යතො පටිඝානුසයං පරිජානාති සො තතො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං පරිජානාතීති: නො.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො පටිඝානුසයං පරිජානාතීති: අට්ඨමකො කාමධාතුයා ද්වීසු වෙදනාසු රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, නො ච සො තතො පටිඝානුසයං පරිජානාති, ස්වෙව පුග්ගලො දුක්ඛාය වෙදනාය සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, පටිඝානුසයං තදෙකට්ඨං පරිජානාති.

82. යො යතො පටිඝානුසයං පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: නො.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො පටිඝානුසයං පරිජානාතීති: නො.

83. යො යතො පටිඝානුසයං පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: තදෙකට්ඨං පරිජානාති.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො පටිඝානුසයං පරිජානාතීති: නො.

84–85. යො යතො මානානුසයං පරිජානාති සො තතො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං පරිජානාතීති: නො.

77. යමෙක් යම් තැනෙක කාමරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

78. යමෙක් යම් තැනෙක කාමරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: තදෙකස්ථය පිරිසිඳ දනී.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

79. යමෙක් යම් තැනෙක පටිඝානුසය පිරිසිඳ දනී නම් හේ එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් හේ එහි පටිඝානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

80–81. යමෙක් යම් තැනෙක පටිඝානුසය පිරිසිඳ දනී නම් හේ එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි පටිඝානුසය පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, හේ එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුඟුල් තෙමේම දුඃඛවෙදනා ඇති කල්හි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, තදෙකස්ථ වූ පටිඝානුසය පිරිසිඳ දනී.

82. යමෙක් යම් තැනෙක පටිඝානුසය පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි පටිඝානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

83. යමෙක් යම් තැනෙක පටිඝානුසය පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: තදෙකස්ථය පිරිසිඳ දනී.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි පටිඝානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

84–85. යමෙක් යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් හේ එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො මානානුසයං පරිජානාතීති: අට්ඨමකො දුක්ඛාය වෙදනාය සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, නො ච සො තතො මානානුසයං පරිජානාති, සෙචව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති. මානානුසයං තදෙකට්ඨං පරිජානාති.

86. යො යතො මානානුසයං පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො මානානුසයං පරිජානාති, නො ච සො තතො භවරාගානුසයං පරිජානාති, සෙචව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො මානානුසයඤ්ච පරිජානාති, භවරාගානුසයඤ්ච පරිජානාති.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො මානානුසයං පරිජානාතීති: ආමන්තා.

87. යො යතො මානානුසයං පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: ආමන්තා.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො මානානුසයං පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී දුක්ඛාය වෙදනාය සො තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච සො තතො මානානුසයං පරිජානාති, සෙචව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු රූපධාතුයා අරූපධාතුයා සො තතො අවිජ්ජානුසයඤ්ච පරිජානාති, මානානුසයඤ්ච පරිජානාති.

88–90. යො යතො දිට්ඨානුසයං පරිජානාති සො තතො විචිකිච්ඡානුසයං පරිජානාතීති: ආමන්තා.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො දිට්ඨානුසයං පරිජානාතීති: ආමන්තා. –පෙ–

91. යො යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: අට්ඨමකො කාමධාතුයා තීසු වෙදනාසු සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, නො ච සො තතො භවරාගානුසයං පරිජානාති, සෙචව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, භවරාගානුසයං තදෙකට්ඨං පරිජානාති.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො විචිකිච්ඡානුසයං පරිජානාතීති: නො.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම දුඃඛවෙදනා ඇති කල්හි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, හේ එහි මානානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී. තදෙකස්ථ වූ මානානුසය පිරිසිඳ දනී.

86. යමෙක් යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි හේ එහි මානානුසය පිරිසිඳ දනී, හේ එහි භවරාගානුසය නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙමේ ම රූපධාතුයෙහි අරූපධාතුයෙහි ද යි එහි හේ මානානුසය ද පිරිසිඳ දනී, භවරාගානුසය ද පිරිසිඳ දනී.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

87. යමෙක් යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම දුඃඛවෙදනා ඇති කල්හි හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, හේ එහි මානානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ අවිජ්ජානුසය පිරිසිඳ දනී. මානානුසය ද පිරිසිඳ දනී.

88–90. යමෙක් යම් තැනෙක දිට්ඨානුසය පිරිසිඳ දනී නම් හේ එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳදනී නම් හේ එහි දිට්ඨානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි. ...

91. යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම කාමධාතුයෙහි තෙවැදෑරුම් වෙදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, හේ එහි භවරාගානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී, තදෙකස්ථ වූ භවරාගානුසය පිරිසිඳ දනී.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

92. යො යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: තදෙකට්ඨං පරිජානාති.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො විචිකිච්ඡානුසයං පරිජානාතීති: නො.

93. යො යතො භවරාගානුසයං පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: ආමන්තා.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී කාමධාතුයා තීසු වෙදනාසු සො තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච සො තතො භවරාගානුසයං පරිජානාති, ස්වෙව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො අවිජ්ජානුසයඤ්ච පරිජානාති, භවරාගානුසයඤ්ච පරිජානාති. (එකකමූලකං)

94. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති සො තතො මානානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො මානානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: නො.

95–96. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති සො තතො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: අට්ඨමකො රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, ස්වෙව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, කාමරාගානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො පටිඝානුසයං පරිජානාති, ස්වෙව පුග්ගලො දුක්ඛාය වෙදනාය සො තතො විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, පටිඝානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයං පරිජානාති.

97. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: නො.

**92.** යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: තදෙකස්ථය පිරිසිඳ දනී.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

**93.** යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම කාමධාතුයෙහි නෙවැදෑරුම් වෙදනා ඇති කල්හි එහි හේ අවිජ්ජානුසය පිරිසිඳ දනී, හේ එහි භවරාගානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ අවිජ්ජානුසය ද පිරිසිඳ දනී, භවරාගානුසය ද පිරිසිඳ දනී. (එකකමූලක යි.)

94. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි මානානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක මානානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: නැති.

95–96. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය පිරිසිඳ දනී. හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ කාමරාගානුසය ද පිරිසිඳ දනී. හේ එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම දුඃඛවෙදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී. තදෙකස්ථ වූ පටිඝානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය නො ද පිරිසිඳ දනී.

97. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: නැති.

98. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාතීති: නො. (දුකමූලකං)

99–100. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති සො තතො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාතීති: අට්ඨමකො රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, මානානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති, සෙව්ව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො පටිඝානුසයං පරිජානාති, සෙව්ව පුග්ගලො දුක්ඛාය වෙදනාය සො තතො විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති, පටිඝානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති.

101. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාතීති: මානානුසයං පරිජානාති.

102. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්ථි.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී දුක්ඛාය වෙදනාය සො තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, සෙව්ව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු රූපධාතුයා අරූපධාතුයා සො තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති. (තිකමූලකං)

98. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ දනී ද යත්: නැති. (දුකමූලක යි.)

99–100. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම රූපධාතුයෙහි ද අරූපධාතු-යෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ මානානුසය ද පිරිසිඳ දනී. හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ කාමරාගානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, හේ එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙමේ ම දුඃඛවෙදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ පටිඝානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී.

101. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී ද යත්: මානානුසය පිරිසිඳ දනී.

102. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම දුඃඛ වෙදනා ඇති කල්හි හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ අවිජ්ජානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගා-නුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී. (තිකමූලක යි.)

103–105. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති සො තතො විචිකිච්ඡානුසයං පරිජානාතීති: නත්‍ථි.

යො වා පන යතො විචිකිච්ඡානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාතීති: අට්ඨමකො රූපධාතුයා අරූපධාතුයා සො තතො විචිකිච්ඡානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති, මානානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච පරිජානාති. සෙව්ව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො විචිකිච්ඡානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති, කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො පටිඝානුසයං පරිජානාති. සෙව්ව පුග්ගලො දුක්ඛාය වෙදනාය සො තතො විචිකිච්ඡානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච පරිජානාති, පටිඝානුසයඤ්ච තදෙකට්ඨං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති. –පෙ– (චතුක්කමූලකං)

106. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති සො තතො භවරාගානුසයං පරිජානාතීති: නත්‍ථි.

යො වා පන යතො භවරාගානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාතීති: මානානුසයං පරිජානාති.

107. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්‍ථි.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී දුක්ඛාය වෙදනාය සො තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති. සෙව්ව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු රූපධාතුයා අරූපධාතුයා සො තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති (පඤ්චකමූලකං)

103–105. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි විචිකිච්ඡානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක විචිකිච්ඡානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ විචිකිච්ඡානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ මානානුසය ද පිරිසිඳ දනී. හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙම කාමධාතුයෙහි දෙවැදෑරුම් වේදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ කාමරාගානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, හේ එහි පටිඝානුසය නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙමේ ම දුඃඛ වෙදනා ඇති කල්හි හේ එහි විචිකිච්ඡානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ දනී, තදෙකස්ථ වූ පටිඝානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද මානානුසය ද නො ද පිරිසිඳ දනී.... (චතුක්කමූලක යි.)

106. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි භවරාගානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක භවරාගානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී ද යත්: මානානුසය පිරිසිඳ දනී.

107. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද පිරිසිඳ දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම දුඃඛවෙදනා ඇති කල්හි හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනායෙහි ද රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ අවිජ්ජානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද විචිකිච්ඡානුසය ද නො ද පිරිසිඳ දනී. (පඤ්චකමූලක යි.)

108. යො යතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති සො තතො අවිජ්ජානුසයං පරිජානාතීති: නත්‍ථි.

යො වා පන යතො අවිජ්ජානුසයං පරිජානාති සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී දුක්ඛාය වෙදනාය සො තතො අවිජ්ජානුසයං පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති. සෙව්ව පුග්ගලො කාමධාතුයා ද්වීසු වෙදනාසු සො තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති. සෙව්ව පුග්ගලො රූපධාතුයා අරූපධාතුයා සො තතො අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච භවරාගානුසයඤ්ච පරිජානාති, නො ච සො තතො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච පරිජානාති. (ඡක්කමූලකං.)

අනුලොමපුග්ගලොකාසං.

## පරිඤ්ඤාවාරෙ අනුලොමං.

109. යො කාමරාගානුසයං න පරිජානාති සො පටිඝානුසයං න පරිජානාතීති: ආමන්තා.

යො වා පන පටිඝානුසයං න පරිජානාති සො කාමරාගානුසයං න පරිජානාතීති: ආමන්තා.

110. යො කාමරාගානුසයං න පරිජානාති සො මානානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී කාමරාගානුසයං න පරිජානාති, නො ච සො මානානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච න පරිජානන්ති, මානානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන මානානුසයං න පරිජානාති සො කාමරාගානුසයං න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී මානානුසයං න පරිජානාති, නො ච සො කාමරාගානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා මානානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච න පරිජානන්ති.

108. යමෙක් යම් තැනෙක කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද පිරිසිඳ දනී නම් හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී ද යත්: නැති.

තව ද යමෙක් යම් තැනෙක අවිජ්ජානුසය පිරිසිඳ දනී නම් හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද පිරිසිඳ දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම දුඃඛවෙදනා ඇති කල්හි හේ එහි අවිජ්ජානුසය පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද නො ද පිරිසිඳ දනී, ඒ පුහුල් තෙමේ ම කාමධාතුයෙහි දෙවැදෑරුම් වෙදනා ඇති කල්හි හේ එහි අවිජ්ජානුසය ද මානානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද භවරාගානුසය ද නො ද පිරිසිඳ දනී. ඒ පුහුල් තෙමේ ම රූපධාතුයෙහි ද අරූපධාතුයෙහි ද යි එහි හේ අවිජ්ජානුසය ද මානානුසය ද භවරාගානුසය ද පිරිසිඳ දනී, හේ එහි කාමරාගානුසය ද පටිඝානුසය ද දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද නො ද පිරිසිඳ දනී, (ඡක්ක මූලක යි.)

**අනුලොමාවකාශ යි.**

## පරිඤ්ඤවාරයෙහි අනුලොම යි.

109. යමෙක් කාමරාගානුසය පිරිසිඳ නො දනී නම් හේ පටිඝානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් පටිඝානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

110. යමෙක් කාමරාගානුසය පිරිසිඳ නො දනී නම් හේ මානානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල තෙම කාමරාගානුසය පිරිසිඳ නො දනී, හේ මානානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුල්හු කාමරාගානුසය ද පිරිසිඳ නො දනිති, මානානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් මානානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල තෙම මානානුසය පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුල්හු මානානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පිරිසිඳ නො දනිත්.

111–112. යො කාමරාගානුසයං න පරිජානාති සො දිට්ඨානුසයං -පෙ- විචිකිච්ඡානුසයං න පරිජානාතීති: අට්ඨමකො කාමරාගානුසයං න පරිජානාති, නො ච සො විචිකිච්ඡානුසයං න පරිජානාති. අනාගාමිමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච න පරිජානන්ති, විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො කාමරාගානුසයං න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයං න පරිජානාති, නො ච සො කාමරාගානුසයං න පරිජානාති. අනාගාමිමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච න පරිජානන්ති.

113–114. යො කාමරාගානුසයං න පරිජානාති සො භවරාගානුසයං -පෙ- අවිජ්ජානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී කාමරාගානුසයං න පරිජානාති, නො ච සො අවිජ්ජානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච න පරිජානන්ති, අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො කාමරාගානුසයං න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී අවිජ්ජානුසයං න පරිජානාති, නො ච සො කාමරාගානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච න පරිජානන්ති.

115. යො පටිඝානුසයං න පරිජානාති සො මානානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී පටිඝානුසයං න පරිජානාති, නො ච සො මානානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා පටිඝානුසයඤ්ච න පරිජානන්ති, මානානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන මානානුසයං න පරිජානාති සො පටිඝානුසයං න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී මානානුසයං න පරිජානාති, නො ච සො පටිඝානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා මානානුසයඤ්ච න පරිජානන්ති, පටිඝානුසයඤ්ච න පරිජානන්ති.

111–112. යමෙක් කාමරාගානුසය පිරිසිඳ නො දනී නම් හේ දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම කාමරාගානුසය පිරිසිඳ නො දනී, හේ විචිකිච්ඡානුසය නො ද පිරිසිඳ නො දනී. අනාගාමිමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුඟුල්හු කාමරාගානුසය ද පිරිසිඳ නො දනිති, විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගි පුද්ගල විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය නො ද පිරිසිඳ නො දනී. අනාගාමිමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුඟුල්හු විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පිරිසිඳ නො දනිත්.

113–114. යමෙක් කාමරාගානුසය පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය ... අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල කාමරාගානුසය පිරිසිඳ නො දනී, හේ අවිජ්ජානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුඟුල්හු කාමරාගානුසය ද පිරිසිඳ නො දනිති, අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල අවිජ්ජානුසය පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුඟුල්හු අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පිරිසිඳ නො දනිත්.

115. යමෙක් පටිඝානුසය පිරිසිඳ නො දනී නම් හේ මානානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල පටිඝානුසය පිරිසිඳ නො දනී, හේ මානානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුඟුල්හු පටිඝානුසය ද පිරිසිඳ නො දනිති, මානානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් මානානුසය පිරිසිඳ නො දනී නම් හේ පටිඝානුසය පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල මානානුසය පිරිසිඳ නො දනී, හේ පටිඝානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුඟුල්හු මානානුසය ද පිරිසිඳ නො දනිති, පටිඝානුසය ද පිරිසිඳ නො දනිත්.

116-117. යො පටිඝානුසයං න පරිජානාති සො දිට්ඨානුසයං -පෙ- විචිකිච්ඡානුසයං න පරිජානාතීති: අට්ඨමකො පටිඝානුසයං න පරිජානාති, නො ච සො විචිකිච්ඡානුසයං න පරිජානාති. අනාගාමිමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා පටිඝානුසයඤ්ච න පරිජානන්ති, විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො පටිඝානුසයං න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයං න පරිජානාති, නො ච සො පටිඝානුසයං න පරිජානාති. අනාගාමිමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, පටිඝානුසයඤ්ච න පරිජානන්ති.

118-119. යො පටිඝානුසයං න පරිජානාති සො භවරාගානුසයං -පෙ- අවිජ්ජානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී පටිඝානුසයං න පරිජානාති, නො ච සො අවිජ්ජානුසයං න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා පටිඝානුසයඤ්ච න පරිජානන්ති, අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො පටිඝානුසයං න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී අවිජ්ජානුසයං න පරිජානාති, නො ච සො පටිඝානුසයං න පරිජානාති. ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති, පටිඝානුසයඤ්ච න පරිජානන්ති.

120-121. යො මානානුසයං න පරිජානාති සො දිට්ඨානුසයං -පෙ- විචිකිච්ඡානුසයං න පරිජානාතීති: අට්ඨමකො මානානුසයං න පරිජානාති, නො ච සො විචිකිච්ඡානුසයං න පරිජානාති. අග්ගමග්ග-සමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා මානානුසයඤ්ච න පරිජානන්ති, විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො මානානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයං න පරිජානාති, නො ච සො මානානුසයං න පරිජානාති. අග්ගමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, මානානුසයඤ්ච න පරිජානන්ති.

116–117. යමෙක් පටිඝානුසය පිරිසිඳ නො දනී නම් හේ දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: අෂ්ටමක පුද්ගල පටිඝානුසය පිරිසිඳ නො දනී, හේ විචිකිච්ඡානුසය නො ද පිරිසිඳ නො දනී, අනාගාමිමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුල්හු පටිඝානුසය ද පිරිසිඳ නො දනිති, විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ පටිඝානුසය පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී, හේ පටිඝානුසය නො ද පිරිසිඳ නො දනී. අනාගාමිමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුල්හු විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිති, පටිඝානුසය ද පිරිසිඳ නො දනිත්.

118–119. යමෙක් පටිඝානුසය පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය ...අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ග-සමඞ්ගී පුද්ගල පටිඝානුසය පිරිසිඳ නො දනී, හේ අවිජ්ජානුසය නො ද පිරිසිඳ නො දනී, දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුල්හු පටිඝානුසය ද පිරිසිඳ නො දනිති, අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ පටිඝානුසය පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල අවිජ්ජානුසය පිරිසිඳ නො දනී, හේ පටිඝානුසය නො ද පිරිසිඳ නො දනී, දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුල්හු අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිති, පටිඝානුසය ද පිරිසිඳ නො දනිත්.

120–121. යමෙක් මානානුසය පිරිසිඳ නො දනී නම් හේ දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: අෂ්ටමක පුද්ගල මානානුසය පිරිසිඳ නො දනී, හේ විචිකිච්ඡා-නුසය නො ද පිරිසිඳ නො දනී, අග්‍රමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුල්හු මානානුසය ද පිරිසිඳ නො දනිති, විචිකිච්ඡා-නුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ මානානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී, හේ මානානුසය නො ද පිරිසිඳ නො දනී, අග්‍රමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුල්හු විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිති, මානා-නුසය ද පිරිසිඳ නො දනිත්.

122–123. යො මානානුසයං න පරිජානාති සො භවරාගානුසයං –පෙ– අවිජ්ජානුසයං න පරිජානාතීති: ආමන්තා.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො මානානුසයං න පරිජානාතීති: ආමන්තා.

124–126. යො දිට්ඨානුසයං න පරිජානාති සො විචිකිච්ඡානුසයං න පරිජානාතීති: ආමන්තා.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො දිට්ඨානුසයං න පරිජානාතීති: ආමන්තා. –පෙ–

127–128. යො විචිකිච්ඡානුසයං න පරිජානාති සො භවරාගානුසයං –පෙ– අවිජ්ජානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයං න පරිජානාති, නො ච සො අවිජ්ජානුසයං න පරිජානාති. අග්ගමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො විචිකිච්ඡානුසයං න පරිජානාතීති: අට්ඨමකො අවිජ්ජානුසයං න පරිජානාති, නො ච සො විචිකිච්ඡානුසයං න පරිජානාති, අග්ගමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති, විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති.

129. යො භවරාගානුසයං න පරිජානාති සො අවිජ්ජානුසයං න පරිජානාතීති: ආමන්තා.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො භවරාගානුසයං න පරිජානාතීති: ආමන්තා. (එකකමූලකං)

130. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති සො මානානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, නො ච සො මානානුසයං න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානන්ති, මානානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන මානානුසයං න පරිජානාති සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී මානානුසයං න පරිජානාති, නො ච සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා මානානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානන්ති.

122–123. යමෙක් මානානුසය පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය … අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ මානානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

124–126. යමෙක් දිට්ඨානුසය පිරිසිඳ නො දනී නම් හේ විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ දිට්ඨානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි …

127–128. යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය … අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී, හේ අවිජ්ජානුසය නො ද පිරිසිඳ නො දනී, අග්‍රමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුල්හු විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිති, අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: අෂ්ටමක පුද්ගල අවිජ්ජානුසය පිරිසිඳ නො දනී, හේ විචිකිච්ඡානුසය නො ද පිරිසිඳ නො දනී, අග්‍රමාර්ගසමඞ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුල්හු අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිති, විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිත්.

129. යමෙක් භවරාගානුසය පිරිසිඳ නො දනී නම් හේ අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි. (එකකමූලක යි.)

130. යමෙක් කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී නම් හේ මානානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී, හේ මානානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුලෝ කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනිති, මානානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් මානානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල මානානුසය පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ නො දනී, දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුලෝ මානානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනිත්.

131–132. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති සො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං න පරිජානාතීති: අට්ඨමකො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, නො ච සො විචිකිච්ඡානුසයං න පරිජානාති, අනාගාමිමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානන්ති, විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයං න පරිජානාති, නො ච සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති. අනාගාමිමග්ගසමඞ්ගිඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානන්ති.

133–134. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති සො භවරාගානුසයං –පෙ– අවිජ්ජානුසයං න පරිජානාතීති: අග්ගමග්ගසමඞ්ගී කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, නො ච සො අවිජ්ජානුසයං න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානන්ති, අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී අවිජ්ජානුසයං න පරිජානාති, නො ච සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානන්ති. (දුකමූලකං)

135–136. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාති සො දිට්ඨානුසයං –පෙ– විචිකිච්ඡානුසයං න පරිජානාතීති: අට්ඨමකො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාති, නො ච සො විචිකිච්ඡානුසයං න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානන්ති, විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති.

131-132. යමෙක් කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී නම් හේ දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: අෂ්ටමක පුද්ගල කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී, හේ විචිකිච්ඡානුසය නො ද පිරිසිඳ නො දනී, අනාගාමිමාර්ගසමඬ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුලෝ කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනිති විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඬ්ගී පුද්ගල විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ නො දනී, අනාගාමිමාර්ගසමඬ්ගියා ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුලෝ විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනිත්.

133-134. යමෙක් කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය ... අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: අග්‍රමාර්ගසමඬ්ගී පුද්ගල කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී, හේ අවිජ්ජානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඬ්ගීන් තබා සෙසු පුහුලෝ කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනිති, අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිත්.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඬ්ගී පුද්ගල අවිජ්ජානුසය පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ නො දනී, දෙවැදෑරුම් මාර්ගසමඬ්ගීන් තබා සෙසු පුහුලෝ අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනිත්. (දුකමූලක යි.)

135-136. යමෙක් කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී නම් හේ දිට්ඨානුසය ... විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්: අෂ්ටමක පුද්ගල තෙම කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනී, හේ විචිකිච්ඡානුසය නො ද පිරිසිඳ නො දනී, දෙවැදෑරුම් මාර්ගසමඬ්ගීන් ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුලෝ කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනිති, විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිත්.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගි විචිකිච්ඡානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාති, නො ච සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, අග්ගමග්ගසමඞ්ගි විචිකිච්ඡානුසයඤ්ච කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, නො ච සො මානානුසයං න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානන්ති.

137–138. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාති සො භවරාගානුසයං –පෙ– අවිජ්ජානුසයං න පරිජානාතීති: ආමන්තා.

යො වා පන අවිජ්ජානුසයං න පරිජානාති සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී අවිජ්ජානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානාති, නො ච සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනං ඨපෙත්වා අවසෙසා පුග්ගලා අවිජ්ජානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච න පරිජානන්ති. (තිකමූලකං)

139–141. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච න පරිජානාති සො විචිකිච්ඡානුසයං න පරිජානාතීති: ආමන්තා.

යො වා පන විචිකිච්ඡානුසයං න පරිජානාති සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච න පරිජානාතීති: අනාගාමිමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච න පරිජානාති, නො ච සො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච න පරිජානාති, අග්ගමග්ගසමඞ්ගී විචිකිච්ඡානුසයඤ්ච කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච න පරිජානාති, නො ච සො මානානුසයං න පරිජානාති, ද්වින්නං මග්ගසමඞ්ගීනඤ්ච අට්ඨමකඤ්ච ඨපෙත්වා අවසෙසා පුග්ගලා විචිකිච්ඡානුසයඤ්ච න පරිජානන්ති, කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච න පරිජානන්ති. –පෙ– (චතුක්කමූලකං)

142–143. යො කාමරාගානුසයඤ්ච පටිඝානුසයඤ්ච මානානුසයඤ්ච දිට්ඨානුසයඤ්ච විචිකිච්ඡානුසයඤ්ච න පරිජානාති සො භවරාගානුසයං –පෙ– අවිජ්ජානුසයං න පරිජානාතීති: ආමන්තා.

තව ද යමෙක් විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගි පුද්ගල විචිකිච්ඡානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ නො දනී, අග්‍රමාර්ගසමඞ්ගී පුද්ගල විචිකිච්ඡානුසය ද කාමරාගානුසය ද පටිඝානුසය ද පිරිසිඳ නො දනී, හේ මානානුසය නො ද පිරිසිඳ නො දනී. දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් ද අෂ්ටමකයා ද තබා සෙසු පුහුලෝ විචිකිච්ඡානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනිත්.

137–138. යමෙක් කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනී නම් හේ භවරාගානුසය ... අවිජ්ජානුසය පිරිසිඳ නො දනී ද යත්: එසේ යි.

තව ද යමෙක් අවිජ්ජානුසය පිරිසිඳ නො දනී නම් හේ කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනී ද යත්: අනාගාමිමාර්ගසමඞ්ගී පුද්ගල අවිජ්ජානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනී, හේ කාමරාගානුසය ද පටිඝානුසය ද නො ද පිරිසිඳ නො දනී, දෙවැදෑරුම් මාර්ගසමඞ්ගීන් තබා සෙසු පුහුලෝ අවිජ්ජානුසය ද පිරිසිඳ නො දනිති, කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද පිරිසිඳ නො දනිත්. (තිකමූලක යි.)

139–141. යමෙක් කාමරාගානුසය ද පටිඝානුසය ද මානානුසය ද දිට්ඨානුසය ද පිරිසිඳ නො දනී නම් හේ විචිකිච්ඡානුසය පිරිසිඳ නො දනී ද යත්; එසේ යි.

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ නො වන්නෝ නම් ඔහට ඒ සිත නිරුද්ධ නො වී යැ යත්:

**නිරොධවාර යි.**

103. යස්ස යං චිත්තං උප්පජ්ජති තස්ස තං චිත්තං නිරුජ්ඣිත්ථ:

යස්ස වා පන යං චිත්තං නිරුජ්ඣිත්ථ තස්ස තං චිත්තං උප්පජ්ජති:

104. යස්ස යං චිත්තං න උප්පජ්ජති තස්ස තං චිත්තං න නිරුජ්ඣිත්ථ:

යස්ස වා පන යං චිත්තං න නිරුජ්ඣිත්ථ තස්ස තං චිත්තං න උප්පජ්ජති:

105. යස්ස යං චිත්තං උප්පජ්ජති තස්ස තං චිත්තං නිරුජ්ඣිස්සති:

යස්ස වා පන යං චිත්තං නිරුජ්ඣිස්සති තස්ස තං චිත්තං උප්පජ්ජති:

106. යස්ස යං චිත්තං න උප්පජ්ජති තස්ස තං චිත්තං න නිරුජ්ඣිස්සති:

යස්ස වා පන යං චිත්තං න නිරුජ්ඣිස්සති තස්ස තං චිත්තං න උප්පජ්ජති:

107. යස්ස යං චිත්තං උප්පජ්ජිත්ථ තස්ස තං චිත්තං නිරුජ්ඣිස්සති:

යස්ස වා පන යං චිත්තං නිරුජ්ඣිස්සති තස්ස තං චිත්තං උප්පජ්ජිත්ථ:

108. යස්ස යං චිත්තං න උප්පජ්ජිත්ථ තස්ස තං චිත්තං න නිරුජ්ඣිස්සති:

යස්ස වා පන යං චිත්තං න නිරුජ්ඣිස්සති තස්ස තං චිත්තං න උප්පජ්ජිත්ථ:

### උප්පාදනිරොධවාරො.

109. යස්ස යං චිත්තං උප්පජ්ජති තස්ස තං චිත්තං න නිරුජ්ඣති:

යස්ස වා පන යං චිත්තං න නිරුජ්ඣති තස්ස තං චිත්තං උප්පජ්ජති.

110. යස්ස යං චිත්තං න උප්පජ්ජති තස්ස තං චිත්තං නිරුජ්ඣති:

යස්ස වා පන යං චිත්තං නිරුජ්ඣති තස්ස තං චිත්තං න උප්පජ්ජති:

### උප්පජ්ජමාන න නිරොධවාරො.

111. යස්ස යං චිත්තං උප්පජ්ජමානං තස්ස තං චිත්තං උප්පන්නං:

යස්ස වා පන යං චිත්තං උප්පන්නං තස්ස තං චිත්තං උප්පජ්ජමානං:

103. යමක්හට යම් සිතෙක් උපදී නම් ඔහට ඒ සිත නිරුද්ධ වී යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ වී නම් ඔහට ඒ සිත උපදී යැ යත්:

104. යමක්හට යම් සිතෙක් නො උපදී නම් ඔහට ඒ සිත නිරුද්ධ නො වී යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ නො වී නම් ඔහට ඒ සිත නූපදී යැ යත්:

105. යමක්හට යම් සිතෙක් උපදී නම් ඔහට ඒ සිත නිරුද්ධ වන්නේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් ඔහට ඒ සිත උපදී යැ යත්:

106. යමක්හට යම් සිතෙක් නූපදී නම් ඔහට ඒ සිත නිරුද්ධ නො වන්නේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් ඔහට ඒ සිත නූපදී යැ යත්:

107. යමක්හට යම් සිතෙක් උපන්නේ නම් ඔහට ඒ සිත නිරුද්ධ වන්නේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් ඔහට ඒ සිත උපන්නේ යැ යත්:

108. යමක්හට යම් සිතෙක් නූපන්නේ නම් ඔහට ඒ සිත නිරුද්ධ නො වන්නේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් ඔහට ඒ සිත නූපන්නේ යැ යත්:

**උත්පාද නිරොධවාර යි.**

109. යමක්හට යම් සිතෙක් උපදී නම් ඔහට ඒ සිත නිරුද්ධ නො වෙයි යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ නො වේ නම් ඔහට ඒ සිත උපදී යැ යත්:

110. යමක්හට යම් සිතෙක් නො උපදී නම් ඔහට ඒ සිත නිරුද්ධ වෙයි යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරුද්ධ වේ නම් ඔහට ඒ සිත නො උපදී යැ යත්:

**උත්පද්‍යමාන න නිරොධවාර යි.**

111. යමක්හට යම් සිතෙක් උපදිමින් පවතී නම් ඔහට ඒ සිත උපන යත්:

තව ද යමක්හට යම් සිතෙක් උපනි නම් ඔහට ඒ සිත උපදිමින් පවතී යැ යත්:

112. යස්ස යං චිත්තං න උප්පජ්ජමානං තස්ස තං චිත්තං න උප්පන්නං:

යස්ස වා පන යං චිත්තං න ප්පන්නං තස්ස තං චිත්තං න උප්පජ්ජමානං:

උප්පජ්ජමානුප්පන්නවාරො.

113. යස්ස යං චිත්තං නිරුජ්ඣමානං තස්ස තං චිත්තං උප්පන්නං:

යස්ස වා පන යං චිත්තං උප්පන්නං තස්ස තං චිත්තං නිරුජ්ඣමානං:

114. යස්ස යං චිත්තං න නිරුජ්ඣමානං තස්ස තං චිත්තං න උප්පන්නං:

යස්ස වා පන යං චිත්තං න උප්පන්නං තස්ස තං චිත්තං න නිරුජ්ඣමානං:

නිරුජ්ඣමානුප්පන්නවාරො.

115. යස්ස යං චිත්තං උප්පන්නං තස්ස තං චිත්තං උප්පජ්ජිත්ථ:

යස්ස වා පන යං චිත්තං උප්පජ්ජිත්ථ තස්ස තං චිත්තං උප්පන්නං:

116. යස්ස යං චිත්තං න උප්පන්නං තස්ස තං චිත්තං න උප්පජ්ජිත්ථ:

යස්ස වා පන යං චිත්තං න උප්පජ්ජිත්ථ තස්ස තං චිත්තං න උප්පන්නං:

117. යස්ස යං චිත්තං උප්පන්නං තස්ස තං චිත්තං උප්පජ්ජිස්සති:

යස්ස වා පන යං චිත්තං උප්පජ්ජිස්සති තස්ස තං චිත්තං උප්පන්නං:

118. යස්ස යං චිත්තං න උප්පන්නං තස්ස තං චිත්තං න උප්පජ්ජිස්සති:

යස්ස වා පන යං චිත්තං න උප්පජ්ජිස්සති තස්ස තං චිත්තං න උප්පන්නං:

උප්පන්නුප්පාදවාරො.

119. යස්ස යං චිත්තං උප්පජ්ජිත්ථ නො ච තස්ස තං චිත්තං උප්පන්නං තස්ස තං චිත්තං උප්පජ්ජිස්සති:

යස්ස වා පන යං චිත්තං උප්පජ්ජිස්සති නො ච තස්ස තං චිත්තං උප්පන්නං තස්ස තං චිත්තං උප්පජ්ජිත්ථ:

112. යමක්හට යම් සිතෙක් උපදිමින් නො පවතී නම් ඔහට ඒ සිත නූපන්නේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නූපන්නේ නම් ඔහට ඒ සිත උපදිමින් නො පවතී යැ යත්:

උත්පද්‍යමානොත්පන්නවාර යි.

113. යමක්හට යම් සිතෙක් නිරුද්ධ වෙමින් පවතී නම් ඔහට ඒ සිත උපන යත්:

තව ද යමක්හට යම් සිතෙක් උපනි නම් ඔහට ඒ සිත නිරුද්ධ වෙමින් පවතී යැ යත්:

114. යමක්හට යම් සිතෙක් නිරුද්ධ වෙමින් නො පවතී නම් ඔහට ඒ සිත නූපන්නෙ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නූපන්නේ නම් ඔහට ඒ සිත නිරුද්ධ වෙමින් නො පවතී යැ යත්:

නිරුද්ධ්‍යමානොත්පන්නවාර යි.

115. යමක්හට යම් සිතෙක් උපනි නම් ඔහට ඒ සිත උපන්නේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් උපන්නේ නම් ඔහට ඒ සිත උපන යත්:

116. යමක්හට යම් සිතෙක් නූපන්නේ නම් ඔහට ඒ සිත නූපන යත්:

තව ද යමක්හට යම් සිතෙක් නූපනි නම් ඔහට ඒ සිත නූපන්නේ යැ යත්:

117. යමක්හට යම් සිතෙක් උපනි නම් ඔහට ඒ සිත උපදනේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් උපදනේ නම් ඔහට ඒ සිත උපන යත්:

118. යමක්හට යම් සිතෙක් නො උපනි නම් ඔහට ඒ සිත නො උපදනේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නො උපදනේ නම් ඔහට ඒ සිත නූපන්නේ යැ යත්:

උත්පන්නොත්පාදවාර යි.

119. යමක්හට යම් සිතෙක් උපන්නේ නම් ඔහට ඒ සිත නො ද උපන යත්: ඔහට ඒ සිත උපදනේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් උපදනේ නම් ඔහට ඒ සිත නො ද උපනි ද: ඔහට ඒ සිත උපන්නේ යැ යත්:

120. යස්ස යං චිත්තං න උප්පජ්ජිත්ථ නො ච තස්ස තං චිත්තං න උප්පන්නං තස්ස තං චිත්තං න උප්පජ්ජිස්සති:

යස්ස වා පන යං චිත්තං න උප්පජ්ජිස්සති නො ච තස්ස තං චිත්තං න උප්පන්නං තස්ස තං චිත්තං න උප්පජ්ජිත්ථ:

**අතීතානාගතවාරො.**

121. උප්පන්නං උප්පජ්ජමානං උප්පජ්ජමානං උප්පන්නං:

122. න උප්පන්නං න උප්පජ්ජමානං න උප්පජ්ජමානං න උප්පන්නං:

**උප්පන්නුප්පජ්ජමානවාරො.**

123. නිරුද්ධං නිරුජ්ඣමානං නිරුජ්ඣමානං නිරුද්ධං:

124. න නිරුද්ධං න නිරුජ්ඣමානං න නිරුජ්ඣමානං න නිරුද්ධං:

**නිරුද්ධනිරුජ්ඣමානවාරො.**

125. යස්ස යං චිත්තං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං, නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස තං චිත්තං:

යස්ස වා පන යං චිත්තං නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස තං චිත්තං:

126. යස්ස යං චිත්තං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං න නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස තං චිත්තං:

යස්ස වා පන යං චිත්තං න නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස තං චිත්තං:

120. යමක්හට යම් සිතෙක් නූපන්නේ නම් ඔහට ඒ සිත නො ද උපනි නම් ඔහට ඒ සිත නො ද උපදනේ යැ යත්:

තව ද යමක්හට යම් සිතෙක් නො උපදනේ නම් ඔහට ඒ සිත නො ද නො උපනි නම් ඔහට ඒ සිත නො උපන්නේ යැ යත්:

අතීතානාගතවාර යි.

121. උපන් (සිත) උපදිමින් පවත්නේ වේ ද යත්: උපදිමින් පවත්නා (සිත) උපන්නේ වේ ද යත්:

122. නො උපන් (සිත) උපදිමින් නො පවත්නේ වේ ද යත්: උපදිමින් නො පවත්නා (සිත) නො උපන්නේ වේ ද යත්:

උත්පන්නොත්පද්‍යමානවාර යි.

123. නිරුද්ධ වූ (සිත) නිරුද්ධ වෙමින් පවත්නේ වේ ද යත්: නිරුද්ධ වෙමින් පවත්නා (සිත) නිරුද්ධ වූයේ වේ ද යත්:

124. නිරුද්ධ නො වූ (සිත) නිරුද්ධ වෙමින් නො පවත්නේ වේ ද යත්: නිරුද්ධ වෙමින් නො පවත්නා (සිත) නො නිරුද්ධ වූයේ වේ ද යත්:

නිරුද්ධ නිරුද්ධ්‍යමානවාර යි.

125. යමක්හට යම් සිතෙක් උත්පාදක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට යේ නම් නිරොධක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට යේ නම් ඔහට ඒ සිත අතීත වෙයි යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරොධක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට යේ නම් උත්පාදක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට යේ නම් ඔහට ඒ සිත අතීතකාල වෙයි යත්:

126. යමක්හට යම් සිතෙක් උත්පාදක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට නො යේ නම් නිරොධක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට නො යේ නම් ඔහට ඒ සිත අතීත වෙයි යත්:

තව ද යමක්හට යම් සිතෙක් නිරොධක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට නො යේ නම් උත්පාදක්‍ෂණය ක්‍ෂණයක් ඉක්මගිය අතීතකාල සඞ්ඛ්‍යාවට නො යේ නම් ඔහට ඒ සිත අතීතකාල වෙයි යත්:

127–2016. යස්ස සරාගං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස වීතරාගං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස සදෙසං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස වීතදෙසං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස සමොහං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස වීතමොහං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස සඞ්ඛිත්තං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස විකඛිත්තං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස මහග්ගතං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස අමහග්ගතං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස ස උත්තරං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස අනුත්තරං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස සමාහිතං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස අසමාහිතං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස විමුත්තං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස අවිමුත්තං චිත්තං උප්පජ්ජති –පෙ–

සරාගාදිපදමිස්සකවාරො.

2017–536256. යස්ස කුසලං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස අකුසලං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස අබ්‍යාකතං චිත්තං උප්පජ්ජති –පෙ– යස්ස සුඛාය වෙදනාය සම්පයුත්තං චිත්තං උප්පජ්ජති –පෙ– (එතෙන උපායෙන යාව සරණ අරණා උද්ධරිතබ්බා), යස්ස අරණං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති තස්ස අරණං චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති:

යස්ස වා පන අරණං චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති තස්ස අරණං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති –පෙ–

කුසලාදිපදමිස්සකවාරො.

උද්දෙසවාරො.

127-2016. යමක්හට සරාග සිත උපදී නම් ... යමක්හට වීතරාග සිත උපදී නම් ... යමක්හට සදොස සිත උපදී නම් ... යමක්හට වීත දොස සිත උපදී නම් ... යමක්හට සමොහ සිත උපදී නම් ... යමක්හට වීත මොහ සිත උපදී නම් ... යමක්හට සංක්ෂිප්ත සිත උපදී නම් ... යමක්හට වික්ෂිප්ත සිත උපදී නම් ... යමක්හට මහද්ගත සිත උපදී නම් ... යමක්හට අමහද්ගත සිත උපදී නම් ... යමක්හට ස උත්තර සිත උපදී නම් ... යමක්හට අනුත්තර සිත උපදී නම් ... යමක්හට සමාහිත සිත උපදී නම්... යමක්හට අසමාහිත සිත උපදී නම් ... යමක්හට විමුක්ත සිත උපදී නම් ... යමක්හට අවිමුක්ත සිත උපදී නම් .........

**සරාගාදිපදමිස්සකවාර යි.**

2017-536256. යමක්හට කුශලචිත්තය උපදී නම් ... යමක්හට අකුශලචිත්තය උපදී නම් ... යමක්හට අව්‍යාකෘතචිත්තය උපදී නම් ... යමක්හට සුඛ වෙදනා සම්ප්‍රයුක්ත චිත්තය උපදී නම් ... (මේ උපායයෙන් සරණ අරණයන් තාක් උද්ධරණය කළයුතුයි.) යමක්හට අරණචිත්තය උපදී නම් නිරුද්ධ නො වේ නම් ඔහට අරණ චිත්තය නිරුද්ධ වන්නේ යැ යත්:

තව ද යමක්හට අරණචිත්තය නිරුද්ධ වන්නේ නම් නො උපදින්නේ නම් ඔහට අරණචිත්තය උපදී නිරුද්ධ නො වෙයි යත්:

**කුසලාදිපදමිස්සකවාර යි.**

## උද්දේශවාර යි.

# 2. නිද්දෙසවාරො

## පුග්ගලවාරො

1. යස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති තස්ස චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සතීති: පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති. ඉතරෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති, නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජිස්සති ච.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති තස්ස චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣතීති: ආමන්තා.

2. යස්ස චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති තස්ස චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සතීති: නො.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති තස්ස චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣතීති: නත්ථි.

## උප්පාදනිරොධකාලසම්භෙදවාරො.

3. යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං, නො ච තෙසං චිත්තං උප්පජ්ජති, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නඤ්චෙව උප්පජ්ජති ච.

4. යස්ස චිත්තං න උප්පජ්ජති තස්ස චිත්තං න උප්පන්නන්ති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං න උප්පජ්ජති, නො ච තෙසං චිත්තං න උප්පන්නං, නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න චෙව උප්පජ්ජති න ච උප්පන්නං.

යස්ස වා පන චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

## උප්පාදුප්පන්නවාරො

5. යස්ස චිත්තං නිරුජ්ඣති තස්ස චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පන්නං තස්ස චිත්තං නිරුජ්ඣතීති: චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං, නො ච තෙසං චිත්තං නිරුජ්ඣති. චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නඤ්චෙව නිරුජ්ඣති ච.

# 2. නිර්දේශවාර

## පුද්ගලවාර

1. යමක්හට සිත උපදී නම් නිරුද්ධ නො වේ නම් ඔහට සිත නිරුද්ධ වන්නෙ යැ, නූපදනෙ යැ යත්: පශ්චිම (චුති) චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඒ ක්‍ෂීණාස්‍රවයනට (චුති) චිත්තය (උත්පාදක්‍ෂණයට පැමිණි බැවින්) උපදී. (භඞ්ගයට නොපත් බැවින්) නිරුද්ධ නො වෙයි, (භඞ්ගයට පැමිණ) නිරුද්ධ වන්නෙ යැ, (අප්‍රාසන්ධික බැවින් අන් සිතක්) නූපදනෙ යැ. (ශෛක්‍ෂ්‍යාශෛක්‍ෂ්‍ය පෘථග්ජන) සෙස්සන්ගේ චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත (උත්පාදක්‍ෂණ සමඞ්ගිතායෙන්) උපදී, (භඞ්ගයට නොපත් බැවින්) නිරුද්ධ නො වෙයි, (භඞ්ගයට පැමිණ) නිරුද්ධ වන්නෙ මැ උපදනෙ ද වෙයි.

තව ද යමක්හට සිත නිරුද්ධ වන්නෙ නම් නූපදනෙ නම් ඔහට සිත උපදියි, නිරුද්ධ නො වෙයි යත්: එසේ යි.

2. යමක්හට සිත නූපදී නම් නිරුද්ධ වේ නම් ඔහට සිත නිරුද්ධ නො වන්නෙ යැ උපදනෙ යැ යත්: නො වේ.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වන්නෙ නම් උපදනෙ නම් ඔහට සිත නූපදියි නිරුද්ධ වෙයි යත්: නැති.

### උප්පාදනිරොධකාලසම්භේදවාර යි.

3. යමක්හට සිත උපදී නම් ඔහට සිත උපන යත්: එසේ යි.

තව ද යමක්හට සිත උපනි නම් ඔහට සිත උපදී යත්: චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත උපන, ඔවුනට සිත නො ද උපදී, චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උපන්නෙ ද උපදිමින් සිටුනෙ ද වෙයි.

4. යමක්හට සිත නූපදී නම් ඔහට සිත නූපන යත්: චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නූපදී, ඔවුනට සිත නො ද නූපන්නෙ යැ, නිරොධ සමාපන්නයනට ද අසංඥසත්ත්වයනට ද යන ඔවුනට සිත නො ද උපදී, නො ද උපන්නෙ යැ.

තව ද යමක්හට සිත නූපන්නෙ නම් ඔහට සිත නූපදී යත්: එසේ යි.

### උත්පාදෙත්පන්නවාර යි.

5. යමක්හට සිත නිරුද්ධ වේ නම් ඔහට සිත උපන යත්: එසේ යි.

තව ද යමක්හට සිත උපනි නම් ඔහට සිත නිරුද්ධ වේ ද යත්: චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උපන, ඔවුනට සිත නො ද නිරුද්ධ වෙයි, චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත උපනි ද වේ නිරුද්ධ ද වේ.

6. යස්ස චිත්තං න නිරුජ්ඣති තස්ස චිත්තං න උප්පන්නන්ති: චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං න නිරුජ්ඣති, නො ච තෙසං චිත්තං න උප්පන්නං, නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න චෙව නිරුජ්ඣති න ච උප්පන්නං.

යස්ස වා පන චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න නිරුජ්ඣතීති: ආමන්තා.

## නිරොධුප්පන්නවාරො.

7. යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පජ්ජිත්ථ තස්ස චිත්තං උප්පජ්ජතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තෙසං චිත්තං උප්පජ්ජති, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජිත්ථ චෙව උප්පජ්ජති ච.

8. යස්ස චිත්තං න උප්පජ්ජති තස්ස චිත්තං න උප්පජ්ජිත්ථාති: උප්පජ්ජිත්ථ.

යස්ස වා පන චිත්තං න උප්පජ්ජිත්ථ තස්ස චිත්තං න උප්පජ්ජතීති: නත්ථි.

9. යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති: පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති, නො ච තෙසං චිත්තං උප්පජ්ජිස්සති, ඉතරෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජති චෙව උප්පජ්ජිස්සති ච.

යස්ස වා පන චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තං උප්පජ්ජතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං උප්පජ්ජිස්සති, නො ච තෙසං චිත්තං උප්පජ්ජති, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජිස්සති චෙව උප්පජ්ජති ච.

10. යස්ස චිත්තං න උප්පජ්ජති තස්ස චිත්තං න උප්පජ්ජිස්සතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න උප්පජ්ජති, නො ච තෙසං චිත්තං න උප්පජ්ජිස්සති පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං න චෙව උප්පජ්ජති න ච උප්පජ්ජිස්සති.

යස්ස වා පන චිත්තං න උප්පජ්ජිස්සති තස්ස චිත්තං න උප්පජ්ජතීති: පච්ඡිමචිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං න උප්පජ්ජිස්සති, නො ච තෙසං චිත්තං න උප්පජ්ජති, පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං න චෙව උප්පජ්ජිස්සති න ච උප්පජ්ජති.

6. යමක්හට සිත නිරුද්ධ නො වේ නම් ඔහට සිත නො උපන යත්: චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ නො වෙයි, ඔවුනට සිත නො ද නො උපන, නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්වයනට දූයි ඔවුනට සිත නො ද නිරුද්ධ වේ නොද උපනි.

තව ද යමක්හට සිත න උපනි නම් ඔහට සිත නිරුද්ධ නො වෙයි යත්: එසේ යි.

**නිරොධොත්පන්නවාර යි.**

7. යමක්හට සිත උපදී නම් ඔහට සිත උපන්නෙ යැ යත්: එසේ යි.

තව ද යමක්හට සිත උපන්නේ නම් ඔහට සිත උපදී ද යත් චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥ සත්‍වයනට දූයි ඔවුනට සිත උපන්නේ යැ, ඔවුනට සිත නො ද උපදී, චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උපන්නේ ද උපදිමින් සිටුනෙ ද වේ.

8. යමක්හට සිත නො උපදී නම් ඔහට සිත නො උපන්නේ ද යත්: උපන්නේ යි.

තව ද යමක්හට සිත නො උපන්නේ නම් ඔහට සිත නො උපදී ද යත්: නැති.

9. යමක්හට සිත උපදී නම් ඔහට සිත උපදින්නේ ද යත්: පශ්චිම චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උපදී, ඔවුනට සිත නො ද උපදින්නේ යැ, ඔවුන්ගෙන් සෙසුවනට චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි සිත උපදිමින් සිටුනේ ද උපදින්නේ ද වේ.

තව ද යමක්හට සිත උපදින්නේ නම් ඔහට සිත උපදී ද යත්: චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥ සත්‍වයනට දූයි ඔවුනට සිත උපදින්නේ යැ, ඔවුනට සිත නො ද උපදී, චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උපදින්නේ ද උපදිමින් සිටුනේ ද වේ.

10. යමක්හට සිත නො උපදී නම් ඔහට සිත නො උපදින්නේ ද යත්: චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට සිත නො උපදී, ඔවුනට සිත නො ද නො උපදින්නේ යැ, පශ්චිම චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නො ද උපදී, නො ද උපදින්නේ යි.

තව ද යමක්හට සිත නො උපදින්නේ නම් ඔහට සිත නො උපදී ද යත්: පශ්චිම චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත නො උපදින්නේ යැ, ඔවුනට සිත නො ද නො උපදී, පශ්චිම චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නො ද උපදින්නේ යැ. නො ද උපදී.

11. යස්ස චිත්තං උප්පජ්ජිත්ථ තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති: පච්ඡිමචිත්තසමඞ්ගීනං තෙසං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තෙසං චිත්තං උප්පජ්ජිස්සති, ඉතරෙසං තෙසං චිත්තං උප්පජ්ජිත්ථ චෙව උප්පජ්ජිස්සති ච.

යස්ස වා පන චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති: ආමන්තා.

12. යස්ස චිත්තං න උප්පජ්ජිත්ථ තස්ස චිත්තං න උප්පජ්ජිස්සතීති: නත්ථි.

යස්ස වා පන චිත්තං න උප්පජ්ජිස්සති තස්ස චිත්තං න උප්පජ්ජිත්ථාති: උප්පජ්ජිත්ථ.

උප්පාදවාරො.

13. යස්ස චිත්තං නිරුජ්ඣති තස්ස චිත්තං නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිත්ථ තස්ස චිත්තං නිරුජ්ඣතීති: චිත්තස්ස උප්පාදක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං නිරුජ්ඣිත්ථ, නො ච තෙසං චිත්තං නිරුජ්ඣති, චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣිත්ථ චෙව නිරුජ්ඣති ච.

14. යස්ස චිත්තං න නිරුජ්ඣති තස්ස චිත්තං න නිරුජ්ඣිත්ථාති: නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිත්ථ තස්ස චිත්තං න නිරුජ්ඣතීති: නත්ථි.

15. යස්ස චිත්තං නිරුජ්ඣති තස්ස චිත්තං නිරුජ්ඣිස්සතීති: පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣති, නො ච තෙස චිත්තං නිරුජ්ඣිස්සති, ඉතරෙසං චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣති, චෙව නිරුජ්ඣිස්සති ච.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති, තස්ස චිත්තං නිරුජ්ඣතීති, චිත්තස්ස උප්පාදක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං නිරුජ්ඣිස්සති, නො ච තෙසං චිත්තං නිරුජ්ඣති. චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣිස්සති චෙව නිරුජ්ඣති ච.

16. යස්ස චිත්තං න නිරුජ්ඣති තස්ස චිත්තං න නිරුජ්ඣිස්සතීති: නිරුජ්ඣිස්සති.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තස්ස චිත්තං න නිරුජ්ඣතීති: නිරුජ්ඣති.

11. යමක්හට සිත උපන්නේ නම් ඔහට සිත උපදින්නේ ද යත්: පශ්චිම චිත්තසමඞ්ගී වූ ඔවුනට සිත උපන්නේ යැ, ඔවුනට සිත නො ද උපදින්නේ යැ ඔවුන්ගෙන් සෙසුවනට සිත උපන්නේ ද වෙයි, උපදින්නේ ද වේ.

තව ද යමක්හට සිත උපදින්නේ නම් ඔහට සිත උපන්නේ ද යත්: එසේ යි.

12. යමක්හට සිත නො උපන්නේ නම් ඔහට සිත නො උපදින්නේ ද යත්; නැති.

තව ද යමක්හට සිත නො උපදින්නේ නම් ඔහට සිත නො උපන්නේ ද යත්: උපන්නේ යි.

උත්පාදවාරය යි.

13. යමක්හට සිත නිරුද්ධ වේ නම් ඔහට සිත නිරුද්ධ වී ද යත්: එසේ යි.

තව ද යමක්හට සිත නිරුද්ධ වී නම් ඔහට සිත නිරුද්ධ වේ ද යත්: චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට සිත නිරුද්ධ වී යැ, ඔවුනට සිත නො ද නිරුද්ධ වෙයි, චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ වූයේ ද නිරුද්ධ වෙමින් සිටුනේ ද වේ.

14. යමක්හට සිත නිරුද්ධ නො වේ නම් ඔහට සිත නිරුද්ධ නො වී ද යත්: නිරුද්ධ වී යැ.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වී නම් ඔහට සිත නිරුද්ධ නො වේ ද යත්: නැති.

15. යමක්හට සිත නිරුද්ධ වේ නම් ඔහට සිත නිරුද්ධ වන්නේ ද යත්: පශ්චිම චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ වෙයි, ඔවුනට සිත නො ද නිරුද්ධ වන්නේ යැ, ඔවුන්-ගෙන් සෙසුවනට චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි සිත නිරුද්ධ වෙමින් සිටුනෙ ද නිරුද්ධ වන්නේ ද වේ.

තව ද යමක්හට සිත නිරුද්ධ වන්නේ නම් ඔහට සිත නිරුද්ධ වේ ද යත්: චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට සිත නිරුද්ධ වන්නේ යැ, ඔවුනට සිත නො ද නිරුද්ධ වෙයි, චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ වන්නේ ද නිරුද්ධ වෙමින් සිටුනේ ද වේ.

16. යමක්හට සිත නිරුද්ධ නො වේ නම් ඔහට සිත නිරුද්ධ නො වන්නේ ද යත්: නිරුද්ධ වන්නේ යි.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වන්නේ නම් ඔහට සිත නිරුද්ධ නො වේ ද යත්: නිරුද්ධ වේ.

17. යස්ස චිත්තං නිරුජ්ඣිත්ථ තස්ස චිත්තං නිරුජ්ඣිස්සතීති: පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣිත්ථ, නො ච තෙසං චිත්තං නිරුජ්ඣිස්සති, ඉතරෙසං තෙසං චිත්තං නිරුජ්ඣිත්ථ චෙව නිරුජ්ඣිස්සති ච.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති තස්ස චිත්තං නිරුජ්ඣිත්ථාති: ආමන්තා:

18. යස්ස චිත්තං න නිරුජ්ඣිත්ථ තස්ස චිත්තං න නිරුජ්ඣිස්සතීති: නත්ථි.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තස්ස චිත්තං න නිරුජ්ඣිත්ථාති: නිරුජ්ඣිත්ථ.

## නිරොධවාරො.

19. යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිත්ථ තස්ස චිත්තං උප්පජ්ජතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං නිරුජ්ඣිත්ථ, නො ච තෙසං චිත්තං උප්පජ්ජති, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣිත්ථ චෙව උප්පජ්ජති ච.

20. යස්ස චිත්තං න උප්පජ්ජති තස්ස චිත්තං න නිරුජ්ඣිත්ථාති: නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිත්ථ තස්ස චිත්තං න උප්පජ්ජතීති: නත්ථි.

21. යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං නිරුජ්ඣිස්සතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති තස්ස චිත්තං උප්පජ්ජතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං නිරුජ්ඣිස්සති, නො ච තෙසං චිත්තං උප්පජ්ජති, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං නිරුජ්ඣිස්සති චෙව උප්පජ්ජති ච.

22. යස්ස චිත්තං න උප්පජ්ජති තස්ස චිත්තං න නිරුජ්ඣිස්සතීති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න උප්පජ්ජති, නො ච තෙසං චිත්තං න නිරුජ්ඣිස්සති, පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං න චෙව උප්පජ්ජති, න ච නිරුජ්ඣිස්සති.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තස්ස චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

17. යමක්හට සිත නිරුද්ධ වී නම් ඔහට සිත නිරුද්ධ වන්නේ ද යත්: පශ්චිම චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ වීය, ඔවුනට සිත නො ද නිරුද්ධ වන්නේ ය, ඔවුන්ගෙන් සෙසුවනට සිත නිරුද්ධ වූයේ ද නිරුද්ධ වන්නේ ද වේ.

තව ද යමක්හට සිත නිරුද්ධ වන්නේ නම් ඔහට සිත නිරුද්ධ වී ද යත්: එසේ යි.

18. යමක්හට සිත නිරුද්ධ නො වී නම් ඔහට සිත නිරුද්ධ නො වන්නේ ද යත්: නැති.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වන්නේ නම් ඔහට සිත නිරුද්ධ වී ද යත්: නිරුද්ධ වීය.

**නිරොධවාර යි.**

19. යමක්හට සිත උපදී නම් ඔහට සිත නිරුද්ධ වී ද යත්: එසේ යි.

තව ද යමක්හට සිත නිරුද්ධ වී නම් ඔහට සිත උපදී ද යත්: චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්ත්වයනට දැයි ඔවුනට සිත නිරුද්ධ වීය, ඔවුනට සිත නො ද උපදී, චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ වූයේ ද උපදිමින් සිටුනේ ද වේ.

20. යමක්හට සිත නො උපදී නම් ඔහට සිත නිරුද්ධ නො වී ද යත්: නිරුද්ධ වීය.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වී නම් ඔහට සිත නො උපදී ද යත්: නැති.

21. යමක්හට සිත උපදී නම් ඔහට සිත නිරුද්ධ වන්නේ ද යත්: එසේ යි.

තව ද යමක්හට සිත නිරුද්ධ වන්නේ නම් ඔහට සිත උපදී ද යත්: චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්ත්වයනට දැයි ඔවුනට සිත නිරුද්ධ වන්නේ ය, ඔවුනට සිත නො ද උපදී, චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ඔවුනට සිත නිරුද්ධ වන්නේ ද උපදිමින් සිටුනේ ද වේ.

22. යමක්හට සිත නූපදී නම් ඔහට සිත නිරුද්ධ නො වන්නේ ද යත්: චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්ත්වයනට දැයි ඔවුනට සිත නො උපදී, ඔවුනට සිත නො ද නිරුද්ධ නො වන්නේ ය, පශ්චිම චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට සිත නො උපදනේ ද නො නිරුද්ධ වන්නේ ද වේ.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වන්නේ නම් ඔහට සිත නො උපදී ද යත්: එසේ යි.

23. යස්ස චිත්තං උප්පජ්ජිත්ථ තස්ස චිත්තං නිරුජ්ඣිස්සතීති: පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තෙසං චිත්තං නිරුජ්ඣිස්සති. ඉතරෙසං තෙසං චිත්තං උප්පජ්ජිත්ථ චෙව, නිරුජ්ඣිස්සති ච.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣිස්සති තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති: ආමන්තා.

24. යස්ස චිත්තං න උප්පජ්ජිත්ථ තස්ස චිත්තං න නිරුජ්ඣිස්සතීති: නත්ථි.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තස්ස චිත්තං න උප්පජ්ජිත්ථාති: උප්පජ්ජිත්ථ.

## උප්පාදනිරොධවාරො.

25. යස්ස චිත්තං උප්පජ්ජති තස්ස චිත්තං න නිරුජ්ඣතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣති තස්ස චිත්තං උප්පජ්ජතීති: නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න නිරුජ්ඣති, නො ච තෙසං චිත්තං උප්පජ්ජති, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං න නිරුජ්ඣති චෙව උප්පජ්ජති ච.

26. යස්ස චිත්තං න උප්පජ්ජති තස්ස චිත්තං නිරුජ්ඣතීති: නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න උප්පජ්ජති, නො ච තෙසං චිත්තං නිරුජ්ඣති, චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං න උප්පජ්ජති චෙව නිරුජ්ඣති ච.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣති තස්ස චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

## උප්පජ්ජමාන න නිරොධවාරො.

27. යස්ස චිත්තං උප්පජ්ජමානං තස්ස චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජමානන්ති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං, නො ච තෙසං චිත්තං උප්පජ්ජමානං, චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං චෙව උප්පජ්ජමානඤ්ච.

28. යස්ස චිත්තං න උප්පජ්ජමානං තස්ස චිත්තං න උප්පන්නන්ති: චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං න උප්පජ්ජමානං, නො ච තෙසං චිත්තං න උප්පන්නං, නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න චෙව උප්පජ්ජමානං න ච උප්පන්නං.

යස්ස වා පන චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න උප්පජ්ජමානන්ති: ආමන්තා.

## උප්පජ්ජමානුප්පන්නවාරො.

23. යම්කිසිහට සිත උපන්නේ නම් ඔහට සිත නිරුද්ධ වන්නේ ද යත්: පශ්චිම චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත උපන්නේ ය, ඔවුනට සිත නො ද නිරුද්ධ වන්නේ ය. ඔවුන්ගෙන් සෙසුවනට සිත උපන්නේ ද වෙයි, නිරුද්ධ වන්නේ ද වේ.

තව ද යම්කිසිහට සිත නිරුද්ධ වන්නේ නම් ඔහට සිත උපන්නේ ද යත්: එසේ යි.

24. යමක්හට සිත නො උපන්නේ නම් ඔහට සිත නිරුද්ධ නො වන්නේ ද යත්: නැති.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වන්නේ නම් ඔහට සිත නො උපන්නේ ද යත්: උපන්නේ යි.

උත්පාද නිරොධවාර යි.

25. යමක්හට සිත උපදී නම් ඔහට සිත නිරුද්ධ නො වේ ද යත්: එසේ යි.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වේ නම් ඔහට සිත උපදී ද යත්: නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට සිත නිරුද්ධ නො වේ, ඔවුනට සිත නො ද උපදී, සිත උපන් කෙණෙහි ඔවුනට සිත නො නිරුද්ධ වන්නේ ද උපදනේ ද වේ.

26. යමක්හට සිත නො උපදී නම් ඔහට සිත නිරුද්ධ වේ ද යත්: නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට සිත නො ද උපදී, ඔවුනට සිත නො ද නිරුද්ධ වෙයි, චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත නො උපදිමින් සිටුනෙ ද නිරුද්ධ වෙමින් සිටුනෙ ද වේ.

තව ද යමක්හට සිත නිරුද්ධ නො වේ නම් ඔහට සිත නො උපදී ද යත්: එසේ යි.

උත්පද්‍යමාන න නිරොධවාර යි.

27. යමක්හට සිත උපදිමින් පවතී නම් ඔහට සිත උපනි ද යත්: එසේ යි.

තව ද යමක්හට සිත උපනි නම් ඔහට සිත උපදිමින් පවතී ද යත්: චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත උපනි, ඔවුනට සිත නො ද උපදිමින් පවතී. චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උපන්නෙ ද උපදිමින් සිටුනෙ ද වේ.

28. යමක්හට සිත උපදිමින් නො පවතී නම් ඔහට සිත නො උපනි යත්: චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත උපදිමින් සිටුනෙ නො වෙයි, සිත නො ද නූපන්නෙ යැ, නිරොධයට සමවන්නවුනට ද අසංඥසත්‍වයනට දූයි ඔවුනට සිත නො ද උපදිමින් සිටුනෙ යැ නො ද උපන්නෙ යැ.

තව ද යමක්හට සිත නූපන්නේ නම් ඔහට සිත උපදිමින් සිටුනෙ නො වෙයි යත්: එසේ යි.

උත්පද්‍යමානොත්පන්නවාර යි.

29. යස්ස චිත්තං නිරුජ්ඣමානං තස්ස චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පන්නං තස්ස චිත්තං නිරුජ්ඣමානන්ති: චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං, නො ච තෙසං චිත්තං නිරුජ්ඣමානං, චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං චිත්තං උප්පන්නං චෙව නිරුජ්ඣමානඤ්ච.

30. යස්ස චිත්තං න නිරුජ්ඣමානං තස්ස චිත්තං න උප්පන්නන්ති: චිත්තස්ස උප්පාදක්ඛණෙ තෙසං චිත්තං න නිරුජ්ඣමානං, නො ච තෙසං චිත්තං න උප්පන්නං, නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං න චෙව නිරුජ්ඣමානං, න ච උප්පන්නං.

යස්ස වා පන චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න නිරුජ්ඣමානන්ති: ආමන්තා.

නිරුජ්ඣමානුප්පන්නවාරො.

31. යස්ස චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පජ්ජිත්ථ තස්ස චිත්තං උප්පන්නන්ති: නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං උප්පජ්ජිත්ථ, නො ච තෙසං චිත්තං උප්පන්නං, චිත්තසමඞ්ගීනං තෙසං චිත්තං උප්පජ්ජිත්ථ චෙව උප්පන්නඤ්ච.

32. යස්ස චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න උප්පජ්ජිත්ථාති: උප්පජ්ජිත්ථ.

යස්ස වා පන චිත්තං න උප්පජ්ජිත්ථ තස්ස චිත්තං න උප්පන්නන්ති: නත්ථි.

33. යස්ස චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති: පච්ඡිමචිත්තසමඞ්ගීනං තෙසං චිත්තං උප්පන්නං, නො ච තෙසං චිත්තං උප්පජ්ජිස්සති, ඉතරෙසං චිත්තසමඞ්ගීනං තෙසං චිත්තං උප්පන්නඤ්චෙව උප්පජ්ජිස්සති ච.

යස්ස වා පන චිත්තං උප්පජ්ජිස්සති තස්ස චිත්තං උප්පන්නන්ති: නිරොධසමාපන්නානං අසඤ්ඤසත්තානං තෙසං චිත්තං උප්පජ්ජිස්සති, නො ච තෙසං චිත්තං උප්පන්නං, චිත්තසමඞ්ගීනං තෙසං චිත්තං උප්පජ්ජිස්සති චෙව උප්පන්නඤ්ච.

34. යස්ස චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න උප්පජ්ජිස්සතීති: උප්පජ්ජිස්සති.

යස්ස වා පන චිත්තං න උප්පජ්ජිස්සති තස්ස චිත්තං න උප්පන්නන්ති: උප්පන්නං.

උප්පන්නුප්පාදවාරො.

29. යමක්හට සිත නිරුධ්‍යමාන (නිරුද්ධ වෙමින් සිටුනෙ) නම් ඔහට සිත උත්පන්න (ඉපැදසිටියෙ) වෙයි යත්: එසේ යි.

තව ද යමක්හට සිත උත්පන්න වේ නම් ඔහට සිත නිරුධ්‍යමාන වෙයි යත්: චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත උත්පන්න වෙයි, ඔවුනට සිත නො ද නිරුධ්‍යමාන වෙයි, චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ඔවුනට සිත උත්පන්න ද නිරුධ්‍යමාන ද වේ.

30. යමක්හට සිත නිරුධ්‍යමාන නො වේ නම් ඔහට සිත උත්පන්න නො වෙයි යත්: චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ඔවුනට සිත නිරුධ්‍යමාන නො වෙයි, ඔවුනට සිත නො ද නොත්පන්න වෙයි, නිරොධසමාපන්නයනට ද අසංඥසත්ත්වයනට දූයි ඔවුනට සිත නො ද නිරුධ්‍යමාන වෙයි, නො ද උත්පන්න වෙයි.

තව ද යමක්හට සිත උත්පන්න නො වේ නම් ඔහට සිත නිරුධ්‍යමාන නො වෙයි යත්: එසේ යැ.

**නිරුධ්‍යමානොත්පන්නවාර යි.**

31. යමක්හට සිත උත්පන්න වේ නම් ඔහට සිත උපන්නෙ යැ යත්: එසේ යි.

තව ද යමක්හට සිත උපන්නෙ නම් ඔහට සිත ඉපැද සිටුනෙ යැ යත්: නිරොධ සමාපන්නයනට ද අසංඥසත්ත්වයනට දූයි ඔවුනට සිත උපන, ඔවුනට සිත නො උත්පන්න වෙයි, චිත්තසමඞ්ගී වූ ඔවුනට සිත උපන්නෙ ද ඉපැද සිටුනෙ ද වේ.

32. යමක්හට සිත උත්පන්න නො වේ නම් ඔහට සිත නූපන යත්: උපන.

තවද යමක්හට සිත නූපන්නෙ නම් ඔහට සිත ඉපැද සිටුනෙ නො වෙයි යත්: නැති.

33. යමක්හට සිත ඉපැදසිටුනෙ නම් ඔහට සිත (මතු) උපදනෙ යැ යත්: පශ්චිම චිත්තසමඞ්ගී වූ ඔවුනට සිත ඉපැද සිටුනෙ යැ, ඔවුනට සිත නො ද (මතු) උපදනෙ යැ, සෙසු චිත්තසමඞ්ගී වූ ඔවුනට ඉපැදසිටුනෙ ද (මතු) උපදනෙ ද වෙයි.

තව ද යමක්හට සිත (මතු) උපදනෙ නම් ඔහට සිත උත්පන්න වී ද යත්: නිරොධ සමාපන්නයනට ද අසංඥසත්ත්වයනට දූයි ඔවුනට සිත (මතු) උපදනෙ යැ, ඔවුනට සිත නො ද උත්පන්න වෙයි, චිත්තසමඞ්ගී වූ ඔවුනට සිත උපදනෙ ද ඉපැදසිටුනෙ ද වේ.

34. යමක්හට සිත උත්පන්න නො වේ නම් ඔහට සිත නූපදනෙ යැ යත්: උපදනෙ යැ.

තව ද යමක්හට සිත නූපදනෙ නම් ඔහට සිත උත්පන්න නො වේ යත්: උත්පන්න වේ.

**උත්පන්නොත්පාදවාර යි.**

35. යස්ස චිත්තං උප්පජ්ජිත්ථ නො ච තස්ස චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජිස්සතීති: ආමන්තා.

යස්ස වා පන චිත්තං උප්පජ්ජිස්සති නො ච තස්ස චිත්තං උප්පන්නං තස්ස චිත්තං උප්පජ්ජිත්ථාති: ආමන්තා.

36. යස්ස චිත්තං න උප්පජ්ජිත්ථ නො ච තස්ස චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න උප්පජ්ජිස්සතීති: නත්ථි.

යස්ස වා පන චිත්තං න උප්පජ්ජිස්සති නො ච තස්ස චිත්තං න උප්පන්නං තස්ස චිත්තං න උප්පජ්ජිත්ථාති: උප්පජ්ජිත්ථ.

අතීතානාගතවාරො.

37. උප්පන්නං උප්පජ්ජමානන්ති: භඞ්ගක්ඛණෙ උප්පන්නං නො ච උප්පජ්ජමානං උප්පාදක්ඛණෙ උප්පන්නංචෙව උප්පජ්ජමානඤ්ච.

උප්පජ්ජමානං උප්පන්නන්ති: ආමන්තා.

38. න උප්පන්නං න උප්පජ්ජමානන්ති: ආමන්තා.

න උප්පජ්ජමානං න උප්පන්නන්ති: භඞ්ගක්ඛණෙ න උප්පජ්ජමානං නො ච න උප්පන්නං අතීතානාගතචිත්තං න චෙව උප්පජ්ජමානං න ච උප්පන්නං.

උප්පන්නුප්පජ්ජමානවාරො.

39. නිරුද්ධං නිරුජ්ඣමානන්ති: නො

නිරුජ්ඣමානං නිරුද්ධන්ති: නො.

40. න නිරුද්ධං න නිරුජ්ඣමානන්ති: භඞ්ගක්ඛණෙ න නිරුද්ධං නො ච න නිරුජ්ඣමානං. උප්පාදක්ඛණෙ අනාගතඤ්ච චිත්තං න චෙව නිරුද්ධං, න ච නිරුජ්ඣමානං.

න නිරුජ්ඣමානං, න නිරුද්ධන්ති: අතීතං චිත්තං න නිරුජ්ඣ-මානං, නො ච න නිරුද්ධං, උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව නිරුජ්ඣමානං න ච නිරුද්ධං.

නිරුද්ධ නිරුජ්ඣමානවාරො.

35. යමක්හට සිත ඉපැද නිරුද්ධ වී නම් ඔහට සිත නො ද ඉපැද සිටුනෙ වේ නම් ඔහට සිත උපදනෙ යැ යත්: එසේ යි.

තව ද යමක්හට සිත (මතු) උපදනෙ නම් ඔහට සිත නො ද ඉපැද සිටුනෙ නම් ඔහට සිත ඉපැද නිරුද්ධ වී යත්: එසේ යි.

36. යමක්හට සිත ඉපැද නිරුද්ධ නො වී නම් ඔහට සිත නො ද නොත්පන්න වී නම් ඔහට සිත නූපදනෙ යැ යත්: නැත.

තව ද යමක්හට සිත නූපදනෙ නම් ඔහට සිත නො ද නොත්පන්න වේ නම් ඔහට සිත ඉපැද නිරුද්ධ නො වී යත්: ඉපැද නිරුද්ධ වී.

**අතීතානාගතවාර යි.**

37. උත්පන්න වූයෙ උත්පද්‍යමාන වෙයි යත්: භඞ්ගක්‍ෂණයෙහි උත්පන්න වෙයි, නො ද උත්පද්‍යමාන වෙයි, උත්පාදක්‍ෂණයෙහි උත්පන්න ද උත්පද්‍යමාන ද වේ.

උත්පද්‍යමාන වූයෙ උත්පන්න වෙයි යත්: එසේ යි.

38. උත්පන්න නො වූයෙ උත්පද්‍යමාන නො වෙයි යත්: එසේ යි.

උත්පද්‍යමාන නො වූයෙ උත්පන්න නො වෙයි යත්: භඞ්ගක්‍ෂණයෙහි උත්පද්‍යමාන නො වෙයි, නො ද නොත්පන්න වෙයි, අතීතානාගත සිත නො ද උත්පද්‍යමාන යැ, නො ද උත්පන්න යි.

**උත්පන්නොත්පද්‍යමානවාර යි.**

39. නිරුද්ධ වූයෙ නිරුධ්‍යමාන වෙයි යත්: නැත.

නිරුද්ධ්‍යමාන වූයේ නිරුද්ධ වෙයි යත්: නැත.

40. නිරුද්ධ නො වූයෙ නිරුධ්‍යමාන නො වෙයි යත්: භඞ්ගක්‍ෂණයෙහි නිරුද්ධ වූයෙ නො වෙයි. නො ද නිරුධ්‍යමාන නො වූයෙ වෙයි. උත්පාදක්‍ෂණයෙහි අනාගත සිත ද නො ද නිරුද්ධ යැ, නො ද නිරුධ්‍යමාන යි.

නිරුධ්‍යමාන නො වූයෙ නිරුද්ධ නො වෙයි යත්: අතීත චිත්තය නිරුධ්‍යමාන නො වෙයි, නො ද නිරුද්ධ නො වූයෙ වෙයි, උත්පාදක්‍ෂණයෙහි අනාගත සිත ද නො ද නිරුධ්‍යමාන යැ නො ද නිරුද්ධ යි.

**නිරුද්ධ නිරුධ්‍යමානවාර යි.**

41. යස්ස චිත්තං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස චිත්තන්ති: භඞ්ගක්ඛණෙ චිත්තං උප්පාදක්ඛණං වීතික්කන්තං භඞ්ගක්ඛණං අවීතික්කන්තං, අතීතං චිත්තං උප්පාදක්ඛණං ච වීතික්කන්තං භඞ්ගක්ඛණං ච වීතික්කන්තං.

යස්ස වා පන චිත්තං නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස චිත්තන්ති: අතීතං චිත්තං.

42. යස්ස චිත්තං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං න නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස චිත්තන්ති: උප්පාදක්ඛණෙ අනාගතං චිත්තං.

යස්ස වා පන චිත්තං න නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං න උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තස්ස චිත්තන්ති: භඞ්ගක්ඛණෙ චිත්තං භඞ්ගක්ඛණං අවීතික්කන්තං, නො ච උප්පාදක්ඛණං අවීතික්කන්තං, උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං. භඞ්ගක්ඛණං ච අවීතික්කන්තං, උප්පාදක්ඛණං ච අවීතික්කන්තං.

**අතික්කන්තකාලවාරො.**

## ධම්මවාරො

43. යං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣති තං චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සතීති: ආමන්තා.

යං වා පන චිත්තං නිරුජ්ඣිස්සති න උප්පජ්ජිස්සති තං චිත්තං උප්පජ්ජති න නිරුජ්ඣතීති: ආමන්තා.

44. යං චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣති තං චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සතීති: නො.

යං වා පන චිත්තං න නිරුජ්ඣිස්සති උප්පජ්ජිස්සති තං චිත්තං න උප්පජ්ජති නිරුජ්ඣතීති: නත්ථි.

**උප්පාද නිරොධකාලසම්භෙදවාරො.**

45. යං චිත්තං උප්පජ්ජති තං චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යං වා පන චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජතීති, භඞ්ගක්ඛණෙ චිත්තං උප්පන්නං, නො ච තං චිත්තං උප්පජ්ජති උප්පාදක්ඛණෙ චිත්තං උප්පන්නං චෙව උප්පජ්ජති ච.

41. යමක්හට සිත උත්පාදක්‍ෂණය ක්‍ෂණමාත්‍රයක් ඉක්මැගිය අතීතකාල වේ නම් නිරොධක්‍ෂණය ක්‍ෂණමාත්‍රයක් ඉක්මැගිය අතීතකාල වේ නම් ඔහට සිත අතීතකාල වෙයි යත්: භඞ්ගක්‍ෂණයෙහි සිත උත්පාදක්‍ෂණය ඉක්මැගියෙ යැ, භඞ්ගක්‍ෂණය නො ඉක්මැගියෙ යැ, අතීත චිත්තය උත්පාදක්‍ෂණය ද ඉක්මැගියෙ යැ, භඞ්ගක්‍ෂණය ද ඉක්මැගියෙ යි.

තවද යමක්හට සිත නිරොධක්‍ෂණය ක්‍ෂණමාත්‍රයක් ඉක්මැගිය අතීතකාල වේ නම් උත්පාදක්‍ෂණය ක්‍ෂණමාත්‍රයක් ඉක්මැගිය අතීතකාල වේ නම් ඔහට සිත අතීත වෙයි යත්: අතීත සිත වෙයි.

42. යමක්හුගේ සිත උපදමින් පවත්නා කෙණෙහි නො වූයේ ක්‍ෂණයක් ඉක්මුණක් වැ ඉක්මගිය කල් ඇත්තේ නම් ඔහුගේ සිත නිරුද්ධ වෙමින් පවත්නා කෙණෙහි නො වූයේ ක්‍ෂණයක් ඉක්මුණක් වැ ඉක්මගිය කල් ඇත්තේ වේ ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත අනාගත යැ.

තව ද යමක්හුගේ සිත නිරුද්ධ වෙමින් පවත්නා කෙණෙහි නොවූයේ ක්‍ෂණයක් ඉක්මුණක් වැ ඉක්ම ගිය කල් ඇත්තේ නම් ඔහුගේ සිත උපදමින් පවත්නා කෙණෙහි නොවූයේ ක්‍ෂණයක් ඉක්මුණක් වැ ඉක්ම ගිය කල් ඇත්තේ ද යත්: භඞ්ගක්‍ෂණයෙහි සිත භඞ්ගක්‍ෂණය නො ඉක්ම වී යැ, උත්පාදක්‍ෂණය නො ද නො ඉක්ම වී යැ. උත්පාදක්‍ෂණයෙහි සිත අනාගත ද වෙ යි. භඞ්ගක්‍ෂණය ද නො ඉක්ම වී ය, උත්පාදක්‍ෂණය ද නො ඉක්ම වී යැ.

**අතික්‍රාන්තකාලවාර යි.**

## ධර්මවාරය

43. යම් සිතෙක් උපදී නම් නිරුද්ධ නො වේ නම් ඒ සිත් නිරුද්ධ වන්නේ ද නො උපදින්නේ ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් නො උපදින්නේ නම් ඒ සිත උපදී ද නිරුද්ධ නො වේ ද යත්: එසේ යි.

44. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නිරුද්ධ නො වන්නේ ද උපදින්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් උපදින්නේ නම් ඒ සිත නො උපදී ද නිරුද්ධ වේ ද යත්: නැති.

**උත්පාද නිරොධකාලසම්භෙදවාර යි.**

45. යම් සිතෙක් උපදී නම් ඒ සිත උපනි යත්: එසේ යි.

තව ද යම් සිතෙක් උපන්නේ නම් ඒ සිත උපදී ද යත්: භඞ්ගක්‍ෂණයෙහි සිත උපනි, ඒ සිත නො ද උපදී, උත්පාදක්‍ෂණයෙහි සිත උපන්නේ ද වේ, උපදී ද වේ.

46. යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං න උප්පන්නන්ති: භඞ්ගක්ඛණෙ චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං න උප්පන්නං, අතීතානාගතං චිත්තං න චෙව උප්පජ්ජති, න ච උප්පන්නං.

යං වා පන චිත්තං න උප්පන්නං තං චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

**උප්පාදුප්පන්නවාරො.**

47. යං චිත්තං නිරුජ්ඣති තං චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යං වා පන චිත්තං උප්පන්නං තං චිත්තං නිරුජ්ඣතීති: උප්පාදක්ඛණෙ චිත්තං උප්පන්නං, නො ච තං චිත්තං නිරුජ්ඣති, භඞ්ගක්ඛණෙ චිත්තං උප්පන්නං චෙව නිරුජ්ඣති ච.

48. යං චිත්තං න නිරුජ්ඣති තං චිත්තං න උප්පන්නන්ති: උප්පාදක්ඛණෙ චිත්තං න නිරුජ්ඣති, නො ච තං චිත්තං න උප්පන්නං, අතීතානාගතං චිත්තං න චෙව නිරුජ්ඣති න ච උප්පන්නං.

යං වා පන චිත්තං න උප්පන්නං තං චිත්තං න නිරුජ්ඣතීති: ආමන්තා.

**නිරොධුප්පන්නවාරො.**

49. යං චිත්තං උප්පජ්ජති තං චිත්තං උප්පජ්ජිත්ථාති: නො.

යං වා පන චිත්තං උප්පජ්ජිත්ථ තං චිත්තං උප්පජ්ජතීති: නො.

50. යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං න උප්පජ්ජිත්ථාති: අතීතං චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං න උප්පජ්ජිත්ථ, භඞ්ගක්ඛණෙ අනාගතං චිත්තං න චෙව උප්පජ්ජති, න ච උප්පජ්ජිත්ථ.

යං වා පන චිත්තං න උප්පජ්ජිත්ථ තං චිත්තං න උප්පජ්ජතීති: උප්පාදක්ඛණෙ චිත්තං න උප්පජ්ජිත්ථ, නො ච තං චිත්තං න උප්පජ්ජති. භඞ්ගක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව උප්පජ්ජිත්ථ, න ච උප්පජ්ජති.

51. යං චිත්තං උප්පජ්ජති තං චිත්තං උප්පජ්ජිස්සතීති: නො.

යං වා පන චිත්තං උප්පජ්ජිස්සති තං චිත්තං උප්පජ්ජතීති: නො.

52. යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං න උප්පජ්ජිස්සතීති: අනාගතං චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං න උප්පජ්ජිස්සති, භඞ්ගක්ඛණෙ අතීතං ච චිත්තං න චෙව උප්පජ්ජති, න ච උප්පජ්ජිස්සති.

යං වා පන චිත්තං න උප්පජ්ජිස්සති තං චිත්තං න උප්පජ්ජතීති: උප්පාදක්ඛණෙ චිත්තං න උප්පජ්ජිස්සති, නො ච තං චිත්තං න උප්පජ්ජති, භඞ්ගක්ඛණෙ අතීතං ච චිත්තං න චෙව උප්පජ්ජිස්සති, න ච උප්පජ්ජති.

46. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නො උපනි ද යත්: භඞ්ගක්‍ෂණයෙහි සිත නො උපදී, ඒ සිත නො ද නො උපනි, අතීතානාගත සිත නො ද උපදී. නො උපනි ද වේ.

තව ද යම් සිතෙක් නො උපනි නම් ඒ සිත නො උපදී ද යත්: එසේ යි.

## උත්පාදොත්පන්නවාර යි.

47. යම් සිතෙක් නිරුද්ධ වේ නම් ඒ සිත උපනි ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් උපනි නම් ඒ සිත නිරුද්ධ වේ ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත උපනි, ඒ සිත නො ද නිරුද්ධ වේ, භඞ්ගක්‍ෂණයෙහි සිත උපනි ද වෙ යි, නිරුද්ධ ද වේ.

48. යම් සිතෙක් නිරුද්ධ නො වේ නම් ඒ සිත නො උපනි ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත නිරුද්ධ නො වේ, ඒ සිත නො ද නො උපනි, අතීතානාගත වූ සිත නො ද නිරුද්ධ වෙ යි. නො ද උපනි ද වේ.

තව ද යම් සිතෙක් නො උපනි නම් ඒ සිත නිරුද්ධ නො වේ ද යත්: එසේ යි.

## නිරොධොත්පන්නවාර යි.

49. යම් සිතෙක් උපදී නම් ඒ සිත උපන්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් උපන්නේ නම් ඒ සිත උපදී ද යත්: නැති.

50. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නො උපන්නේ ද යත්: අතීත වූ සිත නො උපදී, ඒ සිත නො ද නො උපන්නේ යැ, භඞ්ගක්‍ෂණයෙහි අනාගත වූ සිත නො ද උපදී, නො ද උපන්නේ යි.

තව ද යම් සිතෙක් නො උපන්නේ නම් ඒ සිත නො උපදී ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත නො උපන්නේ යැ, ඒ සිත නො ද නො උපදී, භඞ්ගක්‍ෂණයෙහි අනාගත වූ සිත නො ද නො උපන්නේ යි. නො ද උපදී.

51. යම් සිතෙක් උපදී නම් ඒ සිත උපදින්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් උපදින්නේ නම් ඒ සිත උපදී ද යත්: නැති.

52. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නො උපන්නෝ ද යත්: අනාගත වූ සිත නො උපදී, ඒ සිත නො ද නො උපදින්නේ යැ, භඞ්ගක්‍ෂණයෙහි අතීත වූ සිත ද නො ද උපදී යි. නො ද උපදින්නේ යි.

තව ද යම් සිතෙක් නො උපදින්නේ නම් ඒ සිත නො උපදී ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත නො උපදින්නේ යැ, ඒ නො ද නො උපදී, භඞ්ගක්‍ෂණයෙහි අතීත වූ සිත ද නො ද උපදින්නේ යි. නො උපදී ද වේ.

53. යං චිත්තං උප්පජ්ජිත්ථ තං චිත්තං උප්පජ්ජිස්සතීති: නො.

යං වා පන චිත්තං උප්පජ්ජිස්සති තං චිත්තං උප්පජ්ජිත්ථාති: නො.

54. යං චිත්තං න උප්පජ්ජිත්ථ තං චිත්තං න උප්පජ්ජිස්සතීති: අනාගතං චිත්තං න උප්පජ්ජිත්ථ, නො ච තං චිත්තං න උප්පජ්ජිස්සති. පච්චුප්පන්නං චිත්තං න චෙව උප්පජ්ජිත්ථ, න ච උප්පජ්ජිස්සති.

යං වා පන චිත්තං න උප්පජ්ජිස්සති තං චිත්තං න උප්පජ්ජිත්ථාති: අතීතං චිත්තං න උප්පජ්ජිස්සති, නො ච තං චිත්තං න උප්පජ්ජිත්ථ, පච්චුප්පන්නං චිත්තං න චෙව උප්පජ්ජිස්සති, න ච උප්පජ්ජිත්ථ.

උප්පාදවාරො.

55. යං චිත්තං නිරුජ්ඣති තං චිත්තං නිරුජ්ඣිත්ථාති: නො.

යං වා පන චිත්තං නිරුජ්ඣිත්ථ තං චිත්තං නිරුජ්ඣතීති: නො.

56. යං චිත්තං න නිරුජ්ඣති තං චිත්තං න නිරුජ්ඣිත්ථාති: අතීතං චිත්තං න නිරුජ්ඣති, නො ච තං චිත්තං න නිරුජ්ඣිත්ථ, උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව නිරුජ්ඣති, න ච නිරුජ්ඣිත්ථ.

යං වා පන චිත්තං න නිරුජ්ඣිත්ථ තං චිත්තං න නිරුජ්ඣතීති: භඞ්ගක්ඛණෙ චිත්තං න නිරුජ්ඣිත්ථ, නො ච තං චිත්තං න නිරුජ්ඣති, උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව නිරුජ්ඣිත්ථ, න ච නිරුජ්ඣති.

57. යං චිත්තං නිරුජ්ඣති තං චිත්තං නිරුජ්ඣිස්සතීති: නො.

යං වා පන චිත්තං නිරුජ්ඣිස්සති තං චිත්තං නිරුජ්ඣතීති: නො.

58. යං චිත්තං න නිරුජ්ඣති තං චිත්තං න නිරුජ්ඣිස්සතීති: උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න නිරුජ්ඣති, නො ච තං චිත්තං න නිරුජ්ඣිස්සති, අතීතං චිත්තං න චෙව නිරුජ්ඣති, න ච නිරුජ්ඣිස්සති.

යං වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තං චිත්තං න නිරුජ්ඣතීති: භඞ්ගක්ඛණෙ චිත්තං න නිරුජ්ඣිස්සති, නො ච තං චිත්තං න නිරුජ්ඣති, අතීතං චිත්තං න චෙව නිරුජ්ඣිස්සති, න ච නිරුජ්ඣති.

59. යං චිත්තං නිරුජ්ඣිත්ථ තං චිත්තං නිරුජ්ඣිස්සතීති: නො.

යං වා පන චිත්තං නිරුජ්ඣිස්සති තං චිත්තං නිරුජ්ඣිත්ථාති: නො.

53. යම් සිතෙක් උපන්නේ නම් ඒ සිත උපදින්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් උපදින්නේ නම් ඒ සිත උපන්නේ ද යත්: නැති.

54. යම් සිතෙක් නො උපන්නේ නම් ඒ සිත නො උපන්නේ ද යත්: අනාගත වූ සිත නො උපන්නේ යැ, ඒ සිත නො ද නො උපදින්නේ යැ, ප්‍රත්‍යුත්පන්න වූ සිත නො ද උපන්නේ යැ නො ද උපදින්නේ යි.

තව ද යම් සිතෙක් නො උපදින්නේ නම් ඒ සිත නො උපන්නේ ද යත්: අතීත වූ සිත නො උපදින්නේ යැ, ඒ සිත නො ද නො උපන්නේ යැ, ප්‍රත්‍යුත්පන්න වූ සිත නො ද උපදින්නේ යැ. නො ද උපන්නේ යි.

## උත්පාදවාර යි.

55. යම් සිතෙක් නිරුද්ධ වේ නම් ඒ සිත නිරුද්ධ වී ද යත්: නැති.

තව ද යම් සිතෙක් නිරුද්ධ වී නම් ඒ සිත නිරුද්ධ වේ ද යත්: නැති.

56. යම් සිතෙක් නිරුද්ධ නො වේ නම් ඒ සිත නිරුද්ධ නො වී ද යත්: අතීත වූ සිත නිරුද්ධ නො වෙයි, ඒ සිත නො ද නිරුද්ධ නො වී යැ, උත්පාදක්‍ෂණයෙහි අනාගත වූ සිත ද නො ද නිරුද්ධ වෙයි. නො ද නිරුද්ධ වී යැ.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වී නම් ඒ සිත නිරුද්ධ නො වේ ද යත්: භඞ්ගක්‍ෂණයෙහි සිත නිරුද්ධ නො වී යැ, ඒ සිත නො ද නිරුද්ධ නො වෙයි, උත්පාදක්‍ෂණයෙහි අනාගත වූ සිත ද නො ද නිරුද්ධ වී යැ. නො ද නිරුද්ධ වේ.

57. යම් සිතෙක් නිරුද්ධ වේ නම් ඒ සිත නිරුද්ධ වන්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් ඒ සිත නිරුද්ධ වේ ද යත්: නැති.

58. යම් සිතෙක් නිරුද්ධ නො වේ නම් ඒ සිත නිරුද්ධ නො වන්නේ ද යත්: උත්පාදක්‍ෂණයෙහි අනාගත වූ සිත ද නිරුද්ධ නො වේ, ඒ සිත නො ද නිරුද්ධ නො වන්නේ ය, අතීත වූ සිත නො ද නිරුද්ධ වෙයි. නො ද නිරුද්ධ වන්නේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් ඒ සිත නිරුද්ධ නො වේ ද යත්: භඞ්ගක්‍ෂණයෙහි සිත නිරුද්ධ නො වන්නේ ය. ඒ සිත නො ද නිරුද්ධ නො වේ, අතීත වූ සිත නො ද නිරුද්ධ වන්නේ යැ. නිරුද්ධ ද නො වේ.

59. යම් සිතෙක් නිරුද්ධ වී නම් ඒ සිත නිරුද්ධ වන්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් ඒ සිත නිරුද්ධ වී ද යත්: නැති.

60. යං චිත්තං න නිරුජ්ඣිත්ථ තං චිත්තං න නිරුජ්ඣිස්සතීති: උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න නිරුජ්ඣිත්ථ, නො ච තං චිත්තං න නිරුජ්ඣිස්සති, භඞ්ගක්ඛණෙ චිත්තං නචෙව නිරුජ්ඣිත්ථ, න ච නිරුජ්ඣිස්සති.

යං වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තං චිත්තං න නිරුජ්ඣිත්ථාති: අතීතං චිත්තං න නිරුජ්ඣිස්සති, නො ච තං චිත්තං න නිරුජ්ඣිත්ථ, භඞ්ගක්ඛණෙ චිත්තං න චෙව නිරුජ්ඣිස්සති, න ච නිරුජ්ඣිත්ථ.

## නිරොධවාරො.

61. යං චිත්තං උප්පජ්ජති තං චිත්තං නිරුජ්ඣිත්ථාති: නො.

යං වා පන චිත්තං නිරුජ්ඣිත්ථ තං චිත්තං උප්පජ්ජතීති: නො.

62. යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං න නිරුජ්ඣිත්ථාති: අතීතං චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං න නිරුජ්ඣිත්ථ, භඞ්ගක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව උප්පජ්ජති, න ච නිරුජ්ඣිත්ථ.

යං වා පන චිත්තං න නිරුජ්ඣිත්ථ තං චිත්තං න උප්පජ්ජතීති: උප්පාදක්ඛණෙ චිත්තං න නිරුජ්ඣිත්ථ, නො ච තං චිත්තං න උප්පජ්ජති. භඞ්ගක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව නිරුජ්ඣිත්ථ, න ච උප්පජ්ජති.

63. යං චිත්තං උප්පජ්ජති තං චිත්තං නිරුජ්ඣිස්සතීති: ආමන්තා.

යං වා පන චිත්තං නිරුජ්ඣිස්සති තං චිත්තං උප්පජ්ජතීති: අනාගතං චිත්තං නිරුජ්ඣිස්සති, නො ච තං චිත්තං උප්පජ්ජති, උප්පාදක්ඛණෙ චිත්තං නිරුජ්ඣිස්සති චෙ ව උප්පජ්ජති ච.

64. යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං න නිරුජ්ඣිස්සතීති: අනාගතං චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං න නිරුජ්ඣිස්සති, භඞ්ගක්ඛණෙ අතීතං ච චිත්තං න චෙව උප්පජ්ජති, න ච නිරුජ්ඣිස්සති.

යං වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තං චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

65. යං චිත්තං උප්පජ්ජිත්ථ තං චිත්තං නිරුජ්ඣිස්සතීති: නො.

යං වා පන චිත්තං නිරුජ්ඣිස්සති තං චිත්තං උප්පජ්ජිත්ථාති: නො.

60. යම් සිතෙක් නිරුද්ධ නො වී නම් ඒ සිත නිරුද්ධ නො වන්නේ ද යත්: උත්පාදක්ෂණයෙහි අනාගත වූ සිත ද නිරුද්ධ නො වී ය, ඒ සිත නො ද නිරුද්ධ නො වන්නේ ය, භඞ්ගක්ෂණයෙහි සිත නො ද නිරුද්ධ වී යැ. නො ද නිරුද්ධ වන්නේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් ඒ සිත නිරුද්ධ නො වී ද යත්: අතීත වූ සිත නිරුද්ධ නො වන්නේ ය, ඒ සිත නො ද නිරුද්ධ නො වී ය, භඞ්ගක්ෂණයෙහි සිත නො ද නිරුද්ධ වන්නේ යැ, නො ද නිරුද්ධ වී යැ.

## නිරොධවාර යි.

61. යම් සිතෙක් උපදී නම් ඒ සිත නිරුද්ධ වී ද යත්: නැති.

තව ද යම් සිතෙක් නිරුද්ධ වී නම් ඒ සිත උපදී ද යත්: නැති.

62. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නිරුද්ධ නො වී ද යත්: අතීත වූ සිත නො උපදී, ඒ සිත නො ද නිරුද්ධ නො වී යැ, භඞ්ගක්ෂණයෙහි අනාගත වූ සිත ද නො උපදී, නො ද නිරුද්ධ වී යැ.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වී නම් ඒ සිත නො උපදී ද යත්: උත්පාදක්ෂණයෙහි සිත නිරුද්ධ නො වී යැ, ඒ සිත නො ද නො උපදී, භඞ්ගක්ෂණයෙහි අනාගත වූ සිත නො ද නිරුද්ධ වී යැ, නො ද උපදී.

63. යම් සිතෙක් උපදී නම් ඒ සිත නිරුද්ධ වන්නේ ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් ඒ සිත උපදී ද යත්: අනාගත වූ සිත නිරුද්ධ වන්නේ යැ, ඒ සිත නො ද උපදී, උත්පාදක්ෂණයෙහි සිත නිරුද්ධ වන්නේ ද වෙයි, ඉපදී ද වේ.

64. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නිරුද්ධ නො වන්නේ ද යත්: අනාගත වූ සිත නො උපදී, ඒ සිත නො ද නිරුද්ධ නො වන්නේ යැ, භඞ්ගක්ෂණයෙහි අතීත වූ ද සිත නො ද උපදී, නො ද නිරුද්ධ වන්නේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් ඒ සිත නො උපදී ද යත්: එසේ යි.

65. යම් සිතෙක් උපන්නේ නම් ඒ සිත නිරුද්ධ වන්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් නිරුද්ධ වන්නේ නම් ඒ සිත උපන්නේ ද යත්: නැති.

66. යං චිත්තං න උප්පජ්ජිත්ථ තං චිත්තං න නිරුජ්ඣිස්සතීති: උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න උප්පජ්ජිත්ථ, නො ච තං චිත්තං න නිරුජ්ඣිස්සති, භඞ්ගක්ඛණෙ චිත්තං න චෙව උප්පජ්ජිත්ථ, න ච නිරුජ්ඣිස්සති.

යං වා පන චිත්තං න නිරුජ්ඣිස්සති තං චිත්තං න උප්පජ්ජිත්ථාති: අතීතං චිත්තං න නිරුජ්ඣිස්සති, නො ච තං චිත්තං න උප්පජ්ජිත්ථ, භඞ්ගක්ඛණෙ චිත්තං න චෙව නිරුජ්ඣිස්සති, න ච උප්පජ්ජිත්ථ.

උප්පාදනිරොධවාරො.

67. යං චිත්තං උප්පජ්ජති තං චිත්තං න නිරුජ්ඣතීති: ආමන්තා.

යං වා පන චිත්තං න නිරුජ්ඣති තං චිත්තං උප්පජ්ජතීති, අතීතානාගතං චිත්තං න නිරුජ්ඣති, නො ච තං චිත්තං උප්පජ්ජති: උප්පාදක්ඛණෙ චිත්තං න නිරුජ්ඣති චෙව උප්පජ්ජති ච.

68. යං චිත්තං න උප්පජ්ජති තං චිත්තං නිරුජ්ඣතීති: අතීතානාගතං චිත්තං න උප්පජ්ජති, නො ච තං චිත්තං නිරුජ්ඣති, භඞ්ගක්ඛණෙ චිත්තං න උප්පජ්ජති චෙව නිරුජ්ඣති ච.

යං වා පන චිත්තං නිරුජ්ඣති තං චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

උප්පජ්ජමාන න නිරොධවාරො.

69. යං චිත්තං උප්පජ්ජමානං තං චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යං වා පන චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජමානන්ති භඞ්ගක්ඛණෙ චිත්තං උප්පන්නං, නො ච තං චිත්තං උප්පජ්ජමානං, උප්පාදක්ඛණෙ චිත්තං උප්පන්නං චෙව උප්පජ්ජමානඤ්ච.

70. යං චිත්තං න උප්පජ්ජමානං තං චිත්තං න උප්පන්නන්ති: භඞ්ගක්ඛණෙ චිත්තං න උප්පජ්ජමානං, නො ච තං චිත්තං න උප්පන්නං, අතීතානාගතං චිත්තං න චෙව උප්පජ්ජමානං න ච උප්පන්නං.

යං වා පන චිත්තං න උප්පන්නං තං චිත්තං න උප්පජ්ජමානන්ති: ආමන්තා.

උප්පජ්ජමානුප්පන්නවාරො.

66. යම් සිතෙක් නො උපන්නේ නම් ඒ සිත නිරුද්ධ නො වන්නේ ද යත්: උත්පාදක්ෂණයෙහි අනාගත වූ ද සිත නො උපන්නේ යැ, ඒ සිත නො ද නිරුද්ධ නො වන්නේ යැ, භඞ්ගක්ෂණයෙහි සිත නො ද උපන්නේ යැ, නො ද නිරුද්ධ වන්නේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වන්නේ නම් ඒ සිත නො උපන්නේ ද යත්: අතීත වූ සිත නිරුද්ධ නො වන්නේ යැ, ඒ සිත නො ද නො උපන්නේ යැ, භඞ්ගක්ෂණයෙහි සිත නො ද නිරුද්ධ වන්නේ යැ, නො ද උපන්නේ යි.

**උත්පාද නිරොධවාර යි.**

67. යම් සිතෙක් උපදී නම් ඒ සිත නිරුද්ධ නො වේ ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් නිරුද්ධ නො වේ නම් ඒ සිත උපදී ද යත්: අතීතානාගත වූ සිත නිරුද්ධ නො වෙයි, ඒ සිත නො ද උපදී, උත්පාදක්ෂණයෙහි සිත නො ද නිරුද්ධ වෙයි උපදීම ද වේ.

68. යම් සිතෙක් නො උපදී නම් ඒ සිත නිරුද්ධ වේ ද යත්: අතීතානාගත වූ සිත නො උපදී, ඒ සිත නො ද නිරුද්ධ වෙයි, භඞ්ගක්ෂණයෙහි සිත නො ද උපදී නිරුද්ධ ද වේ.

තව ද යම් සිතෙක් නිරුද්ධ වේ නම් ඒ සිත නො උපදී ද යත්: එසේ යි.

**උත්පද්‍යමාන න නිරොධවාර යි.**

69. යම් සිතෙක් උපදැමින් පවතී නම් ඒ සිත උපනි ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් උපනි නම් ඒ සිත උපදමින් පවතී ද යත්: භඞ්ගක්ෂණයෙහි සිත උපනි. ඒ සිත නො ද උපදිමින් පවතී, උත්පාදක්ෂණයෙහි සිත උපනි ද වෙ යි, උපදමින් පවත්නේ ද වේ.

70. යම් සිතෙක් උපදිමින් නො පවතී නම් ඒ සිත නො උපනි ද යත්: භඞ්ගක්ෂණයෙහි සිත නො උපදිමින් පවතී, ඒ සිත නො ද නො උපනි, අතීතානාගත වූ සිත නො ද උපදිමින් පවතී, නො ද උපනි.

තව ද යම් සිතෙක් නො උපනි නම් ඒ සිත නො උපදමින් පවතී ද යත්: එසේ යි.

**උත්පද්‍යමානොත්පන්නවාර යි.**

71. යං චිත්තං නිරුජ්ඣමානං තං චිත්තං උප්පන්නන්ති: ආමන්තා.

යං වා පන චිත්තං උප්පන්නං තං චිත්තං නිරුජ්ඣමානන්ති: උප්පාදක්ඛණෙ චිත්තං උප්පන්නං, නො ච තං චිත්තං නිරුජ්ඣමානං, භඞ්ගක්ඛණෙ චිත්තං උප්පන්නඤ්චෙව නිරුජ්ඣමානඤ්ච.

72. යං චිත්තං න නිරුජ්ඣමානං තං චිත්තං න උප්පන්නන්ති: උප්පාදක්ඛණෙ චිත්තං න නිරුජ්ඣමානං, නො ච තං චිත්තං න උප්පන්නං, අතීතානාගතං චිත්තං න චෙව නිරුජ්ඣමානං න ච උප්පන්නං.

යං වා පන චිත්තං න උප්පන්නං තං චිත්තං න නිරුජ්ඣමානන්ති: ආමන්තා.

**නිරුජ්ඣමානුප්පන්නවාරො.**

73. යං චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජිත්ථාති: නො.

යං වා පන චිත්තං උප්පජ්ජිත්ථ තං චිත්තං උප්පන්නන්ති: නො.

74. යං චිත්තං න උප්පන්නං තං චිත්තං න උප්පජ්ජිත්ථාති: අතීතං චිත්තං න උප්පන්නං, නො ච තං චිත්තං න උප්පජ්ජිත්ථ, අනාගතං චිත්තං න චෙව උප්පන්නං, න ච උප්පජ්ජිත්ථ.

යං වා පන චිත්තං න උප්පජ්ජිත්ථ තං චිත්තං න උප්පන්නන්ති: පච්චුප්පන්නං චිත්තං න උප්පජ්ජිත්ථ, නො ච තං චිත්තං න උප්පන්නං අනාගතං චිත්තං න චෙව උප්පජ්ජිත්ථ, න ච උප්පන්නං.

75. යං චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජිස්සතීති: නො.

යං වා පන චිත්තං උප්පජ්ජිස්සති තං චිත්තං උප්පන්නන්ති: නො.

76. යං චිත්තං න උප්පන්නං තං චිත්තං න උප්පජ්ජිස්සතීති: අනාගතං චිත්තං න උප්පන්නං, නො ච තං චිත්තං න උප්පජ්ජිස්සති, අතීතං චිත්තං න චෙව උප්පන්නං, න ච උප්පජ්ජිස්සති.

යං වා පන චිත්තං න උප්පජ්ජිස්සති තං චිත්තං න උප්පන්නන්ති: පච්චුප්පන්නං චිත්තං න උප්පජ්ජිස්සති, නො ච තං චිත්තං න උප්පන්නං අතීතං චිත්තං න චෙව උප්පජ්ජිස්සති, න ච උප්පන්නං.

**උප්පන්නුප්පාදවාරො.**

71. යම් සිතෙක් නිරුද්ධ වෙමින් පවතී නම් ඒ සිත උපනි ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් උපනි නම් ඒ සිත නිරුද්ධ වෙමින් පවතී ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත උපනි, ඒ සිත නො ද නිරුද්ධ වෙමින් පවතී, භඞ්ගක්‍ෂණයෙහි සිත උපනි ද වෙයි, නිරුද්ධ වෙමින් පවත්නේ ද වේ.

72. යම් සිතෙක් නිරුද්ධ වෙමින් නො පවතී නම් ඒ සිත නො උපනි ද යත්: උත්පාදක්‍ෂණයෙහි සිත නිරුද්ධ වෙමින් නො පවතී, ඒ සිත නො ද නො උපනි. අතීතානාගත වූ සිත නො ද නිරුද්ධ වෙමින් පවතී යි. නො උපනි ද වේ.

තව ද යම් සිතෙක් නො උපනි නම් ඒ සිත නිරුද්ධ වෙමින් නො පවතී ද යත්: එසේ යි.

නිරුද්ධ්‍යමානොත්පන්නවාර යි.

73. යම් සිතෙක් උපනි නම් ඒ සිත උපන්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් උපන්නේ නම් ඒ සිත උපනි ද යත්: නැති.

74. යම් සිතෙක් නො උපනි නම් ඒ සිත නො උපන්නේ ද යත්: අතීත වූ සිත නො උපනි, ඒ සිත නො ද උපන්නේ යැ. අනාගත වූ සිත නො උපනි ද වෙයි, නො ද උපන්නේ යි.

තව ද යම් සිතෙක් නො උපන්නේ නම් ඒ සිත නො උපනි ද යත්: ප්‍රත්‍යුත්පන්න වූ සිත නො උපන්නේ යැ, ඒ සිත නො ද නො උපනි, අනාගත වූ සිත නො ද උපන්නේ යැ, නො ද උපනි.

75. යම් සිතෙක් උපනි නම් ඒ සිත උපදින්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් උපදින්නේ නම් ඒ සිත උපනි ද යත්: නැති.

76. යම් සිතෙක් නො උපනි නම් ඒ සිත නො උපන්නේ ද යත්: අනාගත වූ සිත නො උපනි, ඒ සිත නො ද නො උපදින්නේ යැ, අතීත වූ සිත නො ද උපනි, නො ද උපදින්නේ යි.

තව ද යම් සිතෙක් නො උපදින්නේ නම් ඒ සිත නො උපනි ද යත්: ප්‍රත්‍යුත්පන්න වූ සිත නො උපදින්නේ යැ, ඒ සිත නො ද නො උපනි, අතීත වූ සිත නො ද උපන්නේ යැ, නො ද උපනි.

උත්පන්නොත්පාදවාර යි.

77. යං චිත්තං උප්පජ්ජති නො ච තං චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජිස්සතීති: නො.

යං වා පන චිත්තං උප්පජ්ජිස්සති නො ච තං චිත්තං උප්පන්නං තං චිත්තං උප්පජ්ජතීති: නො.

78. යං චිත්තං න උප්පජ්ජති නො ච තං චිත්තං න උප්පන්නං තං චිත්තං න උප්පජ්ජිස්සතීති: ආමන්තා.

යං වා පන චිත්තං න උප්පජ්ජිස්සති නො ච තං චිත්තං න උප්පන්නං තං චිත්තං න උප්පජ්ජතීති: ආමන්තා.

### අතීතානාගතවාරො.

79. උප්පන්නං උප්පජ්ජමානන්ති: භඞ්ගක්ඛණෙ උප්පන්නං නො ච උප්පජ්ජමානං, උප්පාදක්ඛණෙ උප්පන්නං චෙව උප්පජ්ජමානඤ්ච, උප්පජ්ජමානං උප්පන්නන්ති: ආමන්තා.

80. න උප්පන්නං න උප්පජ්ජමානන්ති: ආමන්තා. න උප්පජ්ජමානං න උප්පන්නන්ති: භඞ්ගක්ඛණෙ න උප්පජ්ජමානං, නො ච න උප්පන්නං, අතීතානාගතං චිත්තං න චෙව උප්පජ්ජමානං න ච උප්පන්නං.

### උප්පන්නුප්පජ්ජමානවාරො.

81. නිරුද්ධං නිරුජ්ඣමානන්ති: නො. නිරුජ්ඣමානං නිරුද්ධන්ති: නො.

82. න නිරුද්ධං න නිරුජ්ඣමානන්ති: භඞ්ගක්ඛණෙ න නිරුද්ධං, නො ච න නිරුජ්ඣමානං, උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව නිරුද්ධං න ච නිරුජ්ඣමානං, න නිරුජ්ඣමානං න නිරුද්ධන්ති: අතීතං චිත්තං න නිරුජ්ඣමානං. නො ච න නිරුද්ධං, උප්පාදක්ඛණෙ අනාගතං ච චිත්තං න චෙව නිරුජ්ඣමානං න ච නිරුද්ධං.

### නිරුද්ධනිරුජ්ඣමානවාරො

83. යං චිත්තං උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං, නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තං චිත්තන්ති: භඞ්ගක්ඛණෙ චිත්තං උප්පාදක්ඛණං වීතික්කන්තං භඞ්ගක්ඛණං අතික්කන්තං, අතීතං චිත්තං උප්පාදක්ඛණං ච වීතික්කන්තං භඞ්ගක්ඛණං ච වීතික්කන්තං.

යං වා පන චිත්තං නිරුජ්ඣමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං, උප්පජ්ජමානං ඛණං ඛණං වීතික්කන්තං අතික්කන්තකාලං තං චිත්තන්ති: අතීතං චිත්තං.

77. යම් සිතෙක් උපන්නේ නම් ඒ සිත නො ද උපනි නම් ඒ සිත උපදින්නේ ද යත්: නැති.

තව ද යම් සිතෙක් උපදින්නේ නම් ඒ සිත නො ද උපනි නම් ඒ සිත උපදින්නේ ද යත්: නැති.

78. යම් සිතෙක් නො උපන්නේ නම් ඒ සිත නො ද නො උපනි නම් ඒ සිත නො උපදින්නේ ද යත්: එසේ යි.

තව ද යම් සිතෙක් නො උපදින්නේ නම් ඒ සිත නො ද නො උපනි නම ඒ සිත නො උපන්නේ ද යත්: එසේ යි.

**අතීතානාගතවාර යි.**

79–80. උපන් (සිත) උපදිමින් පවතී ද යත්: භඞ්ගක්‍ෂණයෙහි උපනි, නො ද උපදමින් පවතී, උත්පාදක්‍ෂණයෙහි උපන්නේ ද වෙයි, උපදිමින් පවත්නේ ද වෙයි, උපදිමින් පවත්නා සිත උපනි ද යත්: එසේ යි. නො උපන් (සිත) උපදිමින් නො පවතී ද යත්: එසේ යි.

උපදිමින් නො පවත්නා සිත නො උපනි ද යත්: භඞ්ගක්‍ෂණයෙහි උපදිමින් නො පවතී, නො ද නො උපනි, අතීතානාගත වූ සිත උපදිමින් නො ද පවතීයි. නො උපනි ද වේ.

**උත්පන්නොත්පද්‍යමානවාර යි.**

81. නිරුද්ධ වූ සිත නිරුද්ධ වෙමින් පවතී ද යත්: නැති.

නිරුද්ධ වෙමින් පවත්නා සිත නිරුද්ධ ද යත්: නැති.

82. නිරුද්ධ නො වූ සිත නිරුද්ධ වෙමින් නො පවතී ද යත්: භඞ්ගක්‍ෂණයෙහි නො නිරුද්ධ යැ, නො ද නිරුද්ධ වෙමින් නො පවතී, උත්පාදක්‍ෂණයෙහි අනාගත වූ ද සිත නො ද නිරුද්ධ වෙයි. නිරුද්ධ වෙමින් නො ද පවත්නේ වෙයි, නිරුද්ධ වෙමින් නො පවත්නා සිත නො නිරුද්ධ ද යත්: අතීත වූ සිත නිරුද්ධ වෙමින් නො පවතී. නො ද නො නිරුද්ධ යැ, උත්පාදක්‍ෂණයෙහි අනාගත වූ ද සිත නිරුද්ධ වෙමින් නො ද පවතී යි, නො නිරුද්ධ ද වේ.

**නිරුද්ධ නිරුද්ධ්‍යමානවාර යි.**

3. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති යත්: අරූපයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ වෙති. පඤ්චවොකාරයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙති, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වෙත්.

තවද යමක්හට අව්‍යාකෘතධර්යෝ නිරුද්ධ වෙත් නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. පඤ්චවොකාරයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණ-යෙහි ඔවුනට අව්‍යාකෘතධර්මයෝද නිරුද්ධ වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්: (අනුලොමපුද්ගල යි.)

4. යම් තැනෙකැ කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත් එසේ යි.

තවද යම් තැනෙකැ අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: එසේ යි.

5. යම් තැනෙකැ කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති යත්: එසේ යි.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: අසංඥසත්ව වූ එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති, එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. චතුවොකාර පඤ්චවොකාර වූ එහි අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ වෙති, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

6. යත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්තීති: ආමන්තා.

යත්‍ථ වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: අසඤ්ඤසත්තෙ තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති. චතු-වොකාරෙ පඤ්චවොකාරෙ තත්‍ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති. (අනුලොමඔකාස)

7. යස්ස යත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: නො.

යස්ස වා පන යත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: නො.

8. යස්ස යත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්තීති: අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති. පඤ්චවොකාරෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣන්ති.

යස්ස වා පන යත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චවන්තානං, පවත්තෙ කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති. පඤ්චවොකාරෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

9. යස්ස යත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්තීති: අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති. පඤ්චවොකාරෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣන්ති.

යස්ස වා පන යත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චවන්තානං, පවත්තෙ අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣන්ති. පඤ්ච-වොකාරෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති. (අනුලොම-පුග්ගලොකාස)

6. යම් තැනෙක්හි අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති යත්: එසේ යි.

තවද යම් තැනෙක්හි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: අසංඥසත්ත්වයෙහි එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති, එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. චතුවොකාරයෙහි ද පඤ්චවොකාරයෙහි ද යන එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්. (අනුලොමාවකාශ යි.)

7. යමක්හට යම් තැනෙක්හි කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: නැති.

තවද යමක්හට යම් තැනෙක්හි අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: නැති.

8. යමක්හට යම් තැනෙක්හි කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති යත්: අරූපයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. පඤ්චවොකාරයෙහි කුශලයන් ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ වෙති, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වෙත්.

තවද යමක්හට යම් තැනෙක්හි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. පඤ්චවොකාරයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ වෙති, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

9. යමක්හට යම් තැනෙක්හි අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති යත්: අරූපයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. පඤ්චවොකාරයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙති, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වෙත්.

තවද යමක්හට යම් තැනෙක්හි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. පඤ්චවොකාරයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්. (අනුලොමපුද්ගලාවකාශ යි.)

10. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං කුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්ත අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති.

යස්ස වා පන අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අකුසලා-ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං කුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසලවිප්පයුත්ත කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති.

11. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: සබ්බෙසං චවන්තානං, පවත්තෙ කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං කුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං කුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති, කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති.

12. යස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: සබ්බෙසං චවන්තානං, පවත්තෙ අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති.

10. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. සියල්ලන්ට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්ත අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධසමාපන්නයනට ද අසංඥසත්වයනට ද යි ඔවුනට කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. සියල්ලනට චිත්තයාගේ උත්පාදක්‍ෂණයෙහි ද අකුශල විප්‍රයුක්ත කුශල විප්‍රයුක්ත චිත්තයාගේ භඞ්ගක්‍ෂණයෙහි ද නිරොධසමාපන්නයනට ද අසංඥ-සත්වයනට ද යි ඔවුනට අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති. කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

11. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්‍ෂණ-යෙහි ද යි ඔවුනට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූප-යෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: අරූපයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ නො වෙති, කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

12. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට අකුශල ධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති. (පච්චනීකපුග්ගල)

13. යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා.

යත්ථ වා පන අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා.

14. යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: නිරුජ්ඣන්ති.

යත්ථ වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

15. යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: නිරුජ්ඣන්ති.

යත්ථ වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි. (පච්චනීකඔකාස)

16. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති. නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්ත අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසලවිප්පයුත්ත කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: අරූපයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්. (ප්‍රත්‍යනීකපුද්ගල යි.)

13. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: එසේ යි.

තවද යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: එසේ යි.

14. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නිරුද්ධ වෙත්.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නැති.

15. යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නිරුද්ධ වෙත්.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නැති. (ප්‍රත්‍යනීකාවකාශ යි.)

16. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශලවිප්‍රයුක්ත අකුශල විප්‍රයුක්ත චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි සියල්ලනට ද අසංඥසත්ත්වයනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අකුශල විප්‍රයුක්ත කුශලවිප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි සියල්ලනට ද අසංඥසත්ත්වයනට ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

17. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: සබ්බෙසං චවන්තානං, පවත්තෙ කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති, කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති.

18. යස්ස යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: සබ්බෙසං චවන්තානං, පවත්තෙ අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: අරූපෙ අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති. සබ්බෙසං උපපජ්ජන්තානං, පවත්තෙ චිත්තස්ස උප්පාදක්ඛණෙ, අරූපෙ කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති. (පච්චනීකපුග්ගලොකාස)

### පච්චුප්පන්නවාරො.

19. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස කුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

20. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස කුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

17. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලනට ද ප්‍රවෘත්තියෙහි කුශල විප්‍රයුක්ත චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: අරූපයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි කුශල ධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලන්ට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි අකුශල-යන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වෙති, කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

18. යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: ච්‍යුත වන්නා වූ සියල්ලනට ද ප්‍රවෘත්තියෙහි අකුශල විප්‍රයුක්ත චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලනට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ නො වෙත්.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: අරූපයෙහි අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අකුශල ධර්මයෝ නො ද නිරුද්ධ නො වෙත්. උපදනා වූ සියල්ලනට ද ප්‍රවෘත්තියෙහි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අරූපයෙහි කුශල-යන්ගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙත්. (ප්‍රත්‍යනීක පුද්ගලාවකාශ යි.)

### ප්‍රත්‍යුත්පන්නවාර යි.

19. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

20. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

21. යස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා,

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා. (අනුලොමපුග්ගල)

22. යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යත්ථ වා පන අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

23. යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යත්ථ වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: අසඤ්ඤසත්තෙ තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ, නො ච තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ. චතුවොකාරෙ පඤ්චවොකාරෙ තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිත්ථ, කුසලා ච ධම්මා නිරුජ්ඣිත්ථ.

24. යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: අසඤ්ඤසත්තෙ තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ, නො ච තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ. චතුවොකාරෙ පඤ්චවොකාරෙ තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිත්ථ, අකුසලා ච ධම්මා නිරුජ්ඣිත්ථ. (අනුලොමඔකාස)

25. යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: සුද්ධාවාසානං දුතියෙ අකුසලෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථ, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ. ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ අකුසලා ච ධම්මා නිරුජ්ඣිත්ථ, කුසලා ච ධම්මා නිරුජ්ඣිත්ථ.

26. යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිත්ථ. ඉතරෙසං චතුවො-කාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිත්ථ, කුසලා ච ධම්මා නිරුජ්ඣිත්ථ.

21. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි. (අනුලොමපුද්ගල යි.)

22. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

23. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: අසංඥසත්ත්ව වූ එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ. එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වූහ. චතුවොකාරයෙහි ද පඤ්චවොකාරයෙහි ද යි එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශලධමයෝ ද නිරුද්ධ වූහ.

24. යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: අසංඥසත්ත්ව වූ එහි අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වූහ, එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වූහ. චතුවොකාරයෙහි ද පඤ්චවොකාරයෙහි ද යි එහි අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ වූහ. අකුශල ධර්මයෝ ද නිරුද්ධ වූහ. (අනුලොමාවකාශ යි.)

25. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: ශුද්ධාවාසයනට දෙවන අකුසල් සිත පවත්නා කල්හි ඔවුනට එහි අකුශල ධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වූහ. සෙසු චතුවොකාරයනට ද පඤ්චවොකාරයනට ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වූහ.

26. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හිද අසංඥසත්ත්වයනට ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වූහ. සෙසු චතුවොකාරයනට ද පඤ්චවොකාරයනට ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශල ධර්මයෝ ද නිරුද්ධ වූහ.

27. යස්ස යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්තීති: ආමන්තා.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති, ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති. (අනුලොම-පුග්ගලොකාස)

28. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

යස්ස වා පන අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

29. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

30. යස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි. (පච්චනීකපුග්ගල)

31. යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා.

යත්ථ වා පන අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා.

32. යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: නිරුජ්ඣන්ති.

යත්ථ වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

33. යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්තීති: නිරුජ්ඣන්ති.

යත්ථ වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: නත්ථි. (පච්චනීකඔකාස)

27. යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ. යත්: එසේ යි.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හි ද අසංඥසත්ත්වයනට දූ යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වූහ. සෙසු චතුවොකාරයනට ද පඤ්චවොකාරයනට දූ යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, අකුශල ධර්මයෝ ද නිරුද්ධ වූහ. (අනුලොමපුද්ගලාවකාශ යි.)

28. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති.

තවද යමකුට අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති.

29. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති.

30. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති. (ප්‍රත්‍යනීකපුද්ගල යි.)

31. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: එසේ යි.

තවද යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: එසේ යි.

32. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නිරුද්ධ වූහ.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති.

33. යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නිරුද්ධ වූහ.

තවද යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නැති. (ප්‍රත්‍යනීකාවකාශ යි.)

34. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථාති: සුද්ධාවාසානං දුතියෙ අකුසලෙ චිත්තෙ වත්තමානෙ තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ. සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣිත්ථ, අකුසලා ච ධම්මා න නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

35. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථාති: සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ. සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣිත්ථ, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිත්ථාති: ආමන්තා.

36. යස්ස යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථාති: සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ. සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ අකුසලා ච ධම්මා න නිරුජ්ඣිත්ථ, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථාති: ආමන්තා. (පච්චනීක පුග්ගලොකාස)

### අනාගතවාරො.

37. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං තෙසං කුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

34. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: දෙවන අකුසල් සිත පවත්නා කල්හි ශුද්ධාවාස වූ ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වූහ. ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හි ද අසංඥසත්වයනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ නො වූහ, අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වූහ.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: එසේ යි.

35. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයො නිරුද්ධ නො වූහ යත්: ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හි ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ. ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වූහ. ශුද්ධාවාසයෙහි උපදනා වූ ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ නො වූහ, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වූහ.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: එසේ යි.

36 යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හි ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ. ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වූහ, ශුද්ධාවාසයෙහි උපදනා වූ ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වූහ. අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වූහ.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි අකුලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: එසේ යි. (ප්‍රත්‍යනීකපුද්ගලාවකාශ යි.)

**අතීතවාර යි.**

37. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ උත්පාදක්ෂණයෙහි ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට ද යි ඔවුනට කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. ඔවුන්ගෙන් සෙසුවනට කුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ, අකුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

38. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං තෙසං අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති නො ච තෙසං කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං තෙසං අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති.

39. යස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගසමඞ්ගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, තෙසං අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං තෙසං අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති. (අනුලොමපුග්ගල)

40-42. යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: -පෙ- (අනුලොමඔකාස)

43. යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ කුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

44. යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති.

45. යස්ස යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

38. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද රහත්නට ද යි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. ඔවුන්ගෙන් සෙසුවනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වන්නාහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ.

39. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගසමඞ්ගීනට ද රහත්නට ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට ද යි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. ඔවුන්ගෙන් සෙසුවනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වන්නාහ, අකුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ. (අනුලොමපුද්ගල යි.)

40–42. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: ... (අනුලොමවකාශ යි.)

43. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ උත්පාදක්ෂණයෙහි ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. සෙසු චතුවොකාරයනට ද පඤ්චවොකාරයනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ, අකුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

44. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද රහත්නට ද අසංඥසත්ත්වයනට ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. සෙසු චතුවොකාරයනට ද පඤ්චවොකාරයනට ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වන්නාහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ.

45. යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගසමඞ්ගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං චතුවොකාරානං පඤ්චවොකාරානං තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති. (අනුලොම-පුග්ගලොකාස)

46. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං තෙසං අකුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

47. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං තෙසං කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං කුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

48. යස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගසමඞ්ගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං අකුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා. (පච්චනීකපුග්ගල)

49–51. යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: -පෙ- (පච්චනීකඔකාස)

52. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගසමඞ්ගීනට ද රහත්නට ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට ද අසංඥසත්ත්වයනට දැ යි ඔවුනට එහි අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. සෙසු චතුවොකාරයනට ද පඤ්චවොකාරයනට දැ යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වන්නාහ. අකුශල ධර්මයෝ ද නිරුද්ධ වන්නාහ. (අනුලොමපුද්ගලාවකාශ යි.)

46. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ උත්පාදක්ෂණයෙහි ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට දැ යි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වන්නාහ. අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද රහත්නට දැ යි ඔවුනට අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ, කුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ.

47. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද රහත්නට දැ යි ඔවුනට කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ, ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වන්නාහ. පශ්චිමචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට කුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

48. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: අග්‍රමාර්ගසමඞ්ගීනට ද රහත්නට ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට දැ යි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ, ඔවුනට අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වන්නාහ. පශ්චිමචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අකුශල ධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: එසේ යි. (ප්‍රත්‍යනීකපුද්ගල යි.)

49-51. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: ...
(ප්‍රත්‍යනීකාවකාශ යි.)

52. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: එසේ යි.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස උප්පාදක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අකුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

53. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, අරහන්තානං, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

54. යස්ස යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගසමඞ්ගීනං, අරහන්තානං, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. පච්ඡිමචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අකුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා. (පච්චනීකපුග්ගලොකාස)

## අනාගතවාරො.

55. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං කුසලා ධම්මා නිරුජ්ඣන්ති, කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ උත්පාදක්ෂණයෙහි ද යම් සිතකට අනතුරු ව අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වන්නාහ. අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද රහත්නට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ, කුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ.

53. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද රහත්නට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ. ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වන්නාහ, පශ්චිමචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: එසේ යි.

54. යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට එහි අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: අග්‍රමාර්ගසමඞ්ගීනට ද රහත්නට ද යම් සිතකට අනතුරු ව අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඔවුනට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි අකුශල ධර්මයෝ නිරුද්ධ නො වන්නාහ. ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ නො වන්නාහ, පශ්චිමචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ, අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ නො වන්නාහ.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වන්නාහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වන්නාහ යත්: එසේ යි. (ප්‍රත්‍යනීකපුද්ගල යි.)

අනාගතවාර යි.

55. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට කුශල ධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශලවිප්‍රයුක්ත චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධ සමාපන්නයනට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙති. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අකුශලධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

56. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං කුසලා ධම්මා නිරුජ්ඣන්ති. කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

57. යස්ස අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣන්ති. අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති. (අනුලොමපුග්ගලො)

58—60. යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: –පෙ– (අනුලොමඔකාස)

61. යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති. කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

62. යස්ස යත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං, තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං තත්ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති. කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

63. යස්ස යත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

56. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධසමාපන්නයනට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙති. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

57. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධ සමාපන්නයනට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්. (අනුලොමපුද්ගල යි.)

58-60. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: ... (අනුලොමවකාශ යි.)

61. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වූහ, ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අකුශලධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

62. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශලවිප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද අසංඥසත්වයනට ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ. ඔවුනට එහි කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

63. යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ යත්: එසේ යි.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිත්ථ, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා නිරුජ්ඣන්ති. අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිත්ථ, අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති. (අනුලොම-පුග්ගලොකාස)

64. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිත්ථාති: නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

65. යස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථාති: නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි.

66. යස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථාති: නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: නත්ථි. (පච්චනිකපුග්ගල)

67-69. යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථාති: -පෙ- (පච්චනීකඔකාස)

70. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථාති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ. සුද්ධාවාසානං දුතියෙ චිත්තෙ වත්තමානෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා න නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන යත්ථ අකුසලා ධම්මා න නිරුජ්ඣිත්ථ තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා.

71. යස්ස යත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථාති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ. සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්ථ කුසලා ච ධම්මා න නිරුජ්ඣන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිත්ථ.

යස්ස වා පන යත්ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිත්ථ, තස්ස තත්ථ කුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වූහ. ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙති. අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වූහ, අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්. (අනුලොමපුද්ගලාවකාශ යි.)

64. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නිරුද්ධ වූහ.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නැති.

65. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නිරුද්ධ වූහ.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නැති.

66. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: නිරුද්ධ වූහ.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: නැති. (ප්‍රත්‍යනීකපුද්ගල යි.)

67–69. යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: ... (ප්‍රත්‍යනීකාවකාශ යි.)

70. යමක්හට යම් තැනෙක කුලශධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද ඔවුනට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අකුශලධර්මයෝ නො ද නිරුද්ධ නො වූහ. ශුද්ධාවාසයනට දෙවන සිත පවත්නා කල්හි ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි කුශලධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අකුශල ධර්මයෝ ද නිරුද්ධ නො වූහ.

තවද යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: එසේ යි.

71. යමක්හට යම් තැනෙක කුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂයෙහි ද අසංඥසත්වයනට ද යි ඔවුනට එහි කුශල ධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අව්‍යාකෘතධර්මයෝ නො ද නිරුද්ධ වූහ. ශුද්ධාවාසයෙහි උපදනා වූ ඔවුනට එහි කුශල ධර්මයෝ ද නිරුද්ධ නො වෙති, අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ නො වූහ.

තවද යමක්හට යම් තැනෙක අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි කුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: එසේයි.

72. යස්ස යත්‍ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, අසඤ්ඤසත්තානං තෙසං තත්‍ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්‍ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති. සුද්ධාවාසං උපපජ්ජන්තානං තෙසං තත්‍ථ අකුසලා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති, අබ්‍යාකතා ච ධම්මා න නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන යත්‍ථ අබ්‍යාකතා ධම්මා න නිරුජ්ඣිස්සන්ති තස්ස තත්‍ථ අකුසලා ධම්මා න නිරුජ්ඣන්තීති: ආමන්තා. (පච්චනීක-පුග්ගලොකාස)

### පච්චුප්පන්නානාගතවාරො.

73. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං කුසලා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති. ඉතරෙසං කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසල-විප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං කුසලා ධම්මා නිරුජ්ඣන්ති. කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

74. යස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස කුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසල-විප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤසත්තානං තෙසං අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං කුසලා ධම්මා නිරුජ්ඣන්ති. කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

75. යස්ස අකුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

යස්ස වා පන අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස අකුසලා ධම්මා නිරුජ්ඣන්තීති: සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, අකුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, නිරොධසමාපන්නානං, අසඤ්ඤ-සත්තානං තෙසං අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්ති, නො ච තෙසං අකුසලා ධම්මා නිරුජ්ඣන්ති, අකුසලානං භඞ්ගක්ඛණෙ තෙසං අබ්‍යාකතා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣන්ති. (අනුලොමපුග්ගල)

72. යමක්හට යම් තැනෙක අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙත් නම් ඔහට එහි අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහ යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, ඔවුනට එහි අව්‍යාකෘත ධර්මයෝ නො ද නිරුද්ධ නො වූහ. ශුද්ධාවාසයෙහි උපදනා වූ ඔවුනට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති, අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ නො වූහ.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ නො වූහු නම් ඔහට එහි අකුශලධර්මයෝ නිරුද්ධ නො වෙති යත්: එසේ යි. (ප්‍රත්‍යනීකපුද්ගලාවකාශ යි.)

**ප්‍රත්‍යුත්පන්නාතීතවාර යි.**

73. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අකුශල ධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: අග්‍රමාර්ගයාගේ භඞ්ගක්ෂණයෙහි ද යම් සිතකට අනතුරු වැ අග්‍රමාර්ගය පිළිලබන්නාහු නම් ඒ චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද යි ඔවුනට කුශලධර්මයෝ නිරුද්ධ වෙති, ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වන්නාහ. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුන්ගෙන් සෙසුවනට කුශලධර්මයෝ ද නිරුද්ධ වෙති, අකුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ.

තවද යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධ සමාපන්නයට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට අකුශලධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අකුශලධර්මයෝ ද නිරුද්ධ වන්නාහ, කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

74. යමක්හට කුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට කුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද කුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධසමාපන්නයනට ද අසංඥසත්වයනට ද යි ඔවුනට අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වන්නාහ, ඔවුනට කුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. කුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අව්‍යාකෘතධර්මයෝ ද නිරුද්ධ වන්නාහ. කුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්.

75. යමක්හට අකුශලධර්මයෝ නිරුද්ධ වෙත් නම් ඔහට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහ යත්: එසේ යි.

තවද යමක්හට අව්‍යාකෘතධර්මයෝ නිරුද්ධ වන්නාහු නම් ඔහට අකුශලධර්මයෝ නිරුද්ධ වෙති යත්: සියල්ලනට චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි ද අකුශල විප්‍රයුක්තචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි ද නිරොධසමාපන්නයනට ද අසංඥසත්‍වයනට ද යි ඔවුනට අව්‍යාකෘත ධර්මයෝ නිරුද්ධ වන්නාහ. ඔවුනට අකුශලධර්මයෝ නො ද නිරුද්ධ වෙත්. අකුශලයන්ගේ භඞ්ගක්ෂණයෙහි ඔවුනට අව්‍යාකෘත ධර්මයෝ ද නිරුද්ධ වන්නාහ. අකුශලධර්මයෝ ද නිරුද්ධ වෙත්. (අනුලොමපුද්ගල යි.)

76–78. යත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: -පෙ- (අනුලොමඔකාස)

79. යස්ස යත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: අග්ගමග්ගස්ස භඞ්ගක්ඛණෙ, යස්ස චිත්තස්ස අනන්තරා අග්ගමග්ගං පටිලභිස්සන්ති තස්ස චිත්තස්ස භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති, නො ච තෙසං තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති, ඉතරෙසං කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති, අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති.

යස්ස වා පන යත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති තස්ස තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්තීති, සබ්බෙසං චිත්තස්ස උප්පාදක්ඛණෙ, කුසලවිප්පයුත්තචිත්තස්ස භඞ්ගක්ඛණෙ, තෙසං තත්‍ථ අකුසලා ධම්මා නිරුජ්ඣිස්සන්ති නො ච තෙසං තත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති. කුසලානං භඞ්ගක්ඛණෙ තෙසං තත්‍ථ අකුසලා ච ධම්මා නිරුජ්ඣිස්සන්ති, කුසලා ච ධම්මා නිරුජ්ඣන්ති.

80. යස්ස යත්‍ථ කුසලා ධම්මා නිරුජ්ඣන්ති තස්ස තත්‍ථ අබ්‍යාකතා ධම්මා නිරුජ්ඣිස්සන්තීති: ආමන්තා.

